ජාතික රක්ෂණ භාර අරමුදල

# වාර්ෂික වාර්තාව 2020

# පටුන


| | |
|---|---|
| ජාතික රක්ෂණ භාර අරමුදල පිළිබඳව | 2 |
| අපගේ දැක්ම සහ මෙහෙවර | 3 |
| අප කවුරුන් ද | 4 |
| අපගේ ආයතනික වටිනාකම් | 5 |
| මූල්‍යමය විශේෂ අවස්ථා | 6 |
| උපායමාර්ගික අරමුණු | 7 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 8 |
| ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය | 9 |
| කළමනාකරණ කථිකාව සහ විශ්ලේෂණය | 11 |
| පාරිසරික සමාලෝචනය | 12 |
| මූල්‍ය සමාලෝචනය | 13 |
| අංශමය සමාලෝචනය | 15 |
| පාලනය සහ අභ්‍යන්තර පාලනය | 18 |
| ව්‍යාවසාය පාලනය | 19 |
| NITF-2020 අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් | 21 |
| ආයතනික හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම | 22 |
| ව්‍යාවසාය අවදානම් කළමනාකරණය | 24 |
| තිරසාරභාවය වාර්තාකරණය | 26 |
| අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව | 27 |
| මූල්‍ය වාර්තා | 28 |
| විගණකාධිපතිවරයාගේ වාර්තාව | 29 |
| මූල්‍යමය ප්‍රකාශන | 41 |
| අතිරේක තොරතුරු | 73 |
| දස වසරක සාරාංශය | 74 |
| ආයතනික තොරතුරු | 76 |



# ජාතික රක්ෂණ භාර අරමුදල පිළිබඳව

# අපගේ දැක්ම සහ මෙහෙවර

## අපගේ දැක්ම

සියලුම අවශ්‍ය රක්ෂණය කළ හැකි පාර්ශවයන් හට රැකවරණය සහ ආරක්ෂිත ජාලය

## අපගේ මෙහෙවර

- සමාජයේ සියළුම අවශ්‍ය කාණ්ඩ සඳහා දැරීමට පහසු එලදායීත්වයෙන් පිරි, කාර්යක්ෂම සහ ප්‍රගතිශීලී රක්ෂණ යෝජනා ක්‍රම;
- වෙනස්වන අවශ්‍යතාවයන් මගින් හටගන්නා අධි අවදානම් ආවරණය කිරීමට දේශීය ආර්ථිකයට සංචිත කිරීම් සහ අනෙකුත් සැලසුම් හරහා විසඳුම් සලසාදීම; සහ
- දේශීය රක්ෂණ වෙළඳපොල වෙත අතිරේක ධාරිතාවක් සැපයීමට ශ්‍රී ලංකාවේ ප්‍රතිරක්ෂණ වෙළඳපොලක් නිර්මාණය කිරීම

මගින් ශ්‍රීලංකාවෙහි සමාජීය සහ ආර්ථික සංවර්ධනයට දායක වීම.

# අප කවුරුන් ද?

ජාතික රක්ෂණ භාර අරමුදල, 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත (ජා.ර.භා.අ. පනත) මගින් ස්ථාපනය කර ඇත.ආර්ථිකය වෙනුවෙන් එහි දායකත්වය සැපයීම උදෙසා, ප්‍රතිරක්ෂණය, වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී රක්ෂණය, අග්‍රහාර වෛද්‍ය රක්ෂණය, සෞඛ්‍ය රක්ෂණය, ස්වභාවික විපත් රක්ෂණය ඇතුළු වෙනත් ආකාර වල සාමාන්‍ය රක්ෂණ ආවරණයන් සඳහා ප්‍රතිපාදන සැලසීම සිදු කරනු ලබයි.ජාතික රක්ෂණ භාර අරමුදල් පනතට අනුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය විසින් ප්‍රථමයෙන් පාලනය කරන ලද රක්ෂණ අරමුදලක් වන වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී රක්ෂණ අරමුදල, පසුව ජාතික රක්ෂණ භාර අරමුදල වෙත පවරාගන්නා ලද අතර, ජාතික රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අවදානම් වෙනුවෙන් රක්ෂණ ආවරණ නිකුත් කරන සියලුම රක්ෂකයින්, මේ සඳහා ඔවුන් ලබා ගන්නා වාරික ජාතික රක්ෂණ භාර අරමුදලට ප්‍රේෂණය කළ යුතු විය. 2012 දෙසැම්බර් 31 දිනැති, අංක 1791/4 දරන රජයේ ගැසට් නිවේදනයට අනුව, සියළුම ප්‍රාථමික රක්ෂකයන් සෑම සාමාන්‍ය රක්ෂණ කොන්ත්‍රාත්තුවකින් ලැබෙන මුළු ප්‍රතිරක්ෂණ වාරිකයෙන් 30%ක ප්‍රමාණයක් ජාතික රක්ෂණ භාර අරමුදලට මාරු කළ යුතු වේ.

දැනට, ප්‍රාථමික රක්ෂකයින් සඳහා ප්‍රතිරක්ෂණ ආවරණ සපයන එකම ශ්‍රී ලාංකේය ආයතනය ජාතික රක්ෂණ භාර අරමුදල වේ. අංක 12/2005 දරන රාජ්‍ය පරිපාලන අමාත්‍යංශීය චක්‍රලේඛය මගින් අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය ක්‍රියාත්මක කරන ලද අතර එය 2006 ජනවාරි 01 දින සිට ජාතික රක්ෂණ භාර අරමුදලේ විෂය පථය යටතට පත් කර ඇත. එමගින් එහි සාමාජික විවාහක සේවකයින්ගේ, කලත්‍රයා හා දරුවන් (අවිවාහක රැකියාවක් නොකරන අවුරුදු 21ට අඩු අය සඳහා පමණක්) වෙත සහ අවිවාහක සේවකයින්ගේ දෙමාපියන් (දෙමාපියන් අවුරුදු 70ට අඩු නම් පමණි) වෙත ප්‍රතිලාභ හිමි වේ.

අඩු වටිනාකමකින් යුත් වාරිකයන් සඳහා බහුවිධ ප්‍රතිලාභ ලබා දීම ප්‍රධාන තරඟකාරී ප්‍රතිලාභයක් වන අතර, අපගේ සංසරන කාලයට සාපේක්ෂව හිමිකම් ඉල්ලීම් භාර ගැනීම හා ප්‍රතිලාභ ගෙවීමට ගත වන කාලය රටේ ප්‍රමුඛස්ථානයේ පවතින ඒවා අතරින් එකකි. නව තාක්ෂණය යොදා ගැනීම, බිම් මට්ටම වෙත තිරසර සේවා දායකත්වයක් ලබා දෙමින් අපගේ අභ්‍යන්තර සහ බාහිර කාර්යක්ෂමතාවය නංවා ගැනීමට ඉවහල් වී ඇත.



# අපගේ ආයතනික වටිනාකම්

අපගේ ප්‍රධාන ආයතනික වටිනාකම් හය, අප අපගේ ව්‍යාපාර සඳහා ප්‍රවේශ විය යුතු ආකාරය සම්බන්ධයෙන් ශක්තිමත් පදනමක් සහ මාර්ගෝපදේශනයක් නිර්මාණය කරනු ලබයි.



# මූල්‍යමය විශේෂ අවස්ථා - 2020

වගුව : මූල්‍යමය විශේෂ අවස්ථා

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| **දළ ලිඛිත වාරිකය** | 9,818,040,011 | 12,693,194,645 |
| **ශුද්ධ ඉපයූ වාරිකය** | 17,475,027,816 | 16,448,026,766 |
| **බදුවලට පෙර ලාභය (PBT)** | 8,865,926,371 | 3,008,486,066 |
| **බදුවලට පසු ලාභය (PAT)** | 7,526,099,442 | 3,114,086,727 |
| **මුළු වත්කම්** | 27,358,314,000 | 20,706,947,980 |
| **ඒකාබද්ධ අරමුදලට දායකත්වය** | 782,000,000 | 3,267,970,000 |
| **වත්කම් මත ප්‍රතිලාභ (%)** | 27.77% | 15.04% |



# උපායමාර්ගික අරමුණු

1. 2022 වසර වන විට සමතුලිතතා ස්ථානයක් වෙත ළඟා වීම හරහා සියළුම සමාජීය නැඹුරු රක්ෂණ යෝජනා ක්‍රම චිරස්ථායී බවට පත් කිරීම.

2. ජා.ර.භා.අ. හි ලාභදායීත්වය වෙත සැලකිය යුතු මට්ටමෙන් දායක වීම සඳහා වාණිජමය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයක් නිර්මාණය කිරීම.

3. එස්.ආර්.සී.සී සහ ටී අරමුදල ජා.ර.භා.අ. යටතෙහිම රඳවා ගනු ලබන, අනුබද්ධිත ආයතන දෙකක් (ප්‍රතිරක්ෂණය සඳහා එක් ආයතනයක් සහ සාමාන්‍ය රක්ෂණය සඳහා එක් ආයතනයක්) පිහිටුවීම මඟින් නව ආයතනික ව්‍යුහයක් නිර්මාණය කිරීම.

4. 2023 වසර වන විට ප්‍රතිරක්ෂණය සම්බන්ධයෙන් දකුණු ආසියා කලාපයේ කලාපීය ක්‍රියාකරුවෙක් බවට පත් වීම.

# සභාපතිතුමාගේ පණිවුඩය



"මන්දගාමීභාවයක් අත්විඳිමින් පවතින රක්ෂණ වෙළඳපොලක් තුල ක්‍රියාත්මක වීම කෙබඳු වුවද, ජා.ර.භා.අ., 2019 වර්ෂයේ වාර්තා කරන ලද රු. බිලියන 12.7ට සාපෙක්ෂව 2020 වර්ෂයේ දී රු. බිලියන 9.8 ලෙස දළ ලිඛිත වාරිකයේ සුළු පහළ බැසීමක් වාර්තා කරන ලදී. මෙම අත්කර ගැනීම වඩාත් ආකර්ෂණීය බවට පත් කරමින් ජා.ර.භා.අ. 2019 වර්ෂයේ වාර්තා කළ රු. බිලියන 3.1ට සාපේක්ෂව 2020 මූල්‍ය වර්ෂය සඳහා රු. බිලියන 7.5ක බදුවලට පසු ලාභයක් ද වාර්තා කරන ලදී."

### 2020 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ වාර්ෂික වාර්තාව ජාතික රක්ෂණ භාර අරමුදල වෙනුවෙන් මා හට ඉදිරිපත් කිරීමට ලැබීම මහත් සතුටකි. COVID -19 වසංගත තත්ත්වය, දේශීය වශයෙන් මෙන්ම ගෝලීය වශයෙන් ද සෑම මට්ටමක් තුළම අස්ථායීභාවයන් සහ අවදානම් ඉහළ නංවමින්, සමාජ ආර්ථික දිශානතිය දැඩි ලෙස පරිවර්තනයන්ට ලක් කිරීමට ඉවහල් වූයේවුවද, ජාතික රක්ෂණ භාර අරමුදල වෙනස්වීම්වලට වේගවත් ලෙස සීරුමාරු වීමේ හැකියාව පෙන්නුම් කරන ලද්දේ තාක්ෂණය තුලනය කිරීම හරහා නව සාමාන්‍යකරණය යටතේ ජීවත් වීමට, ඉපැයීමට සහ ඉගෙනීමට අනුවර්තනය වීම මගින්, ආරක්ෂිතව සිටීමට මෙන්ම අපගේ ප්‍රජාවන් ද ආරක්ෂිතව තබා ගැනීමට වගකීම් බෙදා හදා ගැනීම සහ සැලකිය යුතු අන්දමේ වර්ධනයක් සමඟ අපගේ කොටස්කරුවන් හට සැලකිය යුතු මට්ටමේ වටිනාකම් එක් කිරීම මගිනි.

### ජාතික රක්ෂණ අරමුදලේ කාර්ය සාධනය සහ දායකත්වය

මන්දගාමීභාවයක් අත්විඳිමින් පවතින රක්ෂණ වෙළඳපොලක් තුල ක්‍රියාත්මක වීම කෙබඳු වුවද, ජා.ර.භා.අ., 2019 වර්ෂයේ වාර්තා කරන ලද රු. බිලියන 12.7ට සාපෙක්ෂව 2020 වර්ෂයේ දී රු. බිලියන 9.8 ලෙස දළ ලිඛිත වාරිකයේ සුළු පහළ බැසීමක් වාර්තා කරන ලදී. මෙම අත්කර ගැනීම වඩාත් ආකර්ෂණීය බවට පත් කරමින් ජා.ර.භා.අ. 2019 වර්ෂයේ වාර්තා කළ රු. බිලියන 3.1ට සාපේක්ෂව 2020 මූල්‍ය වර්ෂය සඳහා රු. බිලියන 7.5ක බදුවලට පසු ලාභයක් ද වාර්තා කරන ලදී. එය අරමුදල වාර්තා කරන ලද ඉහළම බදුවලට පසු ලාභයයි. 2020 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රශස්තභාවය තහවුරු කරමින්, ජා.ර.භා.අ. විසින් A+(lka) ෆිච් වර්ගීකරණය අත් කර ගැනීමට ද සමත් විය.

### ඇගයීම

මෙම ආයතනය, තම විෂය පථය යටතේ ක්‍රියාත්මක වන අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය (2020) ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාට මාගේ කෘතඥතාවය පළ කිරීමට කැමැත්තෙමි. ජා.ර.භා.අ. හා සමීපව කටයුතු කරනු ලබන මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා සහ අනෙකුත් සියලුම භාණ්ඩාගාර නිලධාරීන් වෙතින් ලද නොමඳ සහයෝගය ද සිහිපත් කිරීමට කැමැත්තෙමි. රක්ෂණ කර්මාන්තයේ නියාමකයින් වන, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසමෙහි (IRCSL) සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ නිලධාරීන් හට ද මාගේ හෘදයාංගම ස්තූතිය පුද කර සිටිමි. අවසාන වශයෙන්, මාගේ හිතවත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, ප්‍රධාන විධායක නිලධාරීතුමා මෙන්ම ජා.ර.භා.අ. කාර්ය මණ්ඩල මහත්ම මහත්මීන් විසින් වර්ෂය පුරාම දක්වන ලද දැඩි කැපවීම සහ මහත් සහයෝගය සම්බන්ධයෙන් මාගේ කෘතඥතාවය පළ කර සිටිමි.

**මවාහිබ් මව්ජුඩ්**
සභාපති
21.05.2021

# ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ සමාලෝචනය



"2020 වසරේදී වාර්තා වූ දළ ප්‍රතිලාභ සහ හිමිකම් පෑම් 19.69% ක අඩු වීමක් ඇති වූයේ 2019 වසරේ වාර්තා වූ රු. බිලියන 9,934ට සාපේක්ෂව 2020 වසරේදී රු. බිලියන 7.978ක් වාර්තා කරමිනි. මේ සඳහා හේතු වූයේ 2020 වසරේදී ප්‍රතිරක්ෂණය සහ අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ හිමිකම් පෑම් සඳහා ගෙවීම් අඩු වීම සහ ස්වභාවික ආපදා සඳහා ගෙවීම් අඩු වීමයි."

2020 වසරේදී COVID-19 වසංගතය පෙර නොවූ විරූ අන්දමින් ලොව පුරා මහත් කැළඹීමක් ඇති කරමින් පැමිණි අතර ඒ හේතුවෙන් සීමා මායිම් වසා දැමීම්, ව්‍යාපාරික ක්ෂේත්‍ර වසා දැමීම්, රැකියා අහිමි වීම් සහ හද කම්පා කරවන ඛේදවාචක ලොව පුරාම අත් විඳින්නට සිදු විය. ජනතාවගේ ජීවනරටා විශාල වශයෙන් වෙනස් වූයේ සමාජ දුරස්ථභාවය සහ නිවසේ සිට සේවය කිරීම සාමාන්‍යය ජීවිතය බවට පත් වූ බැවිනි. ඩිජිටල් පහසුකම් යටතේ ක්‍රියාත්මක විය හැකි සැවොම ඩිජිටල්කරණය තම ජීවනරටාවට මුසුකර ගත් අතර ජාතික රක්ෂණ භාර අරමුදල ද තම පාර්ශ්වකරුවන්ගේ එම අවශ්‍යතා වෙනුවෙන් ක්‍රියාත්මක වීම සඳහා මෙම ජීවන රටාවට අනුවර්තනය විය. පවතින COVID-19 වසංගතය හේතුවෙන් රක්ෂණ කර්මාන්තය සඳහා වන අසතුටුදායක තත්ත්වය කෙබඳු වුවද, ජාතික රක්ෂණ භාර අරමුදලට (NITF) තම ශුද්ධ ඉපැයීම් වාරික වර්ධනය, ලාභ වර්ධනය සහ සේවාලාභී සේවාව සම්බන්ධයෙන් ගත් කළ 2020 වර්ෂයේදී සතුටුදායක කාර්යසාධනයක් පෙන්නුම් කිරීමට හැකි වී ඇති බවමා දැනුම් දෙන්නේ ඉමහත් සතුටකිනි.

2020 මූල්‍ය වර්ෂය, මෙහෙයුම් සහ මූල්‍ය යන දෙඅංශයෙන්ම ගත් කළ, අප රට මහා පරිමාණ වශයෙන් ගංවතුර තත්ත්වයන්ට මුහුණ දුන් 2019 වසරට සාපේක්ෂව සතුටුදායක වසරක් විය. විශේෂයෙන්ම පසුගිය වසරවල ඇති වූ ගංවතුර සඳහා විශාල හිමිකම් ගෙවීම් ප්‍රමාණයක් සිදු කිරීමෙන් පසුව සහ 2020 වසරේදී COVID-19 වසංගතය යටතේ ක්‍රියාත්මක වීමෙන් පසුව වුවද මූල්‍යමය ස්ථායීතාවය පිළිබිඹු කිරීම හේතුවෙන්,භෂඹ්ප හි ප්‍රත්‍යාස්ථිතිය සහතික කරමින් Fitch Rating Lanka වෙතින් A+ ණය අනුපාතයක් ලැබීමට NITF ට හැකි වූ බවද අවධාරණය කිරීම මෙහිලා වැදගත් වේ.

**මූල්‍යමය ප්‍රගතිය**

NITF තම සේවාලාභීන් හට සතුටුදායක සේවාවක් සපයන අතරතුරෙහි, 2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය තුළ තම මූල්‍ය ශක්තිය ඉහළ නැංවීමට තම මූල්‍යමය පැතිකඩ ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට සමත් වී ඇත. දළ ලිඛිත වාරිකය 2019 වසරේදී වාර්තා වූ රු. බිලියන 12.693 ට සාපේක්ෂව 2020 වර්ෂයේදී රු. බිලියන 9.818 ලෙස වාර්තා වූයේ 2019 වසරට සාපේක්ෂව 2020 වසරේදී 22.65%ක කුඩා පහත වැටීමක් පෙන්නුම් කරමිනි. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රතිරක්ෂණයෙහි සහ වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදලෙහි දළ ලිඛිත වාරිකවල දැඩි පහත බැසීමක් සිදු වීමයි. 6.24% ක සුළු වර්ධනයක් පෙන්නුම් කරමින් 2019 වර්ෂයේ වාර්තා වූ රු. බිලියන 16.488 ට සාපේක්ෂව 2020 වර්ෂයේදී රු. බිලියන 17.475 ක ශුද්ධ ඉපැයූ වාරික වාර්තා විය.

අනෙක් අතට, 2020 වසරේදී වාර්තා වූ දළ ප්‍රතිලාභ සහ හිමිකම් පෑම් 19.69% ක අඩු වීමක් ඇති වූයේ 2019 වසරේ වාර්තා වූ රු. බිලියන 9,934ට සාපේක්ෂව 2020 වසරේදී රු. බිලියන 7.978ක් වාර්තා කරමිනි. මේ සඳහා හේතු වූයේ 2020 වසරේදී ප්‍රතිරක්ෂණය සහ අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ හිමිකම් පෑම් සඳහා ගෙවීම් අඩු වීම සහ ස්වභාවික ආපදා සඳහා ගෙවීම් අඩු වීමයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2019 වසරේදී වාර්තා වූ රු. බිලියන 3.631 ක විස්තීරණ ආදායමට සාපේක්ෂව 2020 වසරේදී රු. බිලියන 7.652ක වර්ධනයක් ඇති විය. මෙය පෙර වසරට සාපේක්ෂව 110.74%ක වර්ධනයකි.

2019 සහ 2020 කාලසීමාවන් තුළ මූල්‍ය තත්ත්වය සලකා බැලීමේදී, මුළුකොටස් සහ මුළු වත්කම් පිළිවෙළින් රු. බිලියන 7.192 සිට රු. බිලියන 14.062 දක්වා ද රු. බිලියන 20.707 සිට රු. බිලියන 27.358 දක්වා ද සුළු වශයෙන් වර්ධනය වී ඇත. තවද, මුළු වගකීම් ප්‍රමාණය ද පහත බැස ඇත්තේ 2019 වසරේ රු. බිලියන 13.515 සිට 2020 වසරේදී රු. බිලියන 13.295 ක් ලෙසින් 32.12%ක පහත බැසීමක් වාර්තා කරමිනි.

මූල්‍යමය වත්කම් 2019 වසරේදී වාර්තා වූ රු. බිලියන 15.445ට සාපේක්ෂව 2020 වසරේදී රු. බිලියන 21.666 ක් එනම් 40.28% සැලකිය යුතු අන්දමේ වර්ධනයක් වාර්තා කර ඇත. මෙම වර්ධනය සඳහා ප්‍රධාන

හේතුව වූයේ භාණ්ඩාගාර බිල්පත් වැනි රජයේ සුරැකුම්පත් හි වර්ධනයක් ඇති වීමයි. තවද, දේපළ, යන්ත්‍රෝපකරණවල වටිනාකම ද සුළු වශයෙන් ඉහළ ගොස් ඇත, 2019 වසරේදී පැවති රු. බිලියන 40.497ට සාපේක්ෂව 2020 වසරේදී රු. බිලියන 42.225ක් ලෙස එනම් 4.27% ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

මූල්‍ය ප්‍රගතිය සහ A+ ෆිච් රේටින් ශ්‍රේණිගත කිරීම පිළිබඳව සලකා බැලීමේදී, ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රධාන වශයෙන්ම මුළු විස්තීරණ ආදායම, මුළු වත්කම් සහ A+ ණය අනුපාතය හේතුවෙන් යහපත් මූල්‍ය තත්ත්වයක් නේනුම් කර ඇත.

## මෙහෙයුම් ප්‍රගතිය

2020 වසරේදී, අග්‍රහාර සේවකයන් සඳහා වඩාත් හොඳ සේවා පරිසරයක් නිර්මාණය කිරීමට සහ සේවාලාභීන් හට සුවපහසු ආයතන පරිශ්‍රයක් ඇති කිරීම සඳහා (අංක 95, සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02 හි පිහිටි) ජාතික රක්ෂණ භාර අරමුදලෙහි නව කාර්යාල පරිශ්‍රය කාර්යාලකාමරවලට වෙන් කර නව මුහුණුවරක් ඇති කරන ලදී.

## ඇගයීම

2020 වසරේදී ලද අත්කර ගැනීම් වෙනුවෙන් දරන ලද දැඩි උත්සාහය වෙනුවෙන් අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට සහ NITF හි රක්ෂණ කටයුතු සඳහා තම අඛණ්ඩ කැපවීම සහ පක්ෂපාතීත්වය දැක්වීම වෙනුවෙන් අපගේ සේවකයන් හට මම මාගේ කෘතඥතාවය සහ අගය කිරීම පළ කිරීමට කැමැත්තෙමි.අපගේ ගාමක බලයන් වන මහජනතාව සහ හෂඔප හි සේවාලාභීන් හට ද, ඔවුන් අප කෙරෙහි දක්වන ලද විශ්වසනීයත්වය සහ අවංක සහයෝගය සම්බන්ධයෙන් මාගේ ස්තූතිය පළ කරමි. තවද, සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය, මුදල් අමාත්‍යංශයේ නිලධාරීන් සහ ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසමේ නිලධාරීන් විසින්2020 වර්ෂයේ දී දක්වන ලද සහයෝගය මා අවංකවම අගය කරන අතර අනාගතයේ දී වඩාත් හොඳින් සමාජ ආරක්ෂාව කෙරෙහි දායක වෙමින් මහජනතාවට සේවය කිරීමට අපේක්ෂා කරමු.



**මංජුල හෙට්ටිආරච්චි**
**ප්‍රධාන විධායක නිලධාරී (වැඩබලන)**
18.06.2021



# කළමනාකරණ කථිකාව සහ විශ්ලේෂණය

# පාරිසරික සමාලෝචනය

ශ්‍රී ලාංකීය පරිසරය මෙන්ම ගෝලීය පරිසරය ද ජාතික රක්ෂණ භාර අරමුදලෙහි මෙහෙයුම් සඳහා සැලකිය යුතු අන්දමින් බලපෑම් ඇති කරයි. 2020 වසර ඇත්තෙන්ම පුද්ගලයන් ප්‍රමුඛත්වයෙහි තබා කටයුතු කළ යුතු වර්ෂයක් විය. මන්ද ජාතික රක්ෂණ භාර අරමුදලෙහි සේවකයන්ගේ, සේවාලාභීන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ සෞඛ්‍ය සහ ආරක්ෂාව තහවුරු කරන අතරතුරෙහි රක්ෂණ සේවාවන් සඳහා ප්‍රවේශය සහතික කරමින් ජාතික රක්ෂණ භාර අරමුදලට වසංගතය හමුවේ කටයුතු කිරීමට සිදු වූ බැවිනි. ගෝලීය සහ ශ්‍රී ලාංකේය සමාජ-ආර්ථික සංවර්ධනයන් කඩාවැටීමේ අවදානම්වලට ලක් වූ අතර මේ තත්ත්වයන් බොහොමයක් අවම කර ගන්නා ලද්දේ ශ්‍රී ලංකාවේ ඇති රක්ෂණ සමාගම්වලින් මෙන්ම NITF වෙතින් ලබාගත් රක්ෂණ ආවරණ මගිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, රක්ෂණ සමාගම් තම අවදානම්වලින් 30% ක ප්‍රමාණයක් NITF සමඟ ද ඉතිරිය විදේශ රක්ෂකයින් සමඟ ද ප්‍රතිරක්ෂණය කිරීම මගින් ඔවුන් වෙත තම අවදානම් මාරු කරන ලදී. එහෙයින් NITF උපායමාර්ගික තීරණවලට එළැඹීමේදී රටෙහි ආර්ථික සහ රක්ෂණ කර්මාන්ත සංවර්ධනයන් පිළිබඳව සලකා බැලිය යුතු වේ.

### ශ්‍රී ලාංකේය ආර්ථිකය

ලොව බොහෝ ආර්ථිකයන් මෙන්ම, ශ්‍රී ලාංකේය ආර්ථිකය ද වසංගතය හේතුවෙන් දැඩි බලපෑමකට ලක් විය. ශ්‍රී ලාංකේය ආර්ථිකය 2020 වසරේදී 3.6%ක ප්‍රමාණයක් පහත වැටුණි, එය වාර්තා වූ අයහපත්ම වර්ධනයයි, වසංගත තත්ත්වය හමුවේ සටන් කරන බොහෝ රටවල තත්ත්වය මෙය විය.

මුදල් හුවමාරුකිරීම් සහ කල්දමන ලද බදු ගෙවීම් වැනි පියවර හරහා රජය තීරණාත්මක ලෙස ක්‍රියා කරන ලදි. මහ බැංකුව මගින් ණයපමා සහනයක් හඳුන්වා දීම සහ ණය දීම දිරිමත් කිරීම සඳහා වෙනත් පියවර ගැනීම ද COVID-19 හේතුවෙන් ව්‍යාපාරවලට සහ ජීවනෝපායයන්වලට ඇති වූ දරුණු බලපෑම අවම කිරීමට උපකාරී විය. එසේම, වසංගතය හමුවේ වියදම් අධික වීම සහ ආදායම් අඩු වීම මූල්‍ය තත්ත්වයේ දැඩි පසුබෑමකට හේතු විය. මහජන සහ මහජනයා විසින් සහතික කළ ණය GDP හි 109.7 ක ප්‍රතිශතයක් දක්වා ඉහළ යාමක් ඇස්තමේන්තුගත වේ.

### ශ්‍රී ලාංකීය රක්ෂණ කර්මාන්තය

2020 වසරේ මුල් භාගයේදී ක්ෂේත්‍රය තුළ බොහෝ වර්ධනයන් ඇති විය, එහිදී තරඟකාරීත්වය පිළිබඳව සැලකිල්ලක් දක්වන අතරතුරෙහි පසු COVID-19 කාලසීමාව තුළ කාර්යක්ෂම ලෙස සිටීමට මෙහෙයුම් ආදර්ශයන් නැවත සකස් කිරීමට රක්ෂකයන් හට සිදු විය. COVID-19 වැනි අර්බුදයක් සියළුම ව්‍යාපාරික ක්ෂේත්‍රවලට බලපෑම් කරයි. සෞඛ්‍ය, ජීවිත හෝ ජීවිත-නොවන රක්ෂණ ආවරණ වෙනුවෙන් විවිධ මාර්ග ගණනාවක් ඔස්සේ සාමාන්‍ය විමසීම් සහ හිමිකම් පෑම් ගලා එන තත්ත්වයකට මුහුණ පෑමට සිදු වන තත්ත්වයක් රක්ෂකයන් හට ඇති විය. ඇමතීම් මධ්‍යස්ථානවලට ගලා ආ මෙම ඇමතුම්වලට ප්‍රතිචාර දැක්වීමේ අවශ්‍යතාවය තුලනය කිරීමට දුරස්ථව සේවය කරන සේවකයන් ඉක්මනින් එහා මෙහා කරමින් කටයුතු කිරීමට සිදු වීම 2020 වසර තුළ රක්ෂකයන් මුහුණ දුන් ප්‍රධාන අභියෝගයකි.

ශ්‍රී ලාංකීය රක්ෂණ ක්ෂේත්‍රයේ උච්චස්ථානයක් පෙන්නුම් කරමින්, කොරෝනා වෛරසය හේතුවෙන් බරපතල තත්ත්වයට පත් වූ ආර්ථික ක්‍රියාකාරකම් සහ සේවක මට්ටම් හේතුවෙන් ජීවිත රක්ෂකයන් හට බලපෑම් එල්ල විය. පාරිභෝගිකයන් අඩුවෙන් විය පැහැදම් කිරීම හේතුවෙන් ඔප්පු හිමියන් හට වාරික ගෙවීම් කිරීමට අපහසු වූ අතර සාමාන්‍ය රක්ෂකයන් සඳහා, ගමනාගමන, සංචාරක කර්මාන්තයසහ අනතුරු වැනි අංශවල වාරික ගෙවීම් රැසක් වසංගතය හේතුවෙන් එක් රැස් විය.

2020 වසරේදී, වසංගතය මගින් සෞඛ්‍ය අවදානම් පිළිබඳව සැමට අවබෝධයක් ඇති කරන ලද අතර මෙමගින් ආරක්ෂාව පිළිබඳව සංවේදනයක් සහ ස්වයං රැකියාවල නිරත වන්නන් මෙන්ම අනෙකුත් අයගේ ද ආදායම් අහිමිවීම් පිළිබඳ වැඩි දැනුවත්භාවයක් ඇති කරවන ලදි. දැනුවත්භාවය වැඩි කිරීම සඳහා රක්ෂකයන් විසින් සැලකිය යුතු අන්දමින් සම්පත් ප්‍රමාණයක් වැය කරන අතර ජීවිත රක්ෂණය හරහා අවම කර ගත හැකි අවදානම් පිළිබඳව දැනුවත්භාවය ඉහළ නැංවීමට වසංගතය හේතු විය. 2020 වර්ෂය තුළ, COVID-19 පැතිරීම හේතුවෙන් ඇති වූ ඉහළ ගිය මෙම දැනුවත්භාවය නිසා ජීවිත සහ සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුඉහළ ගියේය.

2020 වසරේදී ඇත්ත වශයෙන්ම, එවන් අවදානම් ප්‍රතිරක්ෂණය කිරීමේ නියමයන් ප්‍රතිරක්ෂකයන් විසින් නිකුත් කිරීම සහ එමගින් රක්ෂකයා නියෝජිතයෙකු ලෙසින් සැලකීම සිදු කරන්නට ඇත. රක්ෂකයන් විසින් අවදානම් ප්‍රතිරක්ෂණය කිරීමට සහ ඔප්පු හිමියන් හට වටිනාකමක් එක් කිරීමට එය මිල කිරීමට තමන්ගේම චින්තනයන් හසු කර ගත යුතු වේ. ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය සැලකිල්ලට ගැනීමේදී, පසු COVID-19 සමයක ඇතිවන නැඹුරුතාවලට ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් විශ්වමය වෛද්‍ය නිපැයුම් නවෝත්පාදනය කිරීම සාමාන්‍ය රක්ෂකයින් විසින් සිදු කළ යුතු වේ.

# මූල්‍ය සමාලෝචනය - 2020

**මූල්‍යමය විශේෂ අවස්ථා පහත පරිදි සංක්ෂිපත් කර දැක්විය හැක.**

| | 2015 රු. මිලියන | 2016 රු. මිලියන | 2017 රු. මිලියන | 2018 රු. මිලියන | 2019 රු. මිලියන | 2020 රු. මිලියන | වර්ධනය (2019-2020) |
|---|---|---|---|---|---|---|---|
| දළ ලිඛිත වාරිකය | 5,063 | 6,814 | 9,071 | 9,684 | 12,693 | 9,818 | -22,65% |
| ශුද්ධ ඉපයූ වාරිකය | 7,931 | 8,851 | 11,614 | 13,653 | 16,448 | 17,475 | 6.24% |
| බදුවලට පෙර ලාභය | 4,391 | 2,840 | 1,077 | 3,289 | 3,008 | 8,866 | 194.70% |
| බදුවලට පසු ලාභය | 4,304 | 2,840 | 976 | 3,183 | 3,114 | 7,526 | 141.68% |
| මුළු වත්කම් | 12,233 | 19,516 | 18,553 | 15,595 | 20,707 | 27,358 | 32.12% |
| ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම් පෑම් | 3,225 | 5,543 | 9,901 | 9,691 | 12,079 | 7,955 | -34.15% |
| ආයෝජන සහ අනෙකුත් ආදායම් | 850 | 984 | 1,143 | 1,343 | 1,265 | 1,385 | 9.51% |
| අනෙකුත් ආදායම් | 856 | 989 | 1,149 | 1,460 | 1,269 | 1,387 | 9,28% |
| මුළු කොටස් | 8,655 | 7,565 | 7,146 | 6,956 | 7,192 | 14,062 | 95.52% |
| වත්කම් මත ප්‍රතිලාභ | 35.18% | 14.55% | 5.26% | 2.41% | 15.04% | 27.51% | 82.91% |

**දළ ලිඛිත වාරිකය (රු. මිලියන)**




**ශුද්ධ ඉපයූ වාරිකය (රු. මිලියන)**




**බදුවලට පෙර ලාභය (රු. මිලියන)**




**බදුවලට පසු ලාභය (රු. මිලියන)**



### අනෙකුත් ආදායම් (රු. මිලියන)




### මුළු වත්කම් (රු. මිලියන)




2020 වසර තුළ, ජාතික රක්ෂණ භාර අරමුදල 2019 වර්ෂයේ දී වාර්තා කරන ලද රු. බිලියන 12.69ක දළ ලිඛිත වාරිකයට සාපේක්ෂව 2020 වසරේ දී රු. බිලියන 9.82ක් වාර්තා කරන ලදී. මෙය 22.65% පහත බැසීමකි. මෙයට ප්‍රධාන හේතු වූයේ වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදලෙන් වන වාරිකවල සහ අභයන්තර ප්‍රතිරක්ෂණයෙන් වන වාරිකාවල සුළු පහත බැසීමකි. NITF 2019 වසරේ වාර්තා කරන ලද රු. බිලියන 18.12 ක ශුද්ධ ලිඛිත වාරිකයට සාපේක්ෂව රු. බිලියන 15.81ක එනම් 12.74%ක සුළු වර්ධනයක් වාර්තා කරන ලදී. ශුද්ධ ඉපයූ වාරිකය 2020 වසරේ දී 6.24%ක සුළු වර්ධනයක් වාර්තා කරන ලද්දේ 2019 වසරේදී පැවැති රු. බිලියන 16.45ක අගය 2020 වසරේදී රු. බිලියන 17.47ක් දක්වා වැඩි වීමෙනි.

බදුවලට පසුලාභය සැලකිය යුතු අන්දමින් 2019 වසරේ පැවැති රු. බිලියන 3.11 සිට 2020 වසරේදී රු. බිලියන 7.53 දක්වා වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම්පෑම් අඩු වීම සහ ප්‍රතිරක්ෂණ සහ අත්කර ගැනීම් වියදම් අඩු වීමයි. 2019 වසරේදී පැවති රු. බිලියන 1.27ක වෙනත් ආදායම්අගය සමාලෝචනයට ලක් වන කාලසීමාව තුළ රු. බිලියන 1.39ක අගයක් ගන්නා ලද්දේ වැඩි වූ ද්‍රවශීලතාවය හේතුවෙන් හටගත් ඉහළ ගිය පොලී ආදායම් හේතුවෙනි.

භෂඔජ හි මුළු වත්කම් සැලකිය යුතු මට්ටමකට වැඩි වූයේ 2019 වසරේදී පැවති රු. බිලියන 20.71 සිට රු. බිලියන 27.36ක අගයකටයි. 32% ක මෙම වැඩිවීම මූල්‍ය වත්කම් සහ ලැබෙන වාරික වල සැලකියුතු ප්‍රමාණයක වර්ධනයකට හේතු වෙයි. මේ අතරතුර, මුළු කොටස් ද 2019 වසරේදී පැවති රු. බිලියන 7.19 ට සාපේක්ෂව 2020 දී රු. බිලියන 14.06ක ලෙස විශාල අගයකින් වැඩි විය. 95% ක මෙම වැඩිවීම සඳහා ප්‍රධාන හේතුවරඳවාගත් ඉපයීම්වල වැඩිවීමයි.

### ආදායම සමාලෝචනය

ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ආදායම පහත පරිදි වෙන්කර නිරූපණය කළ හැක.

**වගුව: රක්ෂණ නිපැයුම් වෙතින් වන NITF ආදායම්**

| | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|
| අභ්‍යන්තර ප්‍රතිරක්ෂණය | 3,683,389,120 | 4,056,395,150 | 4,173,714,909 | 3,235,474,242 |
| SRCC සහ Tr වාරික | 4,036,282,848 | 4,581,640,544 | 6,307,350,365 | 6,088,496,099 |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ | 417,885,956 | 422,117,039 | 390,150,125 | 260,600,235 |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ නොවන | 413,720,543 | 103,722,015 | 301,979,246 | 213,469,435 |
| ජාතික ස්වභාවික ආපදා වාරික | 500,000,000 | 500,000,000 | 1,500,000,000 | 0 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන වෛද්‍ය යෝජනා ක්‍රම | 20,000,000 | 20,000,000 | 20,000,000 | 20,000,000 |
| අග්‍රහාර සඳහා ලද දායක මුදල් | 2,726,522,599 | 4,017,420,904 | 4,838,723,551 | 5,469,298,738 |
| රැස්කර ගත් බෝග රක්ෂණ බදු | 1,878,361,459 | 2,138,167,676 | 1,780,383,987 | 1,626,851,259 |

### රක්ෂණ නිපැයුම් වෙතින් වන NITF ආදායම්



# අංශමය සමාලෝචනය

### අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

'අග්‍රහාර' යනු, 845,00 කට අධික සාමාජිකත්වයක් සහිත, ශ්‍රී ලංකාවේ විශාලතම රක්ෂණ යෝජනා ක්‍රමයයි. මෙම යෝජනා ක්‍රමය, ආසන්න වශයෙන් ශ්‍රී ලාංකිකයන් මිලියන 2.3ක් ආවරණය වන ලෙස,පවුල් වල සාමාජිකයන් දක්වා ද විහිදෙයි. මෙය සියලුම විශ්‍රාම වැටුප් සහිත රජයේ නිලධාරීන්ගේ වැටුපෙන් නාමික මාසික දායකත්ව මුදලක් අඩු කෙරෙන,දායකත්ව යෝජනා ක්‍රමයකි.

2020 මූල්‍ය වර්ෂය තුල අග්‍රහාර රක්ෂණය සඳහාමහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 782 ක් සහ සාමාජික දායක මුදල් රැස් කිරීම තුලින් රු. බිලියන 4.09 ක් ආදි වශයෙන් දායකත්ව මුදල් ලැබිණි. වර්ෂය තුල වෛද්‍ය රක්ෂණ හිමිකම් සඳහා රු. බිලියන 4.173 ක මුළු ගෙවීමක් සිදු කරන ලදී.

### වගුව: ආදායම් වර්ගීකරණය

| | 2020 රු. | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| සාමාජිකයන්ගේ දායක මුදල් | 4,090,359,038 | 3,617,114,527 | 2,959,518,379 |
| මහා භාණ්ඩාගාරයෙන් දායක මුදල් | 782,000,000 | 767,970,000 | 750,000,000 |
| විශ්‍රාමිකයන්ගේ රක්ෂණ යෝජනා ක්‍රමය | 166,837,400 | 142,321,400 | 101,282,200 |
| අර්ධ රාජ්‍ය යෝජනා ක්‍රමය | 430,102,300 | 311,317,625 | 206,620,325 |
| | 5,469,298,738 | 4,838,723,552 | 4,017,420,904 |

### රාජ්‍ය අංශය සඳහා අග්‍රහාර රන් සහ රිදී යෝජනා ක්‍රම

2016 වර්ෂයේ දී,රාජ්‍ය අංශය සඳහා අග්‍රහාර රන් සහ රිදී රක්ෂණ යෝජනා ක්‍රමයන් හඳුන්වා දෙන ලදී. රු. 300 සහ රු. 600 ක වැඩි කළ දායක මුදලක් සඳහා අභිමතය පළ කළ ප්‍රතිලාභීන්,පිළිවෙලින් රන් සහ රිදී රක්ෂණ යෝජනා ක්‍රම යටතේ ප්‍රතිලාභ ලැබීම සඳහා සුදුසුකම් ලැබීය.

අර්ධ රාජ්‍ය අංශය සඳහා අග්‍රහාර රන් සහ රිදී රක්ෂණ යෝජනා ක්‍රමය

2017 වර්ෂයේ දී,අර්ධ රාජ්‍ය අංශය සඳහාඅග්‍රහාර රන් සහ රිදී රක්ෂණ යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී.

### අග්‍රහාර විශ්‍රාම යෝජනා ක්‍රමය

අග්‍රහාර විශ්‍රාම යෝජනා ක්‍රමය2016 මැයි මාසයේ දී හඳුන්වා දෙනු ලැබූ අතරමෙම යෝජනාව සඳහා ඇති වූ දැඩි ඉල්ලුම හේතුවෙන් 2017 වර්ෂයේ දීවිය තවදුරටත් පුළුල් කරන ලදී. 2016 ජනවාරි 1 දිනෙන් පසු විශ්‍රාම යනපූර්ණ රජයේ සේවකයින්ට පමණක් මෙම විශ්‍රාම යෝජනා ක්‍රමය අදාළ වේ.

### අග්‍රහාර ඊ-කාඩ්

2012 ජනවාරි මාසයේ දීඅග්‍රහාර ප්‍රතිලාභීන් සඳහා ලබා දෙන සේවාවන්හි කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහාසියලු සාමාජිකයන්ට ඊ-කාඩ් නිකුත් කිරීම ආරම්භ කරන ලදි. 2017 වර්ෂයේ දීජා.ර.භා.අ. විසින් අග්‍රහාර රන් සහ රිදී සාමාජිකයන් සඳහා රන් සහ රිදී වශයෙන් වෙන් වෙන්ව කාඩ්පත් නිකුත් කිරීම අරඹන ලදී. අග්‍රහාර සාමාජිකයන් සඳහා ප්‍රතිලාභ සැපයීමට පුද්ගලික රෝහල් ගණනාවක් සමඟ ජා.ර.භා.අ. ගිවිසුම්වලට එළඹ ඇත.

### ප්‍රතිරක්ෂණය

ශ්‍රී ලංකාවේ සෑම සාමාන්‍ය රක්ෂණ සමාගමකින්ම,රක්ෂිත ප්‍රතිරක්ෂණ මුදලින් 20%ක වගකීමක් බාර ගැනීම සඳහා,2007 දෙසැම්බර් 19 දිනැති අංක 1528/20 දරන ගැසට් නිවේදනයට අනුව 2008 වර්ෂයේ දීප්‍රතිරක්ෂණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. එය 2012 වසර දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2013 වර්ෂයේ දී, මෙම ප්‍රමාණය 30% දක්වා වැඩි කරන ලද අතරවර්තමානය දක්වා එය ක්‍රියාත්මක වේ.

2020 වර්ෂයේ දීජා.ර.භා.අ. රේඛීය අමාත්‍යංශයේ සමඟ එකඟතාවයෙන් ජා.ර.භා.අ. හි ශේෂ පත්‍රය සුරක්ෂිත කර ගැනීම සඳහා 2020 අගෝස්තු 01 දින දක්වා, ප්‍රතිරක්ෂණ ආවරණය (ප්‍රතිරක්ෂණය) පිට පිට දීර්ඝ කරන ලද අතර, ප්‍රතිරක්ෂණ අවරණ සීමාව බිලියන 7.5 ක් විය. ප්‍රතිරක්ෂණ මඩුල්ලේ ප්‍රමුඛ ප්‍රතිරක්ෂකයා වූයේ රිනයන්ස් රී ආයතනයයි.

රේඛීය අමාත්‍යාංශය සමඟ එකඟත්වයෙන් භෂඹ්‍ර ශේෂපත්‍රය ආරක්ෂා කිරීම සඳහා 2020 වර්ෂයේදී NITF 2020 අගෝස්තු 01 වැනි දින සිට අන්‍යෝන්‍ය ප්‍රතිරක්ෂණ ආවරණයක් (ප්‍රතිරක්ෂණය) ලබා ගන්නා ලද අතර එය 2022 ජනවාරි 31 දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක විය.ප්‍රතිරක්ෂණ ආවරණයෙහි සීමාව රු. බිලියන 10 අතිරික්තව රු. බිලියන 7.5ක් විය. ප්‍රතිරක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන රක්ෂකයා එවරස්ට් ප්‍රතිරක්ෂණ සමාගමයි.

ප්‍රතිරක්ෂණ ආවරණයට අමතරව, ජා.ර.භා.අ. විසින් SRCC & T අරමුදලෙහි බිලියන 10 දක්වා වන ඒවායේ වගකීම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිරක්ෂණ ආවරණය 2020 අගෝස්තු 01 සිට ලබාගත් අතර එය ද 2022 ජනවාරි 31 දක්වා ක්‍රියාත්මක විය.

2020 වසරේදී, ප්‍රතිරක්ෂණ දෙපාර්තමේන්තුවේ දළ ලිඛිත වාරිකය රු. මිලියන 3235ක් සහ හිමිකම් ගෙවීම් මුදල රු. මිලියන 1690කි. 2019 වර්ෂයට සාපේක්ෂව දළ ලිඛිත වාරිකය 22%කින් අඩු වූ අතර හිමිකම් ගෙවීම් 32%කින් අඩු විය.

| ප්‍රතිරක්ෂණය | 2020 රු. | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| දළ ලිඛිත වාරිකය - අභ්‍යන්තර ප්‍රතිරක්ෂණය | 3,235,474,242 | 4,173,714,909 | 4,056,395,150 |
| දළ ප්‍රතිලාභ සහ හිමිකම්පෑම් ගෙවීම් | (1,690,493,892) | (2,476,072,216) | (2,345,202,622) |

# අංශමය සමාලෝචනය

### වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී රක්ෂණ අරමුදල

2008 මාර්තු 25 දිනැති, අංක 1542/11 ගැසට් නිවේදනය අනුව, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සාමාන්‍ය රක්ෂණ සමාගම් මඟින්, SRCC සහ T අවදානම් සඳහා රක්ෂණ ආවරණයන් ලබා ගන්නා, වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී (SRCC & T) අවදානම් සඳහා ආවරණ සැපයීම SRCC & T අරමුදලට පැවරේ.

2020 වර්ෂයේ දී, රේඛීය අමාත්‍යංශයේ සමඟ එකඟතාවයෙන්, ජා.ර.භා.අ. හි ශේෂ පත්‍රය සුරක්ෂිත කර ගැනීම සඳහා SRCC සහ T අරමුදල සඳහා වන රක්ෂණ ආවරණය ජා.ර.භා.අ. විසින් දීර්ඝ කරන ලද අතර, ප්‍රතිරක්ෂණ ආවරණයේ සීමාව 2020 අගෝස්තු 01 සිට 2022 ජනවාරි 31 දක්වා බිලියන 10ක් විය. ප්‍රතිරක්ෂණ මඩුල්ලේ ප්‍රමුඛ ප්‍රතිරක්ෂකයා වූයේ MS/ Chaucer Syndicate 1084 ආයතනයයි.

2020 වර්ෂයේ දී, SRCC දෙපාර්තමේන්තුවේ දළ ලිඛිත වාරිකය රු. මිලි. 6088 ක් සහ දළ ප්‍රතිලාභ සහ හිමිකම් ගෙවීම් මුදල රු. මි. 2.036 කි.

| SRCC සහ T අරමුදල | 2020 රු. | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| දළ ලිඛිත වාරිකය - SRCC සහ T අරමුදල | 6,088,496,099 | 6,307,350,365 | 4,581,640,544 |
| දළ ප්‍රතිලාභ සහ හිමිකම්පෑම් ගෙවීම් | (2,036,000) | (417,783,502) | (50,085,704) |

### සාමාන්‍ය රක්ෂණය

ජාතික රක්ෂණ භාර අරමුදලේ සාමාන්‍ය රක්ෂණ කටයුතු 2009 අගෝස්තු 20 දිනැති අංක 1615/20 දරන විශේෂ ගැසට්පත්‍රයේ ප්‍රතිපාදන අනුව 2009 වසරේදී ආරම්භ විය. ඒ අනුව, භෂඔත මගින් රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවල දේපළ සහ පුද්ගලයන් සඳහා රක්ෂණ ආවරණය සපයනු ලබයි.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් 2011 වසරේදී ඔවුන්ගේ 2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්ත නියාමන කිරීමේ පනත හරහා ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ඒකකයක් ලෙසින් ක්‍රියාත්මක වීමට අනුමැතිය ලබා දී ඇත.

### මෝටර් රථ රක්ෂණ අංශය

ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් 2008 වර්ෂයේ දී රජයේ චක්‍රලේඛ අංක පීඑෆ් 427 සහ ඉන් අනතුරුව නිකුත් වූ පීෆ් 437 අනුව, රාජ්‍ය ආයතන සහ අර්ධ රාජ්‍ය ආයතන සතු මෝටර් රථ සඳහා මෝටර් රථ රක්ෂණය හඳුන්වාදෙන ලදී. මෝටර් රථ රක්ෂණය 2014 වසරේ පටන් පුද්ගලික පුද්ගලික සේවාලාභීන් වෙත පුළුල් කරන ලදී. 2017 වසරේදී භෂඔත මගින් "අග්‍රහාර මෝටර්" නමින් නව මෝටර් රථ රක්ෂණයක් රජයේ සේවකයන්හට හඳුන්වාදෙන ලද අතර දැන් එය මෝටර් රථ රක්ෂණ අංශයේ ප්‍රධානතම රක්ෂණ යෝජනා ක්‍රමයක් බවට පත්ව ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල ශාඛා ජාලය හරහා දිවයින පුරාවට තම ව්‍යාපාරික කටයුතු ව්‍යාප්ත කර ඇත. මෝටර් රථ රක්ෂණයේ දළ ලිඛිත වාරිකය 2015 වසරේ පටන් අඛණ්ඩව වර්ධනය වී ඇත. මෝටර් රථ රක්ෂණයේ දළ ලිඛිත වාරිකය 2020 වසරේ රු. මිලියන 260 ක් විය. පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2019 වසරේදී රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 4/2015 සංශෝධනය කිරීම මගින් පුද්ගලික අංශයේ රක්ෂණ සමාගම් වෙත රජයේ රක්ෂණ කටයුතු විවෘත කිරීම සහ 2020 වසර පුරාවට රටෙහි පැවති කඩඑෂෘ වසංගත තත්ත්වයයි.

| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ | 2020 රු. | 2019 රු. | 2018 රු. |
|---|---|---|---|
| දළ ලිඛිත වාරිකය - මෝටර් රථ | 260,600,235 | 390,150,125 | 422,117,039 |
| ගෙවන ලද දළ ප්‍රතිලාභ සහ හිමිකම්පෑම් | (169,250,954) | (257,432,249) | (208,043,768) |

### මෝටර් රථ නොවන රක්ෂණ අංශය

ජාතික රක්ෂණ භාර අරමුදලෙහි මෝටර් රථ නොවන රක්ෂණ අංශය ප්‍රධාන වශයෙන්ම රක්ෂණ ප්‍රතිපත්ති නිකුත් කරනු ලබන්නේ රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතනවලට සමුද්‍ර, ගිනි, ඉංජිනේරුමය, වෛද්‍ය සහ විවිධ අංශ යටතේය.

මෝටර් රථ නොවන රක්ෂණ අංශය 2018 වසරේදී ශ්‍රී ලංකාවේ ධීවර ප්‍රජාව සඳහා "ධීවර දිරිය" නමින් නව සමුද්‍ර රක්ෂණ ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත. එමගින් ධීවර කටයුතු කරන අතුරතුරේදී ධීවර ජනතාව හට මුහුණ දීමට සිදුවන පුද්ගලික අනතුරුවලට සහ ධීවර බෝට්ටු වල රක්ෂණ ආවරණයක් සපයයි.

2018 වසරේ පටන් දිවයින පුරා ශාඛා ජාලය හරහා නව නිෂ්පාදන සහ ව්‍යාපාරික කටයුතු හඳුන්වා දීමෙන් පසුව සැලකිය යුතු මට්ටමේ දළ ලිඛිත වාරිකයක් මෝටර් රථ නොවන රක්ෂණ අංශය ද වාර්තා කර ඇත.

2020 වසරේදී මෝටර් රථ නොවන රක්ෂණ ව්‍යාපාරයෙන් උපයන ලද දළ ලිඛිත වාරිකය රු. මිලියන 213 ක් වූ අතර 2019 වසරට සාපේක්ෂව ද.ලි.වා. 41%කින් පහත වැටීමකට ලක් වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ කඩඑෂෘ වසංගත තත්ත්වයයි.

# අංශමය සමාලෝචනය

| සාමාන්‍ය රක්ෂණය - මෝටර් රථ නොවන | 2020<br>රු. | 2019<br>රු. | 2018<br>රු. |
|---|---|---|---|
| දළ ලිඛිත  වාරිකය - මෝටර් රථ නොවන | 213,469,435 | 301,979,246 | 103,722,015 |
| ගෙවන ලද දළ ප්‍රතිලාභ සහ හිමිකම්පෑම් | (156,059,649) | (307,223,184) | (469,755,602) |

### කෘෂිකාර්මික ණය ආරක්ෂණ රක්ෂණ යෝජනා ක්‍රමය සහ බෝග රක්ෂණ යෝජනා ක්‍රමය

බොහෝ ගොවීන් කෘෂිකාර්මික ණය ප්‍රතිපාදන අදාළ වන්නා වූ ණය, බැංකු සහ මූල්‍ය ආයතනවලින් ලබා ගනී. නියඟ, ගංවතුර හෝ අලින් විසින් පහර දීම් හේතුවෙන් බෝගවලට හානි වන අවස්ථාවලදී ණය ලබා දෙන ආයතනවලට ඔවුන්ගේ අය කර ගැනීමට ඇති ණය ශේෂයන්ගෙ න් සැලකිය යුතු ප්‍රමාණයක වාරික අයකර ගැනීමට නොහැකි වේ. එහෙයින් මෙම රක්ෂණ යෝජනා ක්‍රමය නිර්මාණය කර ඇත්තේ ඔවුනට ආරක්ෂාවක් සැපයීම සඳහාය.

භෝග රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ, ජා.ර.භා.අ. රක්ෂණ ආවරණය සපයනු ලබන්නේ නියඟ, ගංවතුර සහ අලින් විසින් පහරදීම් හේතුවෙන් බලපෑමට ලක් වන  වී වගාවටයි.

භෝග රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා මූල්‍යාධාර සපයනු ලබන්නේ බැංකු, මූල්‍ය සමාගම් සහ රක්ෂණ සමාගම් ඇතුළු ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතනවල බදුවලට පසු ලාභයෙන් 1% අගයකිනි.



# පාලනය සහ අභ්‍යන්තර පාලනය

# ව්‍යවසාය පාලනය

### හැඳින්වීම

"උපාය මාර්ගික මග පෙන්වීම සැපයීමේ අරමුණ ඇතිව සහ එම අරමුණු ළඟා කර ගන්නා ලද්දේ ද යන්න තහවුරු කර ගනිමින්, අවදානම් සුදුසු පරිදි කළමනාකරණය කරන ලද්දේද යන්න සහතික කර ගනිමින්, ආයතනයේ සම්පත් වගකිව යුතු ආකාරයෙන් භාවිතා කරන්නේද යන්න සහතික කරමින්, මණ්ඩලය සහ විධායක කළමනාකාරීත්වය මගින් ක්‍රියාවට නංවනු ලබන වගකීම් සහ පරිචයන් සමුදාය" ලෙස ව්‍යවසාය පාලනය නිර්වචනය කළ හැක (තොරතුරු පද්ධති විගණන සහ පාලන පදනම, 2001). ව්‍යවසාය පාලනයට ආයතනයේ සමස්ත වගවීමේ රාමුව අන්තර්ගත වේ. ව්‍යවසාය පාලනයේ පැතිකඩ දෙකක් වේ - එනම්, අනුකූලතාවය සහ කාර්යසාධනය, මෙම පැතිකඩ දෙක සමතුලිතව පවත්වාගෙන යා යුතු වේ.

සාමාන්‍යයෙන්, අනුකූලතා පැතිකඩ ඓතිහාසික දැක්මක් ගන්නා අතර කාර්යසාධන දැක්ම අනාගතය දෙස බලන්නකි. මනා ආයතනික පාලනය කථාවේ එක් කොටසක් පමණක් බව පැහැදිලිය - උපාය මාර්ග ද වැදගත් වේ. අනුකූලතාවය "ආයතනික පාලනය" ලෙසින් ද හඳුන්වයි. එමගින් අධ්‍යක්ෂ මණ්ඩල ව්‍යුහය සහ භූමිකාවන් සහ විධායක වැටුප් වැනි ගැටළු ආවරණය වේ. මෑතකාලීනව Enron" HIH" Tyco" Vivendi" Royal Ahold සහ වඩාත් මෑතකාලීනව Parmalat වැනි ඉහළ පැතිකඩකින් යුතු වූ ආයතනවල ඇති වූ ආයතනික කඩාවැටීම් ආයතනික පාලනය ව්‍යාපාර සහ දේශපාලනික න්‍යාය පත්‍රය තුළ ඉහළටම ගෙන ගොස් ඇත. මෙය ජාතික සහ ජාත්‍යන්තර මට්ටමෙන් සමාලෝචන ගණනාවකටම හේතු වී ඇත.

අනුකූලතාවය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ව්‍යුහයන් සහ භූමිකාවන්, සහ විධායක වැටුප් අදාළ වේ. සහතිකකරණය සහ විගණනය සම්බන්ධයෙන් අනුකූලතාවයට යටත්ව නීති සංග්‍රහ සහ/හෝ ප්‍රමිතීන් භාවිතය මෙම ක්ෂේත්‍රය සඳහා පොදුවේ උපකාරී වේ. කාර්යසාධනය ආංශික අධීක්ෂණය, අතරතුර, උපාය මාර්ග සහ වටිනාකම් නිර්මාණය සඳහා මධ්‍යස්ථාන. අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් අවදානම් සම්බන්ධයෙන් ඇති රුචිය සහ කාර්යසාධනයේ ප්‍රධාන නියමුවන් අවබෝධ කර ගන්නා අතරතුරේ උපාය මාර්ගික තීරණ ගත යුතු වේ.

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනත යටතේ, 2006 වර්ෂයේ දී, ජාතික රක්ෂණ භාර අරමුදල පිහිටුවන ලද දින පටන්, එහි ආයතනික පාලන පරිචයන් පවත්වාගෙන යනු ලබන්නේ, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය සහ යහ පාලනය හා ආයතනික පාලන පරිචයන් සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශනයන් මගින් නිකුත් කරන ලද, ප්‍රශස්ථ පරිචයන් පිළිබඳව වන ආයතනික පාලන සංග්‍රහයෙහි අදාල අංශයන් සඳහා නිසි සැලකිල්ල යොමු කිරීම මගිනි.

### ජාතික රක්ෂණ භාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනත අනුව, මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරන ලද පහත සාමාජිකයන් හත් දෙනාගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් ජාතික රක්ෂණ භාර අරමුදල කළමනාකරණය වේ.

(අ) මුදල් විෂය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිලධාරියෙක්:

(ආ) මුදල් විෂය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරීවරයා:

(ඇ) සෞඛ්‍ය විෂය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිලධාරියෙක්:

(ඈ) රාජ්‍ය පරිපාලන විෂය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිලධාරියෙක්: සහ

(ඉ) මූල්‍ය බැංකුකරණ, රක්ෂණ, කළමනාකරණ හෝ නීති ක්ෂේත්‍ර වල සුදුසුකම් දරන හෝ විශේෂඥ දැනුමක් සහිත පුද්ගලයන් අතරින් අමාත්‍යවරයා විසින් නම් කළ යුතු තිදෙනෙක්.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අයෙකු සභාපතිවරයා ලෙස පත් කිරීමට අමාත්‍යවරයාට බලය ලැබේ. පනත ප්‍රකාරව, අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලු සාමාජිකයන්, පත්වීමේ දිනයේ සිට වසර පහක කාලයක් දක්වා තම තනතුරු දරනු ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික පිටුවේ, පැතිකඩ පිටුවේ දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා පැමිණීමේ තොරතුරු පහත පරිදි දක්වා ඇත.

# ව්‍යවසාය පාලනය

| අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ පැමිණීමේ තොරතුරු 2020 | | | | | | | | | | | | | | පත්වූ දිනය | ඉවත් වූ දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජුනි | ජුලි | අගෝ | 03 සැප් | 30 සැප් | ඔක් | නො | 03 දෙස | 30 දෙස | | |
| මවහිබ් මව්ජුද් මහතා | | √ | | | | √ | √ | √ | √ | √ | | | √ | √ | 05/02/2020 | - |
| එච්.ඒ.සී. කුමාරසිංහ මහතා | | √ | | | | √ | √ | √ | √ | √ | | | √ | √ | 14/12/2015 | 31/03/2021 |
| එම්.කේ.පී. කුමාර මහතා | | √ | | | | √ | √ | √ | √ | √ | | | √ | √ | 24/04/2020 | - |
| ඩී.පී.ජී. ප්‍රදීප් මහතා | | √ | | | | √ | √ | √ | √ | √ | | | √ | √ | 10/05/2019 | - |
| කාන්ති ගුණවර්ධන මහත්මිය | | √ | | | | √ | √ | √ | √ | √ | | | | | 11/02/2020 | 16/11/2020 |
| ඩී.එල්.යූ. පීරිස් මහත්මිය | | | | | | | | | | | | | √ | √ | 05/05/2016 | - |

### තොරතුරු සැපයීම

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට සතියකට පෙර බෙදා හරිනු ලබන, මාසික කාර්ය සාධන වාර්තා, පෙර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ වාර්තා, අධ්‍යක්ෂ මණ්ඩල ලිපි ලබා දෙනු ලැබේ.

### මූල්‍ය ප්‍රකාශනයන්

ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශනයන්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ වෙනත් අදාල නීති සහ රෙගුලාසිවලට අනුකූල වෙමින් ඉදිරිපත් කර ඇත. කාර්ය සාධනයේ විස්තරාත්මක සහ විනිවිද විශ්ලේෂණයක් ජාතික රක්ෂණ භාර අරමුදල එහි දක්වයි.

### වාර්ෂික වාර්තාව

දැනුවත්භාවයෙන් යුත් තීරණ ගැනීම සඳහා, 2020 වර්ෂය තුල ජා.ර.භා.අ. හි සමස්ථ දැක්ම විදහා දැක්වෙන ලෙස ආයතනික වාර්ෂික වාර්තාව 2020 නිර්මාණය කර ඇත.

### ප්‍රසම්පාදනය

ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ප්‍රසම්පාදනයන්, භාණ්ඩ මාර්ගෝපදේශනයන් සහ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශනයන් යොදා ගනිමින් සිදු කර ඇත. වටිනාකම පාදක කරගනිමින්, ස්ජක (කැබිනට් මණ්ඩලය පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුව), එජක (අමාත්‍යංශ ප්‍රසම්පාදන කමිටුව) සහ DPC (දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව) වැනි කමිටු යොදා ගනිමින් ප්‍රසම්පාදන සිදු කරනු ලැබේ.

### බාහිර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව බාහිර විගණක වශයෙන් විගණකාධිපතිවරයා පත් කර ඇති අතර රාජ්‍ය සංස්ථා, ඕනෑම ලිඛිත නීතියක් යටතේ රජයට අයිතිය හිමි වූ ව්‍යාපාර හෝ වෙනත් භාරගත් කටයුතුවලට අදාළ ගිණුම් විගණනය කිරීම ද ඔහු විසින් සිදු කෙරේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය වාර්තාවන්හි වාර්ෂික විගණනය විගණකාධිපතිවරයා විසින් සිදු කරන ලදි.

# ජා.ර.භා.අ.හි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් - 2020



**මවහිබ් මච්පිඩ් මහතා**
**(සභාපති)**



**ඩී.පී.ජී. ප්‍රදීප් මහතා**
**(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)**



**ඩී.එල්.යු. පීරිස් මහත්මිය**
**(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)**



**ප්‍රදීප් කුමාර මහතා**
**(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)**



**චන්දන කුමාරසිංහ මහතා**
**(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)**



**කාන්ති ගුණවර්ධන මහත්මිය**
**(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)**

### මවහිබ් මච්පිඩ් මහතා (සභාපති)

මවහිබ් මච්පිඩ් මහතා ජාතික රක්ෂණ භාර අරමුදලේ සභාපති වශයෙන් 2020.02.19 දින වැඩ භාර ගන්නා ලදි. ඔහු MBA (ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය), MFE - කොළඹ විශ්වවිද්‍යාලය, LLM - නැගෙනහිර ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් ලබා ගෙන ඇත. CIMA UK, CMA SL, විද්‍යාවේදී වාණිජ (ගෞරව), ජාත්‍යන්තර සබඳතා පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාව ද ඔහු ලබා ගෙන ඇත.

### ප්‍රදීප් කුමාර මහතා (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

ප්‍රදීප් කුමාර මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු වශයෙන් පත් කරන ලද්දේ 2020 වසරේදී ය. ඔහු එවක් පටන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී වෙයි. ඔහු මුදල් අමාත්‍යාංශයේ වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල් වශයෙන් කටයුතු කර ඇත.

### ඩී.පී.ජී. ප්‍රදීප් මහතා(අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

2019.05.10 දින ඩී.පී.ජී. ප්‍රදීප් මහතා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී. 2020 වර්ෂයේ දී, ඔහු මුදල් අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිවරයා ලෙස සේවය කළේය.

### කාන්ති ගුණවර්ධන මහත්මිය (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකා)

කාන්ති ගුණවර්ධන මහත්මිය2020 වසරේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක වශයෙන් පත් කරන ලද අතර ඇය එවක් පටන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී වන්නීය. වසර තුළ ඇය සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පරිපාලන) වශයෙන් සේවය කර ඇත.

### ඩී.එල්.යු. පීරිස් මහත්මිය (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකා)

ඩී.එල්.යු. පීරිස් මහත්මිය, කාන්ති ගුණවර්ධන මහත්මියගේ අස්වීමෙන් පසුව 2020 නොවැම්බර්හි දී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකාවක වශයෙන් පත් කරන ලද අතර ඇය එවක් පටන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සහභාගී වන්නීය. වසර තුළ ඇය සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පරිපාලන) වශයෙන් සේවය කර ඇත.

### චන්දන කුමාරසිංහ මහතා (අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

චන්දන කුමාරසිංහ මහතා2015.12.14 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරන ලදී. 2020 වර්ෂයේ දී ඔහු රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශයේ අධ්‍යක්ෂ ජෙනරාල් ලෙස සේවය කළේය.

# ආයතනික සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම -2020



**ගීතා විමලවීර මහත්මිය**
ප්‍රධාන විධායක නිළධරි
(වැඩබලන) - 2020



**නිමාලි පතිරණ මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරිනී
- රක්ෂණ



**ලසන්ත යූ. කුමාර මහතා**
මානව සම්පත් සහ පරිපාලන
ප්‍රධානී



**නිමාලි පෙරේරා මහත්මිය**
ශාඛා අධීක්ෂණ ප්‍රධානී



**ධම්මිකා වීරකෝන් මහත්මිය**
මූල්‍ය අංශ ප්‍රධානී



**ආර්.එස්. ගුණසේකර මහතා**
පර්යේෂණ සහ විශ්ලේෂණ
දෙපාර්තමේන්තු ප්‍රධානී



**උපේක්ෂා ඒකනායක මහත්මිය**
ප්‍රරක්ෂණ ප්‍රධානී



**කවීන්ද්‍ර ජයසිංහ මහතා**
තොරතුරු තාක්ෂණ
දෙපාර්තමේන්තු ප්‍රධානී



**අනුර සමරකෝන් මහතා**
හිමිකම්පෑම් ප්‍රධානී



**දේශානි නානායක්කාර මහත්මිය**
ප්‍රතිරක්ෂණ සහ SRCCT&C
ප්‍රධානී



**රන්දිමා මානගේ මහත්මිය**
මෝටර් නොවන හිමිකම්පෑම්
ප්‍රධානි



**නිමේෂා සහබන්දු මහත්මිය**
NNDIS, භෝග රක්ෂණ
දෙපාර්තමේන්තු ප්‍රධානී



**ටී. ජී. ලක්ෂ්මන් මහතා**
මොටර් රථ හිමිකම්පෑම් ප්‍රධානී



**අසංක ජයලත් මහතා**
පරිපාලන ප්‍රධානී



**ගයත්‍රි සොයිසා මහත්මිය**
ආදායම් අංශ ප්‍රධානී



**නාමල් කාංචන මහතා**
වියදම් සහ ගෙවීම් අංශ ප්‍රධානී



**උදාරි ප්‍රියභාෂිණි මහත්මිය**
නීති අංශ ප්‍රධානී



**ගයනි සියඹලාගොඩ මහත්මිය**
සභාපතිවරයාගේ ලේකම්



**එම්.එන්.කේ. පඩිගම මහතා**
මාතර ශාඛාවේ ප්‍රධානී



**සිසිත චන්ද්‍රකුමාර මහතා**
මූල්‍ය වාර්තාකරණ ප්‍රධානී



**රජිත ගයාන් මහතා**
ආයෝජන අංශ ප්‍රධානී



**ඉන්ධිර වික්‍රමආරච්චි මහතා**
අනුරාධපුර ශාඛාවේ ප්‍රධානී

# ව්‍යවසාය අවදානම් කළමනාකරණය

## හැඳින්වීම

ව්‍යවසාය අවදානම් කළමනාකරණය යනු ඕනෑම ආයතනයක උපාය මාර්ගික කළමනාකරණයේ කේන්ද්‍රීය කොටසයි. ව්‍යාපාරයක ව්‍යවසාය අවදානම් කළමනාකරණය (ERM) සඳහා ඇතුළත් වන්නේ අවදානම් කළමනාකරණය කර ගැනීම සඳහා සහ තම අරමුණු වෙත ළඟා වීම සඳහා අදාළ වන්නා වූ අවස්ථා ග්‍රහණය කර ගැනීමට ආයතනයක් විසින් භාවිතා කරනු ලබන ක්‍රමවේද සහ ක්‍රියාවලීන් වේ. ERM මගින් අවදානම් කළමනාකරණය සඳහා රාමුවක් සපයනු ලබන අතර, සාමාන්‍යයෙන් එයට අදාළ වන්නේ ඇතැම් අවස්ථා හඳුනා ගැනීමයි. ERM යනු ආයතන තම ක්‍රියාකාරකම්වලට අදාළ වන්නා වූ අවදානම් සඳහා ක්‍රමානුකූලව පිළිතුරු සෙවීමේ ක්‍රියාවලියයි. සාර්ථක අවදානම් කළමනාකරණ මූලික පියවරක් ආයතනයේ ඇති අවදානම් මට්ටමට සමානුපාතික විය යුතුය, අනෙකුත් සංස්ථාපිත ක්‍රියාකාරකම් සමඟින් අනුකූල විය යුතුය, එහි විෂය පථය තුළ විස්තීරණ විය යුතුය, දෛනික ක්‍රියාකාරකම් තුළට අන්තර්ගතව තිබිය යුතුය එසේම වෙනස්වන අවස්ථා සඳහා ප්‍රතිචාර දක්වන සුළු ලෙස ගතික විය යුතුය. අවදානම් කළමනාකරණය පිළිබඳ අවධානය යොමු කිරීම යනු සැලකිය යුතු අන්දමේ අවදානම් තක්සේරු කර ගැනීම සහ අවදානම් සඳහා සුදුසු ප්‍රතිචාර ක්‍රියාවට නැංවීමයි. අරමුණ වන්නේ ආයතනයේ සියළුම ක්‍රියාකරම් වෙතින් උපරිම චිරස්ථායී වටිනාකමක් ළඟා කර ගැනීමයි. අවදානම් කළමනාකරණය මගින් ආයතනයකට බලපෑම් කළ හැකි සාධකවල විභව පෙනෙන සහ නොපෙනෙන තත්ත්වයන් අවබෝධ කර ගැනීම ඉහළ නංවයි.

එමගින් සාර්ථකත්වයේ සම්භාවිතාවය ඉහළ නංවන අතර අසාර්ථක වීමේ සම්භාවිතාවය සහ ආයතනයේ අරමුණු ළඟා කර ගැනීම හා සම්බන්ධ අස්ථිර තත්ත්වයන්හි මට්ටම යන කරුණු දෙකම පහත හෙළයි. අවදානමක් විශ්ලේෂණය කර ගැනීමේ වැදගත් සාධක වන්නේ අවදානමෙන් වන බලපෑමේ ස්වභාවය, මූලාශ්‍රය හෝ වර්ගය නිර්ණය කර ගැනීමයි. මෙම ආකාරයෙන් අවදානම් ඇගයීම අවදානම් වර්ගීකරණ පද්ධතියක් භාවිතා කිරීම හරහා ඉහළ නැංවිය හැකි වනු ඇත. අවදානම් වර්ගීකරණ පද්ධති වැදගත් වන්නේ එමගින් සමාන වර්ගයේ අවදානම් ඒකරාශී වීම් හඳුනා ගැනීමට ආයතනයකට හැකියාව ලබා දෙන බැවිනි. අවදානම් වර්ගීකරණ පද්ධතියක් මගින් වඩාත් අනතුරෙහි පවතින උපාය මාර්ග, ක්‍රමවිධි සහ මෙහෙයුම් හඳුනා ගැනීමට ද ආයතනයකට හැකියාව ලබා දෙයි. අවදානම් වර්ගීකරණ පද්ධතියක් සාමාන්‍යයෙන් අවදානම් මූල්‍ය පාලන, මෙහෙයුම් ඵලදායීතා, කීර්තිය නිරාවරණය වන සහ වාණිජ ක්‍රියාකාරකම් යන අංශවලට අදාළ වන පරිදි අවදානම් බෙදීම මත පදනම් වේ. කෙසේවෙතත්, සියළුම වර්ගවල ආයතනවලට විශ්වීය වශයෙන් අදාළ වන්නා වූ අවදානම් වර්ගීකරණ පද්ධතියක් නොමැත.

අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තියක් පහත කොටස්වලින් සමන්විත විය යුතු වේ:

- අවදානම් කළමනාකරණ සහ අභ්‍යන්තර පාලන අරමුණු (පාලනය)
- අවදානම් සම්බන්ධයෙන් ආයතනයක ආකල්පය පිළිබඳ ප්‍රකාශය (අවදානම් උපාය මාර්ගය)
- අවදානම් පිළිබඳව දැනුවත් සංස්කෘතිය හෝ පාලන පරිසරය පිළිබඳ විස්තර
- පිළිගත හකි අවදානම්වල මට්ටම සහ ස්වභාවය (අවදානම් රුචිය)
- අවදානම් කළමනාකරණ ආයතනය සහ සූදානම්වීම් (අවදානම් ගෘහ නිර්මාණ ශිල්පය)
- අවදානම් හඳුනාගැනීම සහ ශ්‍රේණිගත කිරීම සඳහා ක්‍රියාපටිපාටි පිළිබඳ විස්තර (අවදානම් ඇගයීම)
- අවදානම් විශ්ලේෂණය සහ වාර්තා කිරීම සඳහා වන ලේඛන ලැයිස්තුව (අවදානම් ප්‍රොටොකෝල)
- අවදානම් ලිහිල් කර ගැනීම සඳහා අවශ්‍යතා සහ පාලනය කිරීමේ යාන්ත්‍රණ (අවදානම් සඳහා ප්‍රතිචාර)
- අවදානම් කළමනාකරණ භූමිකා සහ වගකීම් පවරා දීම
- අවදානම් කළමනාකරණ පුහුණු මාතෘකා සහ ප්‍රමුඛතාවයන්
- අවදානම් නිරීක්ෂණය සහ සන්ධිස්ථාන ගත කිරීම සඳහා සුදුසුකම්
- අවදානම් කළමනාකරණය සඳහා සුදුසු සම්පත් වෙන් කිරීම
- එළඹෙන වර්ෂය සඳහා අවදානම් ක්‍රියාකාරකම් සහ අවදානම් ප්‍රමුඛතාවයන්

අවදානම් කළමනාකරණය ජාතික රක්ෂණ භාර අරමුදලේ උපාය මාර්ගික කළමනාකරණයේ කේන්ද්‍රීය කොටසකි. NITFහි අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය හරහා තම ක්‍රියාකාරකම්වලට අදාළ අවදානම් සඳහා ක්‍රමානුකූලව පිළිතුරු සොයන්නේ එක් එක් ක්‍රියාකාරකම තුළ සහ සියළුම ක්‍රියාකාරකම්වල පැතිකඩ හරහා චිරස්ථායී ප්‍රතිලාභයක් ලඟා කර ගැනීමේ ඉලක්කය සහිතවයි. ව්‍යවසාය අවදානම් කළමනාකරණ උපාය මාර්ග අදාළ කර ගැනීමේදී, බලපෑමේ ප්‍රමාණය/ ප්‍රතිඵලය සහ සිදුවීමේ වියහැකි බව/හැකියාව තක්සේරු කරමින් පහත ප්‍රමුඛතම අවදානම් හඳුනාගෙන ඇත.

### ආර්01 - උපාය මාර්ගික අවදානම

උපාය මාර්ගික අවදානම් යනු සමාගමක ව්‍යාපාරික තීරණ අසාර්ථක වීමට හේතු වන අවදානම් වේ. උපාය මාර්ගික අවදානම් සමාග මක වටිනාකම නිර්ණය කිරීමේ ප්‍රධාන සාධකයකි, විශේෂයෙන්ම මේ හේතුවෙන් සහ අනුකූලතා අවදානම් මත මෙහි බලපෑම හේතුවෙන් සමාගම කෙටි කාලසීමාවක් තුළ දී කැපී පෙනෙන පහත බැසීමක් පෙන්නුම් කරයි නම් නිරීක්ෂණයට ලක් කළ යුත්තකි. උපාය මාර්ගික අරමුණු ළඟා කර ගැනීම තහවුරු කර ගැනීම සඳහා, ජාතික රක්ෂණ භාර අරමුදලෙහි කළමනාකාරීත්වය සාමාන්‍ය පරිසරයේ දේශපාලනික, තාක්ෂණික, සමාජ-සංස්කෘතික, ආර්ථික සංවර්ධනයන් සහ ජාතික රක්ෂණ භාර අරමුදලෙහි උපාය මාර්ගික අභිමතය කෙරෙහි බලපෑම් කළ හැකි ශ්‍රී ලංකාවේ ක්‍රියාකාරී පරිසරය තුළදී රක්ෂණ ක්ෂේත්‍රයට අදාළව තරඟකරුවන්ගේ සහ සේවාලාභීන්ගේ ගතික තත්ත්වයන් පිළිබඳව ඉතා සියුම් ලෙස නිරීක්ෂණය කරමින් ක්‍රියා කර ඇත.

### ආර්02- වෙළඳපොළ අවදානම

වෙළඳපොළ අවදානම යනු විවිධ ව්‍යාපාරික ක්‍රියාකාරකම් පහත හෙළීමේ හෝ අඩුකිරීමේ අවදානමයි. ප්‍රතිරක්ෂණය, භෝග රක්ෂණය, සාමාන්‍ය රක්ෂණය, වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී රක්ෂණය, මෝටර් රථ රක්ෂණය, අග්‍රහාර රක්ෂණය යනාදී උපායමාර්ගික ව්‍යාපාර ඒකක කිහිපයකට විවිධාංගීකරණය කිරීම හරහා සඵලතිඹ වෙළඳපොළ අවදානම ලිහිල් කර ගෙන ඇත.

# ව්‍යවසාය අවදානම් කළමනාකරණය

### ආර්03-ආයතනයේ කීර්තිනාමය පිළිබඳ අවදානම

ආයතනයේ කීර්තිනාමය පිළිබඳ අවදානම් ඇති වන්නේ යම් විශේෂිත සිදුවීමක් හෝ හැසිරීමක් හේතුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදලෙහි සන්නාම සාධාරණත්වයපහත වැටීමෙනි. NITF සඳහා අදළාවන්නා වූ සියළුම නීති සහ රෙගුලාසිවලින් බැඳීම මගින් NITF තම කීර්තිනාමීය අවදානම අවම කර ගනී. හෂඔප වෙළඳ දැන්වීම්කරණය, ප්‍රදර්ශණවලට සහභාගී වීම සහ සේවාවන් හරහා සේවාලාභීන්ට තෘප්තිමත්භාවයක් ලබා දීමයන අළෙවිකරණ ක්‍රියාකාරකම් සිදු කිරීම හරහා එහි ආයතනික කීර්තිනාමය ඉහළ නංවා ගනී. සියළුම සේවකයන් හට නීති සහ රෙගුලාසිවලට අනුකූල ක්‍රියා කිරීමට අවශ්‍යතා ඇති කරමින්, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව මහජනතාව වෙත මූල්‍ය තොරතුරු මුදාහැරීම ද එය සිදු කරයි.

### ආර්04-ද්‍රවශීලතා අවදානම්

ද්‍රවශීලතා අවදානම හෝ හිමිකම්පෑම් ගෙවීම්, ප්‍රතිරක්ෂණ ගෙවීම් සහ මුදල් අමාත්‍යාංශය විසින් ඉල්ලා සිටින අවස්ථාවලදී මහා භාණ්ඩාගාරය වෙත අරමුදල් හුවමාරු කිරීම වැනි කොන්ත්‍රාත්මය වගකීම් ඉටු කිරීමට රජයේ සුරැකුම්පත් සහ විවිධ කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත්, විවිධ කල්පිරීම් සහ ණයකර සහිත භාණ්ඩාගාර බැඳුම්කර වැනි විවිධ කල්පිරීම් සමඟින් ආයෝජන විවිධාංගීකරණය හරහා අවදානම අවම කරගෙන ඇත.

### ආර්05-මෙහෙයුම් අවදානම්

මෙහෙයුම් පරිගණකගත කිරීම සහ අභ්‍යන්තර විගණනය හරහා මෙහෙයුම් අවදානම් අවම කර ගෙන ඇත. වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදලේ සහ අනෙකුත් දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන කටයුතු අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් සිදු කිරීමෙන් වාරික එක්රැස් කර ගැනීමේදී සහ හිමිකම්පෑම් ගෙවීමේදී සිදුවිය හැකි දෝෂ සහ අනනුකූලතා අවම කර ගනී. තවද, දෝෂ සහ අනනුකූලතා අවම කර ගැනීම සඳහා කාර්යාලීය කටයුතු පරිගණකගත කර ඇත.

### ආර්06- ජාත්‍යන්තර අවදානම්

ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ව්‍යාපාරික කටයුතු සඳහා සෘජු බලපෑමක් එල්ල කරන ජාත්‍යන්තර දේශපාලනික සහ සමාජ ආර්ථික ගතික තත්ත්වයන් ජාතික රක්ෂණ භාර අරමුදල මගින් නිරීක්ෂණය කරමින් පවතී. මෙම අවදානම කළමනාකරණය කරගෙන ඇත්තේ විශේෂයෙන්ම හෂඔපහි ප්‍රතිරක්ෂණයට සම්බන්ධ ජාත්‍යන්තර ව්‍යාපාරික නැඹුරුතා නිරීක්ෂණය කිරීමෙනි.

### ආර්07-ස්වභාවික අවදානම්

මෙයට අදාළ වන්නේ භෝග රක්ෂණය, සාමාන්‍ය රක්ෂණය සහ මෝටර් රථ රක්ෂණය යන අංශ සඳහා බලපෑම් කරන්නා වූ වැසි, ගංවතුර, සුළිසුළං මෙන්ම පළිබෝධ උවදුරු සහ කෘමි උවදුරු වැනි ස්වභාවික විපත්ති හේතුවෙන් පැන නගින්නා වූ අවදානම් ය. මෙම අවදානම් කාලගුණ පුරෝකථන දෙස සියුම් ලෙස පරීක්ෂාවෙන් සිට ඒ අනුව වාරික පාලනය කිරීම හරහා අවම කර ගනී, මෙමගින් NITFහි NNDIS, භෝග රක්ෂණය වැනි රක්ෂණ යෝජනාක්‍රම වලට බලපෑම් එල්ල වේ.

### ආර්08-සංකේන්ද්‍රණ අවදානම

සංකේන්ද්‍රණ අවදානම යනු ආයතනය මුදල් ණයට දී ඇති සහ ආයෝජනය කර ඇති විවිධ ණයකරුවන් හෝ මූල්‍යකාරුවන් වෙත ආයතනයේ පවතින මූල්‍ය සංචිත ප්‍රමාණය සමස්ත වශයෙන් බෙදාහැරීමයි. සංකේන්ද්‍රණ අවදානම පළමුව අවදානම් රහිත රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කිරීමෙන් සහ ඉන්පසු රාජ්‍ය බැංකු කිහිපයක් හරහා රාජ්‍ය සුරැකුම්පත් සමඟ පමණක් කටයුතු කිරීමෙන් අවම කර ගනී.

### ආර්09-කීර්තිනාමය පිළිබඳ අවදානම

NITF තම නාමය වටා ගොඩනැගෙන වෙළඳපොළ පිළිගැනීම සම්බන්ධයෙන් සේවාලාභීන්ගේ, පාර්ශ්වකරුවන්ගේ සහ මහජනයාගේ මතය පිළිබඳව ගැඹුරින් සලකා බලයි. එම ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි නියමිත ආකාරයෙන් අනුගමනය වන බව තහවුරු කරලීමට යොදා ගනු ලබන ශක්තිමත් පාලන සහ අනුකූල වීමේ යාන්ත්‍රණ සමඟින්, යහපත් ආයතනික වටිනාකම් සමඟින් ධනාත්මක සේවා සංස්කෘතියක් තැනීමට සහ නැවත බල ගැන්වීමට සියළුම උත්සාහයන් ගනු ලබයි.

### ආර්10-වංචා අවදානම

හෂඔප ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සහ ගිණුම්කරණ පද්ධතියක් ස්ථාපනය කර ඇත. වංචා සහගත ක්‍රියාකාරකම් සිදුවීම වළක්වාගැනීම තහවුරු කර ගැනීමට ආයතනය තුළ සියළුම අභ්‍යන්තර පාලන අඛණ්ඩව සමාලෝචනය කරනු ලබන ඵලදායී අභ්‍යන්තර විගණන ක්‍රියාවලියක් NITF සතු වේ. මනාව ව්‍යුහගත වූ මෙහෙයුම් ක්‍රියාවලීන් සහ ක්‍රියාපටිපාටි සමඟ පැහැදිලි සන්නිවේදන මාධ්‍ය කල්තියා අනතුරු ඇඟවීමේ සංඥා පැහැදිලිව ප්‍රකාශ කිරීම තහවුරු කරයි.

### ආර්11-විදේශ විනිමය අවදානම

විදේශ විනිමය ගනුදෙනු කිරීම් අවදානම නැති කර ගැනීම සඳහා, ප්‍රතිරක්ෂණ වාරික ගෙවීම සඳහා ප්‍රතිරක්ෂණ ගිවිසුම් දේශීය ව්‍යවහාර මුදල් මගින් සිදු කිරීමට කොන්ත්‍රාත්තුගත කර ඇත.

### ආර්12-ප්‍රතිරක්ෂණ අවදානම

2018 වසරේදී, හෂඔප එහි ප්‍රතිරක්ෂණ පැතිකඩ ආවරණය කර ගැනීම සඳහා සාධාරණ මුදලකට විශිෂ්ඨ මූල්‍ය ශ්‍රේණිගත කිරීම් සහ ඉහළ ගෝලීය ශ්‍රේණිගත කිරීම් සහිත ප්‍රතිරක්ෂණකරුවන්ගෙන් ප්‍රතිරක්ෂණ ආවරණ ලබා ගෙන ඇත.

### ආර්13-තොරතුරු තාක්ෂණ අවදානම

තොරතුරු තාක්ෂණ අවදානම NITF හි දත්ත සහ වර්තමාන තොරතුරුවලින් පැන නගී. තොරතුරු තාක්ෂණ අවදානම් අවම කර ගැනීමේ සැලසුමක් ක්‍රියාවට නැංවීම හරහා NITF මෙම අවදානම සම්බන්ධයෙන් ක්‍රියා කරයි. තොරතුරු වල ආරක්ෂාව, අතිරික්තතාවය සහ පැවැත්මයටිතල පහසුකම් සහ දත්ත සමුදාය යන දෙඅංශයෙන්ම සලකා බලයි. NITF තම සේවාලාභීන් සඳහා නිවැරදි සහ වත්මන් තොරතුරු තාක්ෂණ සේවාවක් සැපයීම සඳහා වෛරස් වලින් ආරක්ෂා කිරීමේ සහකුඩා පරිමාණ ආපදා වලින් මුදවා ගැනීමේ සැලසුමක් සමඟින් ක්‍රියාත්මක කරනු ලබන උපස්ථ විසඳුම් ක්‍රියාත්මක කරයි.

### ආර්14-හිමිකම්පෑම් ගෙවීම් අවදානම

වංචා සහගත, නෛතික සහ තාක්ෂණික සාධක හේතුවෙන් පැන නගින විභව්‍ය අවදානම් පාලනය කරනු ලබන්නේ හිමිකම්පෑම් අනුමත කිරීමේදී සීමා කිරීමේ රෙගුලාසි පැනවීම සහ හිමිකම්පෑම් ගෙවීම් ක්‍රියාත්මක කිරීමේදී රාජකාරි වෙන් කර පැවරීම මගිනි.

# තිරසරභාවය වාර්තාකරණය

තිරසරභාවය වාර්තාකරණය හරහා ශුද්ධ වශයෙන් මූල්‍ය අනාවරණය කිරීම්වලින් ඔබ්බට ගොස් කාර්යසාධනය සම්බන්ධයෙන් ආයතනික වාර්තාකරණයක් පිළිබඳ වඩාත්පරිපූර්ණමගක් ගනී. ව්‍යාපාරික තීරණ ගැනීමේ පදනම පුළුල් කරන බැවින් වැඩිදියුණු කරන ලද වාර්තාකරණය අභ්‍යන්තර කළමනාකරණය ඉහළ නැංවීමට ද ඉවහල් වේ. බොහෝ ව්‍යාපාරික අභියෝග සමඟින් මෙන්ම අපහසු ක්‍රියාකාරකම් මාලාවකට මුහුණ පෑමට සිදු වන නමුත් තිරසරභාවය ස්ථිර වශයෙන්ම ආයතනික න්‍යාය පත්‍රයෙහි අඩංගු වේ.

ආයතනයක අරමුණ සමාජයට සේවය කිරීම බව පීටර් ඩ්‍රකර් වැනි ඇතැමුන් විශ්වාස කරයි. නමුත් ව්‍යාපාර සහ සමාජය වෙත තිරසරභාවය මගින් එක් කළ හැකි වටිනාකම පිළිබඳ ඉලක්ක කළ යුතු තත්ත්වයක් ඇත - තිරසරභාවය, ලාභයේ 'ත්‍රිත්ව පහළ මට්ටම', ලෝකය සහ පුද්ගලයන් මතඑහි දායකත්වය වර්තමානයේ ආයතනවල උපාය මාර්ග සහ මෙහෙයුම් මතප්‍රායෝගික සහ ගැඹුරු බලපෑමක් ඇති කරයි. එය ආචාර ධර්මීය වශයෙන් වගවීම පිළිබඳව පමණක් නොවේ; එය සුහුරු ව්‍යාපාරකරණයයි. අපතේ යෑම් සහ අකාර්යක්ෂමතාවයන් තුරන් කිරීම හරහා සරල ආර්ථික සංවේදනයක් ඇති කර පහළ මට්ටමින් නියම බලපෑමක් සිදු කරයි. තිරසරභාවයේ මූලික පියවර හරහා ස්පර්ශ, කෙටි-කාලීන ලැබීම් සමඟ දිගු කාලීන ප්‍රතිලාභ සංයෝජනය කරයි. ඒ හරහා නව ආදායම් මූලාශ්‍ර උත්පාදනය කරන අතර සන්නාම සහ කීර්තිනාමය වැනි අස්පෘශ්‍ය වත්කම් ඉහළ නැංවේ.

ආයතනයකට තිරසරභාවය මුසු කර ගැනීම මගින්, එහි උපාය මාර්ග සහ මෙහෙයුම්වලට අංශ ගණනාවකින් වටිනාකම් එකතු වේ:

- ආදායම් උත්පාදනය - නව නිෂ්පාදන, සේවා සහ වෙළඳපොළ වෙතින්.
- වියදම් පාලනය - සම්පත් කාර්යක්ෂමතාවය, අඩු බලශක්ති පරිභෝජනය සහ අපතේ යාම් අඩු කිරීම.

  තිරසරභාවය ඇති කිරීමට සහ ප්‍රතිලාභ ලැබීමට නම් තිරසරභාවය සහ එයින් ඇති කරන වටිනාකම් ප්‍රමාණනය කර එකිනෙකට සම්බන්ධ කළ යුතු වේ. ආර්ථික සෞභාග්‍යය, පාරිසරික සහ සමාජීය ගුණාත්මකභාවය වන ත්‍රිත්ව පහළ මට්ටමේ නව කාර්යසාධන පැතිකඩ අත්කර ගැනීම හරහා ජාතික රක්ෂණ භාර අරමුදල එහි ව්‍යාපාරික කාර්යසාධනය ඉහළ නැංවීමට වෑයම් කරන අතර "හොඳින් වගවීමේ ආයතනික පුරවැසියෙකු" වීමට දැඩි ලෙස උත්සාහ කරයි, ජාතික රක්ෂණ භාර අරමුදලේ තිරසරභාවය පිළිබඳ උපාය මාර්ග මූලික ව්‍යාපාරික කටයුතුවලදී එක් කර ගනී. එහිදී,

- හෂඔත තිරසරභාවය සම්බන්ධයෙන් උපායමාර්ගික මගක් එක් කරගෙන ඇත.
- ව්‍යාපාරය සහ තිරසරභාවය පිළිබඳ උපාය මාර්ග එකිනෙක මත රඳා පවතී. එහිදී සියළුම ව්‍යාපාරික තීරණ තිරසරභාවය පිළිබඳ සංවර්ධනයන්ගෙන් සහ ආයතනයේ වර්ධනය මත පැන නඟී.
- සියළුම උපායමාර්ගික ව්‍යාපාර තීරණවලදී තිරසරභාවය සම්බන්ධ කරගෙන ඇති බව මෙන්ම NITF හි සියළු මෙහෙයුම්වලට අන්තර්ගත කර ඇති බව තහවුරු කරලීමට NITF දැඩිව උත්සාහ කරයි.

හෂඔත බද්දක් වශයෙන් පිළිවෙළින් 2018, 2019 සහ 2020 යන වර්ෂවලදී ඒකාබද්ධ අරමුදල වෙත රු. මිලියන 2,750ක්, 3,267.97ක් සහ 0.782 කින් දායක වීම හරහා එහි දායකත්වය ඉහළ නංවාගෙන ඇති අතර එමගින් පහත වගුවේ සඳහන් ආකාරයට පෙර පැවති සම්ප්‍රදාය අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත.

| වර්ෂය | මුදල (රු.) |
|---|---|
| 2020 | 782,000,000 |
| 2019 | 3,267,970,000 |
| 2018 | 2,750,000,000 |
| 2017 | 1,500,000,000 |
| 2016 | 3,200,000,000 |
| 2015 | 3,000,000,000 |
| 2014 | 4,000,000,000 |
| 2013 | 3,200,000,000 |

සමාලෝචනයට ලක් වන වසර තුළ, අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ සියළුම රාජ්‍ය සේවකයන් හට ලබාදෙන සෞඛ්‍ය රැකවරණ සේවාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට පිළිගත් රෝහල් සමඟ අවබෝධතා ගිවිසුම් කිහිපයකට NITF එළඹෙන ලදි.

බුන්වත්භාවය සහ ණය අවදානම අවම කරමින් සහ NITF හි සන්නාම කීර්ති නාමය ඉහළ නංවමින් සේවාලාභීන් හට වඩාත් හොඳින් සේවය කිරීමට, NITF A+ ෆිච් ශ්‍රේණිගත කිරීමක් ලඟා කර ගෙන ඇත.

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත සඳහන් සාමාජිකයින් සත් දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් මගින් ජා.ර.භා අරමුදල පාලනය වෙයි.

(අ) මුදල් විෂය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිලධාරියෙකු;

(ආ) මුදල් විෂය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ප්‍රධාන ගණකාධිකාරී;

(ඇ) සෞඛ්‍ය විෂය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිලධාරියෙකු;

(ඈ) රාජ්‍ය පරිපාලන විෂය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිලධාරියෙකු; සහ

(ඉ) මූල්‍ය බැංකු, රක්‍ෂණ කළමණාකරණය හෝ නීතිය පිළිබඳ සුදුසුකම් ලද හෝ ඒ පිළිබඳ විශේෂඥ

දැනුමැති පුද්ගලයන් අතරින් අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තිදෙනෙකු.

මණ්ඩලයේ එක් සාමාජිකයකු සභාපතිවරයා ලෙස පත් කිරීමට අමාත්‍යවරයාට බලය හිමි වේ. පනතට අනුව, පත්වීමේ දින සිට පුරා වසර 05 ක කාලයක් මෙම මණ්ඩලය පැවතිය යුතුය. 2020 වර්ෂය තුලදී අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් 8ක් පවත්වා ඇති අතර රැස්වීම් සඳහා මණ්ඩලයේ සාමාජිකයන්ගේ සහභාගීත්වයද උසස් මට්ටමක පැවතී ඇත. අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහභාගීත්වය පිළිබඳ විස්තර පහත පරිදි වේ:

| අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ පැමිණීමේ තොරතුරු 2020 | | | | | | | | | | | | | | පත්වූ දිනය | ඉවත් වූ දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජුනි | ජූලි | අගෙ | 03 සැප් | 30 සැප් | ඔක් | නො | 03 දෙස | 30 දෙස | | |
| මවහිබ් මවිජුද් මහතා | | √ | | | | √ | √ | √ | √ | √ | | | √ | √ | 05/02/2020 | - |
| එච්.ඒ.සී. කුමාරසිංහ මහතා | | √ | | | | √ | √ | √ | √ | √ | | | √ | √ | 14/12/2015 | 31/03/2021 |
| එම්.කේ.පී. කුමාර මහතා | | √ | | | | √ | √ | √ | √ | √ | | | √ | √ | 24/04/2020 | - |
| ඩී.පී.ජී. ප්‍රදීප් මහතා | | √ | | | | √ | √ | √ | √ | √ | | | √ | √ | 10/05/2019 | - |
| කාන්ති ගුණවර්ධන මහත්මිය | | √ | | | | √ | √ | √ | √ | √ | | | | | 11/02/2020 | 16/11/2020 |
| ඩී.එල්.යු. පීරිස් මහත්මිය | | | | | | | | | | | | | √ | √ | 05/05/2016 | - |

ආයතනය ලගාවී ඇති භෞතික හා මූල්‍ය ඉලක්ක සහ අනුමත කර ඇති ව්‍යාපාරික සැලැස්මට පදනම්ව සුදුසු පරිදි ව්‍යාපාරය පවත්වාගෙන යෑම තහවුරු කිරීම සඳහා ආයතනයේ පාර්ශව කරුවන්හට අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වෙයි.

### ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ව්‍යාපාරික සමාලෝචන

2020වර්ෂයේ දී, ජා.ර.භා.අ.හි ප්‍රධාන කටයුතු වූයේ, රජයේ නිලධාරීන් සඳහා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය (අග්‍රහාර), අනිවාර්ය ප්‍රතිරක්ෂණ ක්‍රමය, පාර්ලිමේන්තු සාමාජිකයන් සඳහා රක්ෂණ ක්‍රමය, මෝටර් රථ වාහන රක්ෂණ යෝජනා ක්‍රමය, සාමාන්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය, කෘෂිකාර්මික ණය ආරක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල ːසෘකක්ඔහ* කළමනාකරණය කිරීමයි.

### මූල්‍ය ප්‍රතිඵලයන්

2020 වර්ෂය තුළ දී ජාතික රක්‍ෂණ භාර අරමුදල රු. මිලියන 9,818 ක දළ ලිඛිත වාරිකයක් වාර්තා කර ඇත. 2020 වර්ෂය තුල, ප්‍රතිරක්ෂණයෙන් සහ වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදලෙන් ලැබුනු වාරිකය අඩු වීම හේතුවෙන්, 2019 වර්ෂයේ වාර්තා කරන ලද රු. මිලියන 12,693 ක ද.ලි.වා.ට සාපේක්ෂව අඩු වීමක් වාර්තා කර ඇත.2020 වර්ෂය තුල, ජා.ර.භා.අ. රු.මිලියන 7,526ක බදු පසු ලාභයක් උපයන ලදී.

### කාර්ය මණ්ඩලය

2020.12.31 වන විට මුළු කාර්ය මණ්ඩලය 365 දෙනෙකු විය.

### විගණකවරුන්

1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන අනුව ජා.ර.භා.මණ්ඩලයේ 2020 සඳහා වන මූල්‍ය ප්‍රකාශනය විගණකාධිපති විසින් විගණනයට ලක් කර ඇත.

### ආයතනික පාලනය

ආයතනික පාලනය හා යහ පාලන භාවිතයන් සඳහා නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති විශිෂ්ට භාවිතයන් සඳහා වූ ආයතනික පාලන සංග්‍රහයේ දක්වා ඇති අදාළ ක්ෂේත්‍ර සඳහා නිසි අවධානය යොමු කරමින් ආයතනික පාලන පරිචයන් ක්‍රියාත්මක කර ඇත.



**මවහිබ් මවුජුඩ්**
**සභාපති**



**එල්. යූ. පින්ටෝ**
**අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්**
**2021 නොවැම්බර් 17**
කොළඹ



# මූල්‍ය වාර්තා

# විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. INS/A/05/NITF/AR/2020 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 17 November 2022

සභාපති
ජාතික රක්ෂණ භාර අරමුදල

ජාතික රක්ෂණ භාර අරමුදල 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ප්‍රතික්ෂේප කිරීම

ජාතික රක්ෂණ භාර අරමුදල 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව, 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ප්‍රතික්ෂේප කිරීම සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.2 මතය ප්‍රතික්ෂේප කිරීම සඳහා පදනම

#### 1.2.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

(අ.) පහත සඳහන් හේතූන් නිසා දුර්වල පාලන පරිසරයක් නිරීක්ෂණය විය.

- ආයතනයේ ප්‍රධාන කළමනාකරණ තනතුරු හතරින් (04) තනතුරු තුනක් (03) පුරප්පාඩු ලෙස පවති. අදාල නිළධාරීන්ගේ ස්ථිර වගකීම්වලට අමතරව ප්‍රධාන විධායක නිලධාරී සහ සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය යන තනතුරු සඳහා වැඩබලන පදනමින් නිළධාරීන් අනුයුක්ත කර තිබුණි. සහකාර සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් තනතුර 2016 නොවැම්බර් 01 වන දින, එනම් සේවක සංඛ්‍යාව අනුමත කළ දින සිට පුරප්පාඩුව පවති. තව දුරටත්, කළමනාකාර තනතුරු හත (07) න් තනතුරු පහක් (05) පුරප්පාඩු වී තිබූ අතර කළමනාකාර තනතුරු තුනක් (03) අදාළ නිළධාරීන් ගේ ස්ථිර වගකීම්වලට අමතරව වැඩබලන පදනම මත පුරවා තිබුණි. එබැවින් අභ්‍යන්තර පාලනයන් වර්ධනය කිරීමේ හැකියාව, අභ්‍යන්තර පාලන පද්ධතිය ඵලදායි ලෙස අධීක්ෂණය කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා වන හැකියාව අවම වේ.

- බඳවා ගැනීමේ පටිපාටියේ දක්වා ඇති වගකිවයුතු අංශ සහ එම කාර්යයන් ඉටු කිරීම සඳහා සුදුසු කුසලතා ඇති නිලධාරීන් නොමැති වීම හේතුවෙන් ජීව ගණක ක්‍රියාවලිය, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, ආයෝජන ක්‍රියාවලිය සහ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය ඵලදායි ලෙස සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය. එබැවින්, අවදානම් කාලෝචිත ලෙස හඳුනා ගැනීම සහ එම අවදානම් අවම කිරීම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම, ජීව ගණක ඇස්තමේන්තු කිරීම සඳහා නිවැරදි තොරතුරු සැපයීම ඵලදායී නොවිය හැක.

- 2020 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සහ විගණන කමිටු ක්‍රියාත්මක වී නොතිබුණි. එබැවින්, අභ්‍යන්තර පාලන පද්ධති නිරන්තරව සමාලෝචනය සහ ඇගයීම, ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සිදු කර නොතිබුණි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# විගණකාධිපතිවරයාගේ වාර්තාව

- අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමයේ සේවකයකු විසින් සිදු කරන ලද වංචාවක් 2022 ඔක්තෝබර් මාසයේදී අහම්බෙන් අනාවරණය වී ඇත. මෙම වංචාව 2018 වර්ෂයේ සිට සිදු කර ඇති අතර අභ්‍යන්තර විගණන වාර්තාවට අනුව අනාවරණය වූ මූල්‍ය පාඩුව රු. 5,136,000 කි. නිසි සුපරීක්ෂණයක් සහ අධීක්ෂණයක් සහිතව අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් ලෙස සැලසුම් කර ක්‍රියාත්මක නොකිරීම නිසා මෙය සිදු වී ඇති බව නිරීක්ෂණය වේ. තවද, අරමුදල සඳහා ශක්තිමත් පාලන පරිසරයක් නොමැති බව මෙයින් පැහැදිලි වේ.

(ආ.) අග්‍රහාර හිමිකම් ඉල්ලුම්පත්‍ර භාරගැනීමේ සිට හිමිකම් පියවීම දක්වා සහ අග්‍රහාර හිමිකම්වල බැරකම් හඳුනාගැනීම සඳහා, හිමිකම් කළමනාකරණය කිරීමේ ඒකාබද්ධ පද්ධතියක් අරමුදලට නොතිබුණි.

(ඇ.) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී අරමුදලේ (SRCC සහ Tr අරමුදල) ගනුදෙනු මූලාශ්‍ර ලේඛන භාවිතා කරමින් පැතුරුම් පත්වල සටහන් කර ඇති අතර වසර අවසානයේදී පැතුරුම් පත්වල සටහන් වූ සියලුම ගනුදෙනු අතින් සකස් කල ලෙජරයකට පිටපත් කර විගණනයට ඉදිරිපත් කර ඇත. 2019 වර්ෂයේදී අරමුදල ගිණුම්තැබීම සඳහා භාවිතා කරන "සේජ්" ගිණුම්කරණ පද්ධතිය තුළ මෙම පහසුකම සපයා තිබුණද, එම පහසුකම වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සඳහා යොදාගෙන නොතිබුණි.

(ඈ) අග්‍රහාර රක්ෂණාවරණයේ වාරික මුදල් ගෙවීමේදී සහ හිමිකම් පෑමේදී සාමාන්‍ය, රිදී සහ රන් යෝජනාක්‍රම තුනම සඳහා එක් ආදායම් සහ එක් වියදම් අයිතමයක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි. නිසි සහ යාවත්කාලීන දත්ත පද්ධතියක් නොමැති බැවින්, අරමුදලට කරන ලද දායක මුදල්, එක් එක් අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමවලින් ගෙවන ලද හිමිකම් පෑම් සඳහා සාක්ෂි ලබා ගැනීම මෙන්ම එක් එක් ආයතනය විසින් සහ එක් එක් රක්ෂණ ඔප්පුහිමියා විසින් රක්ෂණ අරමුදල වෙත මාසිකව කරන ලද දායක මුදල් පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබා ගැනීම දුෂ්කර ය.

(ඉ.) ප්‍රතිරක්ෂණ අංශය සඳහා හිමිකම් පෑම් සම්බන්ධ ගනුදෙනු කළමනාකරණය සහ වාර්තා තබා ගැනීම සඳහා නිසි පද්ධතියක් නොමැත.

### 1.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම

(අ.) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් (ෂරී) කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ලැබුණු රුපියල් 148,380,847 මුදලක ප්‍රතිරක්ෂණ වාරිකය 2019 වර්ෂයේදී දළ ලිඛිත වාරිකය සඳහා හඳුනාගෙන ඇත. තවදුරටත් ජාතික රක්ෂණ භාර අරමුදලට මෙම ගෙවීම භාර ගැනීමට නීතිමය බලයක් නොමැති බැවින් මෙම ආදායම 2020 වර්ෂයේදී කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත ආපසු ලබා දී ඇත . ශ්‍රී.ලං.ගි.ප්‍ර අංක 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි ප්‍රමිතයෙහි 42 වැනි ඡේදයට අනුව, දෝෂය සිදු වූ 2019 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද සංසන්දනාත්මක ප්‍රමාණයන් නැවත සංශෝධනය කර දැක්වීමෙන් සමාලෝචිත කාල සීමාව තුළ මෙම දෝෂ නිවැරදි කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගැළපීමක් කර නොතිබුණි.

(ආ.) ශ්‍රී.ලං.ගි.ප්‍ර අංක 12 - ආදායම් බදු
අරමුදල විසින් 2020 දෙසැම්බර් 31 දිනට රුපියල් 934,018,739 ක් වූ විලම්බිත බදු වගකීම් හඳුනාගෙන නොතිබුණි. තවද, විලම්බිත බදු සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනාවරණය කර නොතිබුණි.

### 1.2.4 ගිණුම්කරණ අඩුපාඩු

(අ.) සමානුපාතික සමූහ ප්‍රතිරක්ෂණ ගිවිසුම් සඳහා වන අරමුදලේ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව, ප්‍රතිරක්ෂණ නායකයාගේ තහවුරු කිරීම සමග රක්ෂණ අවධානම පවරන්නා වෙතින් ලැබෙන කාලච්ඡේද ප්‍රකාශන පදනම් කර ගනිමින් ප්‍රතිරක්ෂණ වාරිකය හඳුනාග නු ලැබේ. කෙසේ වෙතත්, අදාළ ගිණුම් ප්‍රතිපත්තියට පටහැනිව 2020 ට පෙර අදාළ ප්‍රතිරක්ෂණ වාරිකය රුපියල් 628,756,431ක් සමාලෝචිත වර්ෂය සඳහා හඳුනාගෙන ඇත. තවදුරටත් සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රතිරක්ෂණ වාරිකය රුපියල් 718,436,154 ක් , නායකයා තහවුරු කිරීම සහ කාලච්ඡේද ප්‍රකාශන ප්‍රමාද වී තිබීම හේතුවෙන් 2021 වසර සඳහා හඳුනාගෙන ඇත. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිරක්ෂණ ආදායම රු.89,679,723 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ.) සමානුපාතික නොවන සමූහ ප්‍රතිරක්ෂණ ගිවිසුම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව, වසර ආරම්භයේ දී ගිවිසුමේ දැනටමත් දක්වා ඇති ගිවිසුම්ගත දළ ලිඛිත වාරිකය මත පදනම්ව රක්ෂණ වාරිකය හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, ප්‍රතිරක්ෂණ වාරිකය හඳුනා ගැනීමේ අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තියට පටහැනිව , 2020 ට පෙර අදාළ වන්නා වූ රු. 78,341,182 ක ප්‍රතිරක්ෂණ වාරික මුදල් සමාලෝචිත වර්ෂය සඳහා හඳුනාගෙන තිබුණි. තවදුරටත් සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රතිරක්ෂණ වාරික මුදල් රු. 639,615 ක වටිනාකමක් 2021 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. ගිණුම්කරණ කාලච්ඡේදය අවසානයේදී පවතින අමතර තොරතුරු සහ වර්ධනයන් සමඟ එම ගිවිසුම් නැවත සමාලෝචනය කර අවශ්‍ය ගැළපීම් සිදු නොකිරීම හේතුවෙන් මෙම තත්වය ඇතිවී තිබේ. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ආදායම රුපියල් 77,701,567 කින් අධිතක්සේරු වී ඇත.

(ඇ.) පීඨ ප්‍රතිරක්ෂණ ගිවිසුම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව ප්‍රතිරක්ෂණ නායකයාගේ තහවුරු කිරීම ලැබීමෙන් පසු රක්ෂණ වාරිකය හඳුනාගෙන ඇත. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා පූර්ව කාලපරිච්ඡේද සඳහා අදාළ රුපියල් 211,129,506 ක ප්‍රතිරක්ෂණ වාරික හඳුනාගෙන ඇත. තවද, සමාලෝචිත වර්ෂය සඳහා අදාළ ප්‍රතිරක්ෂණ වාරික මුදල් රු. 50,279,153 ක් 2021 වර්ෂයේදී හඳුනාගෙන ඇත. එබැවින් වර්ෂය සඳහා ආදායම රුපියල් 160,850,353 කින් අධිතක්සේරු වී ඇත.

(ඈ.) මූල්‍ය ප්‍රකාශනය සහ පාලන පොදු ලෙජර් ගිණුමට අනුව අභ්‍යන්තර ප්‍රතිරක්ෂණ වෙතින් ලැබිය යුතු වාරික වටිනාකම රු. 1,267,806,451 කි. කෙසේ වෙතත්, ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වාරික වයස් විශ්ලේෂණයට අනුව ශේෂය රු. 1,258,772,697 කි. එබැවින් රු. 9,033,754 ක වෙනසක් නිරීක්ෂණය විය.

# විගණකාධිපතිවරයාගේ වාර්තාව

(ඉ.) මූල්‍ය ප්‍රකාශනවල කාර්ය මණ්ඩල ආපදා ණය ශේෂය සහ ඒ සම්බන්ධව විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සවිස්තරාත්මක වාර්තාව අතර රුපියල් 3,537,190 ක වෙනසක් නිරීක්ෂණය වී ඇත.

(ඊ.) භාණ්ඩාගාර බැඳුම්කරවල ධාරණ අගය 2020 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 139 කින් අධිතක්සේරු වී ඇත. සාධාරණ අගය ගණනය කිරීම සඳහා අරමුදල විසින් භාවිතා කරන ලද වෙළඳපල මිල ගණනය කිරීමේ දෝෂය හේතුවෙන් වෙනස සිදුවී ඇත.

(උ.) භාණ්ඩාගාර බිල්පත්වල ධාරණ අගය 2020 දෙසැම්බර් 31 දිනට රු මිලියන 1.08 කින් අධිතක්සේරු වී ඇත. සාධාරණ අගය ගණනය කිරීම සඳහා අරමුදල විසින් භාවිතා කරන ලද කූපන් අගය ගනණය කිරීමේ දෝෂය හේතුවෙන් වෙනස්කම් සිදුවී ඇත.

(ඌ.) 2019 වර්ෂය සඳහා වූ රුපියල් 1,598,006 ක වියදම් 2020 වර්ෂය සඳහා ගිණුම්ගත කර ඇත. එබැවින් වර්ෂය සඳහා වූ වියදම් අධිතක්සේරු වී ඇති අතර එම ප්‍රමාණයෙන්ම වර්ෂය සඳහා වූ ලාභය අවතක්සේරු වී ඇත.

(එ.) 2017/2018 වසර සඳහා ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමයේ (NNDIS) ගැළපුම් වාරිකය හේතුවෙන් ප්‍රතිරක්ෂණ ගිවිසුම්වලින් පැන නැගුණු ප්‍රතිරක්ෂණ වගකීම් රු. 123,387,679 ක වටිනාකමක් සහ 2018/2019 වර්ෂය සඳහා අරමුදල විසින් තම අවධානම ප්‍රතිරක්ෂණය කිරීමෙන් පැන නැගුණු ප්‍රතිරක්ෂණයෙහි ගැළපුම් වාරිකය රු. 466,292,684ක වටිනාකමක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි.

### 1.2.5 නිවැරදි නොවන තක්සේරු කිරීම හෝ ඇස්තමේන්තු කිරීම

(අ.) ශේෂ පත්‍ර දිනට පවතින ගංවතුර නොවන හිමිකම් පෑම් සඳහා වන දිගුකාලීන හිඟ ප්‍රතිපාදන පිළිබඳව අරමුදල නිසි ඇගයීමක් සිදු කර නොතිබූ බැවින් ප්‍රතිපාදනවල නිරවද්‍යතාවය තහවුරු කර ගත නොහැක. ගංවතුර නොවන හිමිකම් පෑම් සඳහා වූ රුපියල් 427,550,703 ප්‍රතිපාදන වසර දෙකේ සිට පහකට වැඩි කාලයක් හිඟව තිබූ අතර රුපියල් 156,589,534 ක ප්‍රතිපාදන වසර පහකට වැඩි කාලයක් හිඟව තිබිණි.

(ආ.) අංක 1791/4 දරන සහ 2012 දෙසැම්බර් 21 දිනැති ගැසට් පත්‍රයට අනුව, සාමාන්‍ය (ජීවිත නොවන) රක්ෂණය ප්‍රතිරක්ෂණය සඳහා සම්පූර්ණ වගකීම මත රක්ෂකයින් ප්‍රතිරක්ෂක ලෙස ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් ප්‍රතිරක්ෂණය කළ යුතු අනිවාර්ය ප්‍රතිශතය සියයට 30 කි. කෙසේ වෙතත්, අරමුදල අලාභ සඳහා සියයට 100 ක ප්‍රතිශතයක ප්‍රතිපාදන සලසා ඇත. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිරක්ෂණ ප්‍රතිපාදනය රු. 7,210,000 කින් අධිතක්සේරු වී ඇත.

(ඇ.) 2016 ඔක්තෝම්බර් 05 වන දින වන විටත් ප්‍රතිරක්ෂණය මගින් ගෙවීම සඳහා වගකීමක් නොමැති බව රක්ෂණකරු දන්වා ඇතත්, රුපියල් 801,513 ක් ගෙවිය යුතු ප්‍රතිරක්ෂණය ලෙස තවමත් මූල්‍ය ප්‍රකාශනවල පවතී.

(ඈ.) 2020 වසර අවසානයේ රුපියල් 510,530,810 ක් වූ ගෙවිය යුතු අග්‍රහාර හිමිකම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සාධාරණ බව සනාථ කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය, ආයුගණකගේ තක්සේරුව හෝ වෙනත් ලියකියවිලි වැනි කිසිදු සාක්ෂියක් සපයා නොතිබුණි.

(ඉ.) 2020 වර්ෂය සඳහාවන මෝටර් රථ රක්ෂණ හිමිකම් සඳහා ගෙවිය යුතු ශේෂය රුපියල් 10,323,235 ක් ලෙස දැක්වෙන අතර එම වටිනාකම කිසිදු තක්සේරුවකින් තොරව 2019 වසරේ සිට අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත.

### 1.2.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

(අ.) 2020 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයෙන් ලැබිය යුතු මුළු ණය ශේෂය රු. 54,274,121ක් වූ නමුත් අරමුදල මගින් නිසි ණය ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොමැත. ණය විස්තර පැතුරුම් පත්වල පමණක් සටහන් කර ඇති බැවින් ණය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ලබා ගැනිමට නොහැකි අතර එම තොරතුරුවල වලංගු භාවයද සැක සහිතය.

(ආ.) 2020 දෙසැම්බර් 31 දිනට අරමුදල වෙනුවෙන් ගෙවිය යුතු ආදායම් බදු ගිණුමේ හර ශේෂය රු. 22,465,243 ක් වන අතර මෙම හර ශේෂය සඳහා විගණනයට සාක්ෂි ලබා දී නොමැත.

(ඇ.) කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් (AAIB) කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා 2019 වර්ෂයේදී ලැබුණු රුපියල් 148,380,847 ක් ප්‍රතිරක්ෂණ වාරිකයක නිසි ඇගයීමකින් තොරව 2019 වර්ෂය සඳහා ප්‍රතිරක්ෂණ ආදායම ලෙස හඳුනාගෙන ඇත. තවද ඉහත ප්‍රතිරක්ෂණ වාරිකය සමාලෝචිත වර්ෂයේදී ආපසු ගෙවා තිබුණේ අරමුදල සඳහා මෙම ගෙවීම පිළිගැනීමට කිසිදු නෛතික අධිකාරියක් නොමැති බව දක්වමිනි. කෙසේ වෙතත්, මෙම ආදායම ලැබීම සහ ආපසු ගෙවීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. කළමනාකාරිත්වයට අනුව මෙම ගණුදෙනුවට අදාළව පවත්වාගෙන ගිය ලිපිගොනුව අස්ථානගත වී තිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය , හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන්වල වාර්තාගත හෝ වාර්තා නොකළ වටිනාකම් හෝ ගනුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැළපීම්ක් කිරීමට අවශ්‍ය දැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

# විගණකාධිපතිවරයාගේ වාර්තාව

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය යැයි සැලකෙන සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර නිසි ගිණුම් වාර්තා අරමුදල තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදලට සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| **නීතිරීති / විධානයට යොමුව** | **නිරීක්ෂණ** |
|---|---|
| (අ.) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 7, 31(2) සහ 49 (ආ) වගන්ති | රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ නීති රීතිවලට අනුව, කාර්තුමය තොරතුරු වාර්තා 61 ක් කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, COVID 19 වසංගතය හේතුවෙන්, කොමිසම විසින් ලබා දී ඇති කාලය දීර්ඝ කිරීම් සලකා බැලීමෙන් පසු දින 38 සිට 285 දක්වා ප්‍රමාදයකින් කාර්තුමය වාර්තා 16 ක් ඉදිරිපත් කර තිබුණි. |
| (ආ.) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 13 (ඉ) වගන්තිය | පනතේ විධි විධානවලට අනුව අරමුදල සම්බන්ධයෙන් සාමාන්‍ය ගිණුමක් සහ එක් එක් සාමාජිකයා සම්බන්ධයෙන් වෙනම තනි ගිණුම් පවත්වාගෙන යාමට අවශ්‍ය වේ. කෙසේ වෙතත්, අරමුදල විසින් තනි සාමාජිකයින් සඳහා වෙනම ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

# විගණකාධිපතිවරයාගේ වාර්තාව

| | |
|---|---|
| (ඇ.) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 23 වැනි ඡේදය | පනතේ විධි විධානවලට අනුව, රක්ෂණ සමාගම් නිවැරදිව ඉන්වොයිසි කර තිබේද සහ ඉන්වොයිසිගත මුදල අරමුදලට ප්‍රේෂණය කර තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා රක්ෂණ සමාගම්වල වාර්තා පරීක්ෂා කිරීමට අරමුදල අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ඈ.)මුදල් රෙගුලාසි 261(1) | ගෙවීම් වවුචරවල අනුක්‍රමික අංක අනුපිළිවෙළ නිසි ලෙස නඩත්තු කර නොතිබුණි. |
| (ඉ.)මුදල් රෙගුලාසි 386(7) | අවලංගු කරන ලද චෙක්පත් උපපත්‍රිකාවට අමුණා චෙක් පොතෙහිම තබා ගත යුතු වුවද, අරමුදල විසින් ගෙවීම් වවුචරය සමඟ චෙක්පත් උපපත්‍රිකාව අමුණා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වවුචරය අස්ථානගත වීමකදී අවලංගු කරන ලද චෙක්පත් සම්බන්ධ සියලු තොරතුරු ද අස්ථානගත විය හැක. |
| (ඊ.)මුදල් රෙගුලාසි 395(ආ) | බැංකු සැසඳුම් ප්‍රකාශ අදාළ ගෙවන නිලධාරියා විසින් සහතික කර, පරීක්ෂා කිරීම සඳහා විගණනයට ලබා දිය යුතුය. කෙසේ වෙතත්, බැංකු ගිණුම් එකොළහක් (11) සඳහා සකස් කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශන නම, තනතුර සහ දිනය නොමැතිව සහතික කර තිබුණි. |
| (උ.)මුදල් රෙගුලාසි 396 | නිකුත් කළ දින සිට මාස හයක කාලයක් තුළ, මුදල් ලබා ගැනීම සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ඒ අනුව, 2021 ජනවාරි 31 දිනට බැංකු ගිණුම් දෙකකට අදාළව, මුළු වටිනාකම රු. 3,501,599 ක් වන අවලංගු වූ චෙක්පත් 61ක් පවතින බව නිරීක්ෂණය විය. |
| (ඌ.) 2015 මැයි 25 දිනැති අංක ජ්‍යෑ 2/2015 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයේ 04 වන වගන්තිය | චක්‍රලේඛ විධි විධාන අනුව ජංගම දුරකථන මිලදී ගැනීමේ පිරිවැය නිළධාරීන් විසින් පුද්ගලිකව සපයා ගත යුතු වුවද, අරමුදල විසින් 2016 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාර්ය මණ්ඩලය සඳහා ජංගම දුරකථන මිලදී ගැනීමට රු. 2,432,371ක මුදලක් වියදම් කර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) ලැබිය යුතු මුළු ප්‍රතිරක්ෂණ වාරිකයෙන් 11.3% නියෝජනය කරන, රු. 142,595,979 වන ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වාරිකය වසරකට වැඩි කාලයක් සඳහා හිඟව පැවති අතර, ලැබිය යුතු මුළු ප්‍රතිරක්ෂණ වාරිකයෙන් 11.8% නියෝජනය කරන, රු. 148,466,031 වන ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වාරිකය වසර දෙකකට වැඩි කාලයක් සඳහා හිඟව පවති. ලැබිය යුතු මුළු හිඟ ශේෂයෙන් 11.3% නියෝජනය කරන, රු. 151,033,057ක ශේෂයක් වසර තුනකට වැඩි කාලයක් සඳහා හිඟව පවති. දිගුකාලීනව පවතින ලැබිය යුතු හිඟ ප්‍රතිරක්ෂණ වාරික අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ.) 2008 මාර්තු 25 දිනැති අංක 1542/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 3(1) ඡේදයට අනුව, වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදය අරමුදල සඳහා රක්ෂණ ඔප්පු නිකුත් කිරීමෙන් අයකර ගන්නා වාරිකය රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමකට බැර කළ යුතුය. කෙසේ වෙතත්, නිසි නීතිමය ප්‍රතිපාදන නොමැතිව රක්ෂණ සමාගම් වෙත 20% ක කොමිස් මුදලක් ලබා දීමෙන් අනතුරුව මෝටර් නොවන රක්ෂණ ගිවිසුම සඳහා අය කළ වාරිකය අරමුදලට බැර කර ඇත. සමාලෝචිත වර්ෂය සඳහා මෝටර් නොවන රක්ෂණ ගිවිසුම්වලින් කොමිස් ලෙස ලබා දී ඇති මුදල රු. 1,228,933,582 කි.

(ඇ.) 2008 මාර්තු 25 දිනැති අංක 1542/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 3(1) ඡේදයට අනුව වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදය සඳහා වන අරමුදල සඳහා රක්ෂණ ඔප්පු නිකුත් කිරීමෙන් අය කරන වාරිකය රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමකට බැර කළ යුතුය. කෙසේ වෙතත්, මෝටර් රථ රක්ෂණ ඔප්පු සඳහා වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදය ආවරණය කිරීමට රක්ෂණ සමාගම්වලින් අයකර ගන්නා ලද සම්පූර්ණ වාරිකයෙන්, අරමුදල අයකරගෙන ඇත්තේ 12%ක් පමණක් වන අතර ඒ සඳහා නිසි නීතිමය ප්‍රතිපාදන නොමැත. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලට රුපියල් 10,155,796,304ක වාරික මුදල් ලැබීම අඩුවී ඇත.

(ඈ.) 2007 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල (සංශෝධිත) පනත සහ 2012 දෙසැම්බර් 21 දිනැති අංක 1791/4 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව, ශ්‍රී ලංකාව තුළ සාමාන්‍ය (ජීවිත නොවන) ප්‍රතිරක්ෂණවලින් 30% ක කොටසක් අනිවාර්යයෙන්ම අරමුදල තුළ ප්‍රතිරක්ෂණය කළ යුතුව ඇත. කෙසේ වෙතත්, අනිවාර්ය කොටස ප්‍රතිරක්ෂණය කරන ප්‍රතිරක්ෂණ කරුවන්ට අරමුදල කොමිස් මුදලක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. අරමුදල විසින් 2017 සිට 2020 වසර දක්වා සාමාන්‍ය රක්ෂණ සමාගම් 13කට පෙර කී අනිවාර්ය කොටස සඳහා ප්‍රතිරක්ෂණ කොමිෂන් ලෙස රු. 6,720,273,899 නිසි නීතිමය ප්‍රතිපාදන නොමැතිව ගෙවා ඇත.

# විගණකාධිපතිවරයාගේ වාර්තාව

(ඉ.) ආයෝජන ක්‍රියාකාරකම්

(i.) ආයෝජන ප්‍රතිපත්තියේ 13 වැනි ඡේදයේ ආයෝජන කළමනාකරුගේ භූමිකාව අර්ථ දක්වා තිබුණද, 2020 අගෝස්තු 30 සිට මෙම තනතුර පුරප්පාඩු වී තිබුණි.

(ii.) ආයෝජන ප්‍රතිපත්තියේ 17 වැනි ඡේදයට අනුව ආයෝජන කමිටුව වරින් වර රැස්විය යුතු අතර ආයෝජන කමිටුවේ වගකීම් නිර්වචනය කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා ආයෝජන කමිටුව රැස්වී නොතිබුණි.

(iii.) ආයෝජන ප්‍රතිපත්තිය තුළ එය අඛණ්ඩව සමාලෝචනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා නොමැත. තවද, ආයෝජන ප්‍රතිපත්තිය පිහිටුවා ක්‍රියාත්මක කිරීමෙන් පසු, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් එය නැවත සමාලෝචනය කර නොතිබූ අතර ආයෝජන ප්‍රතිපත්තියට අවශ්‍ය වැඩිදියුණු කිරීම් කාලානුරූප ව ඇතුළත් කිරීම අවශ්‍ය වේ.

(iv.) ආයෝජන ප්‍රතිපත්තියට අනුව, ආයෝජන තෝරා ගැනීම පදනම් වන්නේ ආර්ථික තත්වයන්, පොලී අනුපාත හැසිරීම්, අනාගත ප්‍රවණතා සහ අරමුදලේ ක්‍රියාකාරී මුදල් ප්‍රවාහ අවශ්‍යතා ඇගයීම මත ය. කෙසේ වෙතත්, අතිරික්ත මුදල් ප්‍රවාහයන් හඳුනා ගැනීම සහ විචක්ෂණ ලෙස ආයෝජන තීරණ ගැනීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රවාහ පුරෝකථනයන් සකස් කර නොතිබුණි.

(v.) අරමුදලේ මූල්‍ය වත්කම් (ආයෝජන) රු. 21,666,072,511 ක් පමණ වන අතර එය අරමුදලේ මුළු වත්කම්වලින් 79%ක් නියෝජනය කරනු ලැබේ. කෙසේ වෙතත්, ආයෝජන ප්‍රතිපත්තියේ ආයෝජන තීරණ සඳහා මූල්‍ය අධිකාරිය පැවරීම ආයෝජනවල වටිනාකම සහ ආයෝජන ප්‍රභවයන් මත අර්ථ දක්වා නොතිබුණි. ආයෝජනයේ වටිනාකම සහ ආයෝජන ප්‍රභවය නොසලකා සියලුම ආයෝජනයන්, ආයෝජන කමිටුව විසින් පමණක් අනුමත කර තිබුණි.

(ඊ.) ජීව ගණක ක්‍රියාවලිය

(i.) අරමුදලේ දත්තයන්හි විශ්වාසනීය මට්ටම ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදු කිරීමට අදාළව, දත්ත ග්‍රහණය කර ගැනීම, ව්‍යාපාරයේ ප්‍රධාන කොටස් බෙදීම, හිමිකම් ගණන් සැපයීම සහ හිමිකම් හැසිරවීමේ වියදම් සම්බන්ධයෙන් ජීව ගණක විසින් කරන ලද නිර්දේශ, අධ්‍යක්ෂක මණ්ඩල මට්ටමින් හෝ සුදුසු කළමනාකරණ මට්ටමින් සාකච්ඡා කර නොතිබුණි.

(ii.) අවශ්‍ය ජීව ගණක තොරතුරු රැස් කිරීම, රඳවා තබා ගැනීම සහ සැපයීම සඳහා අරමුදල විසින් ජීව ගණක අංශයක් ස්ථාපිත කර නොමැත.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ.) මෙම කාල සීමාව තුළ සම්පූර්ණ ගිණුමේ අතිරික්ත අලාභ ප්‍රතිරක්ෂණ කොන්ත්‍රාත්තුව (ව්‍යසනයක් ඇති විය හැකි මට්ටමේ අවදානම්) ආවරණය කිරීම සඳහා ප්‍රතිරක්ෂණ ගිවිසුමට එළඹීමට මාස එකොළහක් (11) ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය වී ඇත. අරමුදල ප්‍රතිරක්ෂණ වගකීම්වල 30% ක අනිවාර්ය කොටසක් දැරිය යුතුය. මෙකී ප්‍රමාද කාල සීමාව තුළ කිසියම් ප්‍රතිරක්ෂණ හිමිකම් පෑමක් සිදු වුවහොත් එය අරමුදලේ ක්‍රියාකාරිත්වයට සෘජුවම බලපානු ඇත. ප්‍රතිරක්ෂණ රෙට්රෝ සැසිය සඳහා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය ප්‍රමාද වීම මෙම ගිවිසුමට එළඹීමේ ප්‍රමාදයට හේතු වී ඇත.

## 2.5. වෙනත් විගණන නිරීක්ෂණ

(අ.) ප්‍රතිරක්ෂණ හිමිකම් ක්‍රියාවලිය හැසිරවීමට සහ ගෙවිය යුතු වගකීම් හඳුනා ගැනීමට අරමුදල සඳහා ලේඛනගත ප්‍රතිපත්තියක් නොතිබුණි. එබැවින්, අරමුදල ප්‍රාථමික දැනුම් දීමේ ලේඛනයෙන් ප්‍රතිරක්ෂණ වගකීම හඳුනාගෙන වාර්තා කරනු ලබයි.

(ආ.) අරමුදලට අනුමත අතිකාල ගෙවීමේ ප්‍රතිපත්තියක් නොමැති අතර අතිකාල ගෙවීම් සඳහා ආයතන සංග්‍රහයේ ඇති විධි විධාන ද අනුගමනය නොකරයි.



ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

# විස්තීරණ ආදායම පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

| | සටහන් | 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| දළ ලිඛිත වාරික | 1 | 9,818,040,011 | 12,693,194,645 |
| අග්‍රහාර සඳහා ලද දායක මුදල් | 1 | 5,469,298,738 | 4,838,723,551 |
| රැස්කල වගා රක්ෂණ බදු | | 1,626,851,259 | 1,780,383,987 |
| ලබා දුන් ප්‍රතිරක්ෂණ වාරික | | (1,101,890,156) | (1,191,875,662) |
| SRCC & Tr අරමුදල වෙත ලබා දුන් | | - | - |
| **ශුද්ධ ලිඛිත වාරික** | | 15,812,299,851 | 18,120,426,521 |
| නොඉපයු වාරික සඳහා සංචිතයන්හි ශුද්ධ වෙනස | | 867,768,751 | (997,664,716) |
| UPR වෙනස් වීමෙහි ප්‍රතිරක්ෂකයින්ගේ කොටස | | 794,959,214 | (674,735,040) |
| **ශුද්ධ ඉපයූ වාරික** | | 17,475,027,816 | 16,448,026,766 |
| **වෙනත් මෙහෙයුම් වලින් ආදායම** | | | |
| ගාස්තු සහ කොමිස් ආදායම | 2 | 1,935,395 | 4,438,361 |
| ආයෝජන සහ වෙනත් ආදායම් | 3 | 1,385,087,715 | 1,264,778,325 |
| **වෙනත් ආදායම්** | | 1,387,023,110 | 1,269,216,686 |
| දළ ප්‍රතිලාභ සහ හිමිකම් ගෙවීම් | 4 | (7,978,035,907) | (9,934,309,446) |
| ප්‍රතිරක්ෂකයින් වෙත යැවූ හිමිකම් | 4 | - | 498,500,000 |
| ගිවිසුම් ගත වගකීම් හි දළවෙනස | 4 | 97,522,388 | (2,522,543,002) |
| ප්‍රතිරක්‍ෂණ වෙත යවන ලද ගිවිසුම් ගත වගකීම් හි වෙනස | 4 | - | (43,234,155) |
| IBNR හි දළ වෙනස | 4 | (74,002,744) | (77,731,211) |
| **ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම්** | | (7,954,516,263) | (12,079,317,814) |
| ප්‍රාරක්‍ෂණය සහ අත්පත් කර ගැනීමේ පිරිවැය (ප්‍රතිරක්ෂණය ඇතුළුව) | 5 | (1,614,860,946) | (2,055,691,850) |
| වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් | 6.1 | (409,175,576) | (552,685,117) |
| මූල්‍ය පරිවැය සහ වෙනත් අදාල පිරිවැය | 6.2 | (17,571,769) | (21,062,606) |
| **මුළු ප්‍රතිලාභ, හිමිකම් සහ වෙනත් වියදම්** | | (9,996,124,555) | (14,708,757,386) |
| **ලාභය (අලාභය) බදු පෙර** | | 8,865,926,371 | 3,008,486,066 |
| වර්ෂය සඳහා ආදායම් බදු | | (1,339,826,929) | 105,600,661 |
| **වර්ෂය සඳහා ලාභය (අලාභය)** | | 7,526,099,442 | 3,114,086,727 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| විකිණීම සඳහා වන මූල්‍ය වත්කම් වල ශුද්ධ වෙනස | | 134,541,150 | 517,879,752 |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම මත සැබෑ ප්‍රතිලාභ/(අලාභය) | | (7,943,165) | (574,033) |
| **වර්ෂය සඳහා වෙනත් විස්තීර්ණ ආදායම්, බදු වල ශුද්ධ අගය** | | | |
| **සම්පූර්ණ විස්තීර්ණ ආදායම** | | 7,652,697,427 | 3,631,392,446 |

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනට

| | සටහන් | 2020 රු. | 2019 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| අස්පර්ශනීය වත්කම් | 7 | **5,998,484** | 8,147,706 |
| දේපළ, පිරියත සහ උපකරණ | 8 | **42,225,902** | 40,497,303 |
| බදු වත්කම් භාවිතය සඳහා බදුකරුගේ අයිතිය | 9 | **94,511,709** | 130,651,150 |
| මූල්‍ය වත්කම් | 10 | **21,666,072,511** | 15,444,667,263 |
| අයවිය යුතු ප්‍රතිරක්ෂණ | 11 | **1,102,142,174** | 1,599,620,442 |
| අයවිය යුතු වාරික | 12 | **2,849,482,173** | 2,010,815,480 |
| මෘදු ණය | 13 | **2,726,557** | 3,754,982 |
| වෙනත් මූල්‍ය නොවන වත්කම් | 14 | **112,092,419** | 109,855,613 |
| විලම්බිත කොමිස | 15 | **713,547,137** | 758,831,301 |
| බැංකුවේ සහ අතැති මුදල් | 16 | **769,514,934** | 600,106,740 |
| **මුළු වත්කම්** | | **27,358,314,000** | 20,706,947,980 |
| **හිමිකාරිත්වය සහ වගකීම්** | | | |
| රඳවාගත් ඉපැයීම් | | **13,887,197,157** | 7,143,097,715 |
| හිමිකාරිත්වයේ වෙනත් අංග | | **177,448,911** | 50,850,926 |
| සංචිත නැවත ඇගයීම | | **(2,102,126)** | (2,102,126) |
| **මුළු හිමිකාරිත්වය** | | **14,062,543,942** | 7,191,846,515 |
| **වගකීම්** | | | |
| රක්ෂණ ගිවිසුම් වගකීම් | 19 | **9,825,591,002** | 11,803,879,609 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 20 | **50,120,616** | 34,192,463 |
| බදු ණයකරු | 21 | **113,263,614** | 141,801,845 |
| වෙනත් වගකීම් | 17 | **3,306,794,823** | 1,535,227,547 |
| බැංකු අයිරා | 16 | **-** | - |
| **මුළු වගකීම්** | | **13,295,770,055** | 13,515,101,463 |
| **මුළු හිමිකාරිත්වය සහ වගකීම්** | | **27,358,314,000** | 20,706,947,980 |

භාර අරමුදලේ මූල්‍ය ප්‍රකාශනයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ගේ අවශ්‍යතාවයන් හා අනුකූල වන බව මෙයින් සහතික කරමි.

**ධම්මිකා විරකෝන්**
**ප්‍රධාන මූල්‍ය නිලධාරී (වැඩ බලන)**
**සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය**

**එල්. ඒ. පී. එන්. ලියනාරච්චි**
**ප්‍රධාන විධායක නිලධාරී**

පිටු අංක 5 සිට 44 දක්වා පිටු වල සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනයන්ගේ අත්‍යවශ්‍ය කොටසක් නිර්මාණය කරනු ලබයි. මූල්‍ය ප්‍රකාශනයන් සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරනු ලබයි. මෙම මූල්‍ය ප්‍රකාශනයන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර, ඔවුන් වෙනුවට මෙහි අත්සන තබන ලදී.

**මොහිබ් මව්ජිඩ් මහතා**
**සභාපති**

**අධ්‍යක්ෂ**

2022 සැප්තැම්බර් 22
කොළඹ

# හිමිකාරීත්වයේ වෙනස්වීම් ප්‍රකාශනය

2020 දෙසැම්බර් 31 දිනට

| | රඳවාගත් ඉපැයීම් | විකිණීම සඳහා වන මූල්‍ය වත්කම් | සංචිත ප්‍රතිගණනය | එකතුව |
|---|---|---|---|---|
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 7,831,705,609 | (266,847,481) | | 7,564,858,128 |
| වර්ෂය සඳහා ලාභය | 976,233,935 | | | 976,233,935 |
| විකිණිම සඳහා වන මූල්‍ය වත්කම් වල ශුද්ධ වෙනස | | 208,755,171 | | 208,755,171 |
| ඒකාබද්ධ අරමුදලට මාරු කළ මුදල් | (1,500,000,000) | | | (1,500,000,000) |
| වර්ෂය අවසානයේදී අවසන් කිරීමේ වෙනස | (44,253,311) | | | (44,253,311) |
| ගෙවිය යුතු ආදායම් බදු 2016/17 | (97,669,225) | | | (97,669,225) |
| ඇපකර මත ක්‍රමක්ෂය වට්ටම් | 26,235,147 | | | 26,235,147 |
| කෘෂි ඒඒඅයබී නැවත ගෙවීම | 42,871,673 | | | 42,871,673 |
| දිරි දීමනා 2016 | (3,140,650) | | | (3,140,650) |
| ආර්අයි වාරික -සාමාන්‍ය | (2,921,713) | | | (2,921,713) |
| ආරම්භක - ඒආර් පාලන ආර්අයි | (38,856,406) | | | (38,856,406) |
| ආරම්භක - ඒආර් පාලන මෝටර් වාහන නොවන | 83,109,718 | | | 83,109,718 |
| චෙක්පත් නැවත ලැබීම | (324,575) | | | (324,575) |
| ඊටීඑෆ් 3% | 305,147 | | | 305,147 |
| මෝටර් බයිසිකල් අත්තිකාරම් හා මෝටර් වාහන ලැබීම් | (57,582,588) | | | (57,582,588) |
| ඊඑස්සී | (2,068,743) | | | (2,068,743) |
| වෙනත් පෙර වර්ෂ හා ගැලපීම් | (493,887) | | | (493,887) |
| පාර්තෝෂික ඇගයීම මත ආයුගණක (ප්‍රතිලාභ)/අලාභ | - | (8,699,331) | | (8,699,331) |
| | 7,213,150,131 | (66,791,641) | - | 7,146,358,490 |
| වර්ෂය සඳහා ලාභය | 3,183,238,866 | | | 3,183,238,866 |
| | - | | | |
| | | (390,587,646) | | (390,587,646) |
| ඒකාබද්ධ අරමුදලට යවන ලද මුදල් | (2,750,000,000) | | | (2,750,000,000) |
| වත්කම් නැවත ඇගයීම | | | (2,102,126) | (2,102,126) |
| අපහරණය කළ මෝටර් වාහන නැවත ඇගයීම | 6,276,415 | | | 6,276,415 |
| ඇපකර මත ක්‍රමක්ෂය වට්ටම් | 25,070,657 | | | 25,070,657 |
| NNDIS නැවත පිහිටුවීම හා ගැලපුම් ගාස්තුව | (291,472,452) | | | (291,472,452) |
| RETRO RI අයවිය යුතු හුවමාරු අලාභය | (3,888,779) | | | (3,888,779) |
| පියවන ලද ඉන්වොයිස හා කෘත අවලංගු කිරීම | 41,810,528 | | | 41,810,528 |
| ආරම්භක ශේෂයේ මඟහැරුනු ඉන්වොයිස RI | 10,980,047 | | | 10,980,047 |
| NNDIS අවලංගු චෙක්පත් | 12,682,341 | | | 12,682,341 |
| චෙක්පත් අවලංගු කිරීම | 2,080,928 | | | 2,080,928 |
| ඇපකර කූපන පොලිය | (8,856,250) | | | (8,856,250) |
| වැටුප් නිවැරදි කිරීම් | (1,037,300) | | | (1,037,300) |
| නිවාඩු හිලව් වැටුප් | (2,764,983) | | | (2,764,983) |
| CN අනුපිටපත් RI අවලංගු කිරීම | (7,458,551) | | | (7,458,551) |
| යුරෝ ඇඩො විනිමය ලැබීම් සංචිතය | (5,082,679) | | | (5,082,679) |
| පෙර වර්ෂ වල වෙනත් ගැලපීම් | (83,955) | | | (83,955) |
| පාර්තෝෂික ඇගයීම මත ආයුගණක (ප්‍රතිලාභ)/අලාභය | | (9,075,505) | | (9,075,505) |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 7,424,644,965 | (466,454,792) | (2,102,126) | 6,956,088,048 |
| වර්ෂය සඳයා ලාභය | 3,114,086,727 | | | 3,114,086,727 |
| පෙර වර්ෂ වල වෙනත් ගැලපීම් | (139,165,533) | | | (139,165,533) |
| ඒකාබද්ධ අරමුදලට යවන ලද මුදල් | (3,267,970,000) | | | (3,267,970,000) |
| ඇපකර මත ක්‍රමක්ෂය වට්ටම් | 11,501,557 | | | 11,501,557 |
| විකිණීම සඳහා වන මූල්‍ය වත්කම් වල ශුද්ධ වෙනස්වීම | | 517,879,752 | | 517,879,752 |
| පාර්තෝෂික ඇගයීම මත ආයුගණක (ප්‍රතිලාභ)/අලාභ | | (574,033) | | (574,033) |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 7,143,097,716 | 50,850,927 | (2,102,126) | 7,191,846,517 |
| කාලසීමාව සඳහා ලාභය | 7,526,099,442 | | | 7,526,099,442 |
| පාර්තෝෂික ඇගයීම මත ආයුගණක | | (7,943,165) | | (7,943,165) |
| විකිණීම සඳහා වන මූල්‍ය වත්කම් වල ශුද්ධ වෙනස්වීම | | 134,541,150 | | 134,541,150 |
| ඒකාබද්ධ අරමුදලට යවන ලද මුදල් | (782,000,000) | | | (782,000,000) |
| | - | | | - |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 13,887,197,157 | 177,448,912 | (2,102,126) | 14,062,543,942 |

පිටු අංක 45 සිට 78 දක්වා පිටු වල සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශනයන්ගේ අත්‍යවශ්‍ය කොටසක් නිර්මාණය කරනු ලබයි. වරහන් තුල ඇති ඉලක්කම් මගින් අඩු කිරීම් දක්වයි.

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2020 දෙසැම්බර් 31න් අවසන් වන වර්ෂය සඳහා

| | | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ** | | | |
| බදු පෙර ලාභය | | 8,865,926,371 | 3,008,486,066 |
| **සඳහා ගැලපීම්:** | | | |
| පොලී ආදායම | | (1,334,565,453) | (1,215,544,996) |
| ක්ෂය කිරීම | | 10,704,723 | 14,354,664 |
| ක්‍රමක්ෂය | | 2,149,221 | 1,092,955 |
| කල්බදු වියදම් | | 17,571,769 | 21,062,606 |
| ශුද්ධ සාධාරණ අගයේ වෙනස්වීම් | | 126,597,985 | 517,305,719 |
| පෙර වර්ෂයේ ගැලපීම් | | - | (139,165,533) |
| ස්ථාවර වත්කම් අපහරණය මත (ලාභ)/අලාභය | | - | 756,279 |
| | | 7,688,384,616 | 2,208,347,759 |
| මෙහෙයුම් වත්කම් වල වෙනස | අ | (262,001,625) | (872,948,944) |
| මෙහෙයුම් වගකීම් වල වෙනස | ආ | (1,559,158,338) | 4,985,210,310 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වල මුදල් ප්‍රවාහ | | 5,867,224,653 | 6,320,609,124 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් මඟින් උපයන ලද ශුද්ධ මුදල් | | 5,867,224,653 | 6,320,609,124 |
| **ආයෝජන ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ** | | | |
| මූල්‍ය ආයෝජනයන්ගේ ශුද්ධ අපහරණ/(අත්පත් කර ගැනීම) | | (6,221,405,247) | (4,770,049,767) |
| පොලී ලැබීම් | | 1,334,565,453 | 1,215,544,996 |
| ඇපකර මත ක්‍රමක්ෂය වට්ටම් | | - | 11,501,557 |
| මෘදු ණය නැවත අය කර ගැනීම | | 1,028,424 | 1,970,028 |
| දේපළ පිරියත සහ උපකරණ අපහරණය | | - | 1,222,888 |
| අස්පර්ශනීය වත්කම් අත්පත් කර ගැනීම | | - | (6,433,851) |
| දේපළ පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම | | (12,433,322) | (27,468,606) |
| ආයෝජන ක්‍රියාකාරකම් මඟින් යොදා ගන්නා ලද ශුද්ධ මුදල් | | (4,898,244,692) | (3,573,712,754) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහ** | | | |
| කල්බදු වියදම් | | (17,571,769) | (21,062,606) |
| ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලද මුදල් | | (782,000,000) | (3,267,970,000) |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්නා ලද ශුද්ධ මුදල් | | (799,571,769) | (3,289,032,606) |
| **මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ අඩුවීම/(වැඩිවීම)** | ඇ | 169,408,194 | (542,136,236) |
| වර්ෂය ආරම්භයේදී ශුද්ධ මුදල් සහ මුදල් සමාන දෑ | | 600,106,740 | 1,142,242,978 |
| වර්ෂය අවසානයේ දී ශුද්ධ මුදල් සහ මුදල් සමාන දෑ | | 769,514,934 | 600,106,740 |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා සටහන්** | | | |
| **අ. මෙහෙයුම් වත්කම් වල වෙනස** | | | |
| විලම්බිත කොමිස් වල (වැඩිවීම)/අඩුවීම | | 45,284,164 | (138,079,613) |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වාරික වල (වැඩිවීම)/අඩුවීම | | 497,478,268 | (130,851,686) |
| ලැබිය යුතු වාරික වල (වැඩිවීම)/අඩුවීම | | (838,666,693) | (461,990,747) |
| මූල්‍ය නොවන වත්කම් වල (වැඩිවීම)/අඩුවීම | | (2,236,806) | (11,375,748) |
| බදු දෙනලද වත්කම් භාවිතයට බදුකරුගේ අයිතියේ(වැඩිවීම)/අඩුවීම | | 36,139,441 | (130,651,150) |
| | | (262,001,625) | (872,948,944) |
| **ආ. මෙහෙයුම් වගකීම් වල වෙනස** | | | |
| රක්ෂණ ගිවිසුම් වගකීම් වල (වැඩිවීම)/අඩුවීම | | (1,978,288,607) | 4,272,673,969 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් වල (වැඩිවීම)/අඩුවීම | | 15,928,153 | 5,682,422 |
| වෙනත් වගකීම් වල (වැඩිවීම)/අඩුවීම | | 431,740,347 | 565,052,074 |
| බදු ණයකරුවන්ගේ (වැඩිවීම)/අඩුවීම | | (28,538,231) | 141,801,845 |
| | | (1,559,158,338) | 4,985,210,310 |
| **ඇ. මුදල් සහ මුදල් සමාන දෑ වල (වැඩිවීම)/අඩුවීම** | | | |
| වර්ෂය අවසානයේ දී ශුද්ධ මුදල් සහ මුදල් සමාන දෑ | | 769,514,934 | 600,106,740 |
| අඩුකලා: වර්ෂය ආරම්භයේ දී ශුද්ධ මුදල් සහ මුදල් සමාන දෑ | | 600,106,740 | 1,142,242,978 |
| ශුද්ධ මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ (වැඩිවීම)/අඩුවීම | | 169,408,194 | (542,136,238) |

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන්

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

### 1. ආයතනික තොරතුරු

### 1.1 වාර්තාකිරීමේ ඒකකය

ජාතික රක්ෂණ භාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය ("මණ්ඩලය") 2007 අංක 28 දරන පනතින් සංශෝධිත "2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත" මගින් සංස්ථාපනය කර ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇත. මණ්ඩලයේ ලියාපදිංචි කාර්යාලය අංක 95, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 ස්ථානයේ පිහිටුවා ඇති අතර ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය මෙම ලිපිනයේ පිහිටුවා තිබේ.

### 1.2 මව් ආයතනය සහ මූලාරම්භක ආයතනය

මණ්ඩලයේ මව් සහ මූලාරම්භක ආයතනය ශ්‍රී ලංකා රජයයි.

### 1.3 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ජීවිත-නොවන (සාමාන්‍ය) රක්ෂණ කටයුතු සහ ප්‍රතිරක්ෂණ කටයුතු සිදු කිරීමයි.

තවද මණ්ඩලය මගිනa SRCC ) ඔ අරමුදල පවත්වාගෙන යයි, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බැංකු, මූල්‍ය ආයතන සහ රක්ෂණ සමාගම් වෙතින් බදුවලින් පසු ලාභයෙන් 1%ක බෝග බද්දක් රැස්කරගෙන බෝග බද්දෙන් කෘෂිකාර්මික රක්ෂණ යෝජනාක්‍රම පිරිනමනු ලබයි. සමාලෝචනයට ලක්වන වසර ඇතුළත මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයෙහි සැලකිය යුතු අන්දමේ වෙනස්කම් සිදු නොවුණි.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.

### 1.5 සේවකයන් සංඛ්‍යාව

2020 දෙසැම්බර් 31 වන විට මණ්ඩලයේ කාර්ය මණ්ඩලය 365ක් විය (2019-306).

### 1.6 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම

2020 දෙසැම්බර් 31න් අවසන් වන වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුමත වුනු අතර 2022 සැප්තැම්බර් 26 දින අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව හා අනුකූලව 2022 සැප්තැම්බර් 26 දින නිකුත් කිරීමට අවසර ලබා ඇත.

සකස්කිරීමේ පදනම සහ සැලකිය යුතු අන්දමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1.7 අනුකූල වීමේ ප්‍රකාශනය

මූල්‍ය ප්‍රකාශන, වෙනත් යම් ආකාරයකින් ප්‍රකාශ කර ඇත්නම් මිස, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය (CA-ශ්‍රී ලංකා) මගින් ප්‍රකාශයට පත් කර ඇති ශ්‍රී ලංකාවේ ගිණුම්කරණ ප්‍රමිතීන් සමඟ අනුකූල වන පරිදි සහ 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්ත නියාමනය කිරීමේ පනත හා අනුකූල වන පරිදි සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවල පහත කොටස් අන්තර්ගත වේ:

- කාර්තුව අවසානයේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු දක්වන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, (පිටුව 02).
- සමාලෝචනයට ලක්වන වසර සඳහා මණ්ඩලයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ තොරතුරු දක්වන විස්තීර්ණ ආදායම පිළිබඳ ප්‍රකාශයක්. (පිටුව 01)
- කොටස්වල සියළුම වෙනස්කම් පෙන්නුම් කරන කොටස්වල වෙනස්කම් පිළිබඳ ප්‍රකාශයක්. (පිටුව 03)
- පරිශීලකයන් හට මණ්ඩලයට මුදල් සහ මුදල් හා සමාන දේ උත්පාදනය කිරීම සඳහා ඇති හැකියාව සහ එම මූල්‍ය සංසරණයන් භාවිතයට ගැනීම පිළිබඳ තොරතුරු සපයන ලබන මූල්‍ය සංසරණය පිළිබඳ ප්‍රකාශයක් (පිටුව 04) සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (පිටුව 05 සිට 44).

### 2.2 මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශනයන්ගේ පහත දැක්වෙන භෞතික අයිතමයන් හැර ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශනයන් සකසා ඇත.

| අයිතමය | මිණුම් පදනම | සටහන් අංකය |
|---|---|---|
| ණය සහ ලැබීම් මූල්‍ය වත්කම් | සාධාරණ අගයකින් | 10.1 |
| මූල්‍ය වත්කම් අළෙවිය සඳහා පැවැත්ම | සාධාරණ අගයකින් | 10.2 |
| නිර්වචනය කර ඇති ප්‍රතිලාභ බැඳීම් | නිර්වචනය කර ඇති ප්‍රතිලාභ බැඳීම්වල වත්මන් වටිනාකමෙන් සත්‍ය වටිනාකම් යොදා පිළිගෙන ඇත. | 20 |
| ඔප්පු හිමියන්ගේ වගකීම් | IRCSL මගින් නිකුත් කර ඇති සත්‍ය මාර්ගෝපදේශ මත පදනම් වූ සත්‍ය නිර්ණය වටිනාකම් | 19.1 |
| සිදුව ඇති නමුත් වාර්තා කර නොමැති/ සිදුව ඇති නමුත් ප්‍රමාණවත් පරිදි වාර්තා කර නොමැති | සත්‍ය ක්‍රමවේද මත පදනම් වූ සත්‍ය නිර්ණය වටිනාකම් | 19.3 |

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

### 2.3 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ සාපේක්ෂ ද්‍රවශීලීතාවය පෙන්නුම් කරන මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය පිළිවෙළින් පුළුල් ලෙස ඉදිරිපත් කරයි. මූල්‍ය ප්‍රකාශනවලට බලපෑම් කරන උද්ධමන සාධක සඳහා සීරුමාරුකිරීම් සිදු කර නොමැත.

මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කර ඇති අතර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි ශුද්ධ අගය වාර්තා කර ඇත්තේ හඳුනාගත් අගයන් හිලව් කිරීම සඳහා නෛතික වශයෙන් බලගැන්විය හැකි අයිතියක් පවතින සහ ශුද්ධ පදනම මත බේරුම් කිරීමට අපේක්ෂාවක් සහිත හෝ වත්කම මුදල් බවට පත් කර වගකීම බේරුම්කිරීම ඒ අවස්ථාවේදිම කිරීමට අපේක්ෂිත අවස්ථාවල පමණි.

### 2.4 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

මණ්ඩලයේ ක්‍රියාකාරී මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල් (LKR) වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත. වෙනයම් ආකාරයකින් සඳහන් කර ඇති අවස්ථාවලදී හැර, ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියළු මූල්‍ය තොරතුරු ආසන්නතම රුපියලට වටයා ඇත.

### 2.5 ද්‍රව්‍යමයභාවය සහ එකතු කිරීම

සමාන අයිතමවල එක් එක් ද්‍රව්‍යමය පංතිය වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත. නොවැදගත් වන්නේ නම් මිස සමාන නොවන ස්වභාවයේ හෝ ක්‍රියාවල අයිතම වෙන් වෙන්ව ඉදිරිපත් කර ඇත.

### 2.6 වාර්තා කිරීමේ කාලසීමාව

වාර්තා කිරීමේ කාලසීමාව 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලසීමාවයි.

අදාළ අවස්ථාවලදී, ගිණුම්කරණ ප්‍රතිපත්ති පසුව පැමිණෙන සටහන්වලින් පැහැදිලි කර ඇත.

### 2.7 සැලකිය යුතු අන්දමේ ගිණුම්කරණ තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්/ SLFRS හා අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී කළමනාකාරීත්වය ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමට සහ වාර්තාගත වත්කම්, වගකීම් අගයයන්වලට බලපෑම් කරන තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කළ යුතු වේ. සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක.

ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පන කටයුතු සිදු කරන අතරතුරෙහි සමාලෝචනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවලට ප්‍රතිශෝධන හඳුනා ගනු ලබන්නේ ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කරනු ලබන කාලසීමාවේදී සහ බලපාන යම් ඉදිරි කාලසීමාවන් වලදී ය.

අවිනිශ්චිතභාවයක් සම්බන්ධ වන්නා වූ සැලකිය යුතු මට්ටමේ මූලික ගිණුම්කරණ තීරණ, ඇස්තමේන්තු සහ උපකල්පන පහතින් විස්තර කර ඇත, එවන් වත්කම් සහ වගකීම්වල ඉදිරියට යනු ලබන අගයයන් අදාළ සටහන්වල සටහන් කර ඇත.

### 2.7.1 අඛණ්ඩභාවය

අඛණ්ඩව ක්‍රියාත්මක වීමට මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳ තක්සේරුවක් කළමනාකාරීත්වය මගින් සිදු කර ඇති අතර ඉදිරි අනාගතය සඳහා ව්‍යාපාර කටයුතු අඛණ්ඩව සිදු කිරීමට මණ්ඩලයට සම්පත් ඇති බවට තෘප්තිමත්ය. තවද, අඛණ්ඩව ක්‍රියාත්මක වීම සඳහා මණ්ඩලයට ඇති හැකියාව පිළිබඳ සැලකිය යුතු මට්ටමේ සැකයක් පෙන්නුම් කළ හැකි යම් ද්‍රව්‍යමය අවිනිශ්චිතතාවයන් පිළිබඳව කළමනාකාරීත්වයට දැනුවත්භාවයක් නොමැත. එහෙයින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩභාවය පදනම් කරගෙන අඛණ්ඩවම සකස් කෙරේ.

### 2.7.2 මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම

මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම්වල සාධාරණ වටිනාකම් නිර්ණය කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වාර්තාකර ඇති අතර එහිදී ගණිතමය තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම ඇතුළත් අගය නිර්ණය කිරීමේ තාක්ෂණික ක්‍රම ගණනාවක් භාවිතයෙන් නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ මිල ගණන් නිර්ණය කර නොමැත. මෙම ආදර්ශ වෙත ආදාන හැකි අවස්ථාවලදී නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ දත්ත වෙතින් පැන නගින නමුත් මෙය නොපවතී නම්, තීරණය ඔවුන්ගේ සාධාරණ වටිනාකම් ස්ථාපිත කළ යුතු වේ.

### 2.7.3 හානිය තක්සේරු කිරීම

අවස්ථාවන්ගේ සිදුවීම් හෝ වෙනස්කම් එසේ කිරීමේ අවශ්‍යතාවය දක්වන්නේ නම්, සෑම වාර්තා කරන දිනයකම හෝ ඊට වැඩි වාර ගනනක්, වත්කමක් හෝ මුදල්-උපයන ඒකකයක් සඳහා යම් හානියක දර්ශකයක් තිබේ ද යන්න මණ්ඩලය තක්සේරු කරනු ලැබේ. මේ සඳහා, එවැනි තනි වත්කමක හෝ මුදල්-උපයන ඒකකයක 'භාවිත වටිනාකම' ඇස්තමේන්තු කිරීම අවශ්‍ය වේ. භාවිත වටිනාකම තක්සේරු කිරීම සඳහා, කළමනාකරණය විසින්, වත්කමෙන් හෝ මුදල්-උපයන ඒකකයෙන් තක්සේරු කරන ලද අනාගත මූල්‍ය ප්‍රවාහ තක්සේරු කිරීම සහ අදාල මුදල් ප්‍රවාහ වල වටිනාකම ගනනය කිරීම සඳහා යෝග්‍ය අඩු කිරීමේ ප්‍රතිශතයක් තෝරා ගැනීමට ද සිදු කිරීම අවශ්‍ය වේ. මෙම ඇගයීමෙන්, අපේක්ෂිත අනාගත මූල්‍ය ප්‍රවාහ සහ අඩු කිරීමේ ප්‍රතිශත පිළිබඳව මණ්ඩලය විසින් ඇස්තමේන්තුවක් සිදු කිරීම අවශ්‍ය වේ. එබැවින්, ඒවා අවිනිශ්චිතතාවය ලක්විය හැකිය.

### 2.7.4 වගකීම් සහ අනිශ්චිත තත්ත්වයන් සඳහා ප්‍රතිපාදන

මණ්ඩලය තම ව්‍යාපාරික කටයුතු කරගෙන යන අතරතුරේදී තමන්ට එරෙහි නෛතික හිමිකම්පෑම් ලබයි. ප්‍රතිපාදන සකස් කිරීමේදී යම් හිමිකම්පෑමක් සාර්ථක වීමේ හැකියාව සම්බන්ධයෙන් කළමනාකාරීත්වය තීරණ ගෙන ඇත. නෛතික හිමිකම්පෑම අවසන් වීමේ කාලය මෙන්ම ආර්ථික ප්‍රතිලාභවල විය හැකි පිටතට ගලා යාමේ අගය ද අවිනිශ්චිතය. කාලය සහ වියදම අවසානයේ රඳා පවතින්නේ අදාළ අධිකරණ බල සීමාවේ නියමිත ක්‍රියාවලිය මතයි.

සමාලෝචනයට ලක්වන වසර තුළ, නඩු කීමේ ප්‍රතිපාදන සඳහා මුළු නෛතික හිමිකම් පෑම් 15%කට ප්‍රතිපාදන සැපයීමට මණ්ඩලය තීරණය කර ඇත.

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

**2.8 සැලකිය යුතු මට්ටමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය**

**2.8.1 විදේශ මුදල් පරිවර්තනය**

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන මණ්ඩලයේ ක්‍රියාකාරී මුදල් වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත. විදේශ මුදල්වලින් සිදු කරනු ලබන ගණුදෙණු කිරීම් එම ගණුදෙණු කිරීම සිදු කරන දිනයේදී පැවති ක්‍රියාකාරී මුදල් අනුපාතය මත මූලිකව වාර්තා කර ඇත.

විදේශ මුදල්වලින් නම් කර ඇති මූල්‍යමය වත්කම් සහ වගකීම් වාර්තා කරන දිනයේදී පැවති හුවමාරු මුදල් අනුපාතය මත නැවත පරිවර්තනය කර ඇත. සියළුම වෙනස්කම් ලාභ හෝ පාඩු ප්‍රකාශයට සැලකිල්ලට ගෙන ඇත.

**2.8.2 මූල්‍ය-නොවන වත්කම් හානිය**

මණ්ඩලය විසින්, යම් වත්කම අගය අඩු වන බවට වන දර්ශකයක් තිබේද යන්න වාර්තා කරනු ලබන සෑම දිනකම තක්සේරු කරනු ලබයි. එවැනි දර්ශකයක් පවතී නම් හෝ යම් වත්කමක් සඳහා එවැනි වාර්ෂික හානිකරන පරීක්ෂණයක් සිදු කිරීම අවශ්‍ය විට, මණ්ඩලය විසින් එයින් නැවත අය කර ගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. යම් වත්කමක නැවත අය කර ගත හැකි ප්‍රමාණය වනුයේ මුදල් උත්පාදන ඒකකයේ සාධාරණ අගයෙන් විකිණීමට දරනු ලබන වියදම සහ එහි පරිහරණයට ඇති වටිනාකම අඩු කළ පසු ඉතිරි අගය වේ. අනෙක් වත්කම් හෝ වත්කම් කාණ්ඩයන්ගෙන් වැඩි වශයෙන් ස්වාධීනව කිසියම් වත්කමක් මුදල් ප්‍රවාහ ඉපයීමක් නොකරයි නම් එවිට දී වත්කමෙහි අය කර ගත හැකි වටිනාකම වෙන් වශයෙන් හඳුනා ගැනීමක් කරයි. වත්කමක ඉදිරියට ගෙන ආ අගය හෝ මුදල් උත්පාදන ඒකක වටිනාකම එහි අයකරගත හැකි වටිනාකම ඉක්මවයි නම් එම වත්කමේ අගය අඩුවීමක් ඇති බවට සලකන අතර එහි අය කර ගත හැකි වටිනාකමට අඩු කර සටහන් කරනු ලබයි. වත්කමක පරිහරණ වටිනාකම තක්සේරු කිරීමේ දී, මුදලේ කාලීන අගයෙහි වර්තමාන වෙළඳපොල වටිනාකම තක්සේරු කිරීම් සහ අදාල වත්කමට ඇති අවදානම් දක්වන බදු-පෙර වට්ටමක් යොදා ගනිමින් ඒවායේ වර්තමාන වටිනාකමට, ඇස්තමේන්තු කරන ලද අනාගත මුදල් ප්‍රවාහ සඳහා අඩු කිරීම් කරනු ලැබේ. විකිණීම සඳහා වන පිරිවැය අඩු කර සාධාරණ අගය සොයා ගැනීමේ දී, ලබා ගත හැකි නම් වර්තමාන වෙළඳපොල ගනුදෙනු සැලකිල්ලට ගනු ලැබේ. එවැනි ගනුදෙනු හඳුනාගත නොහැකි නම්, යෝග්‍ය තක්සේරු ආකෘතියක් යොදා ගනු ලැබේ. මෙහෙයුම් අඛණ්ඩව සිදු කිරීමේ හානිකරණ අලාභයන්, ආදායම් ප්‍රකාශන වල හානිකරණය කරන ලද වත්කමේ කාර්ය හා අනුකූල වන වියදම් කාණ්ඩයෙහි ලා හඳුනාගනු ලැබේ.

**2.8.3 මූල්‍යමය වත්කම් හානිකරණය**

මූල්‍යමය වත්කමක හෝ මූල්‍යමය වත්කම් සමූහයක අගය අඩු වී ඇත්දැයි, වාර්තා කරන සෑම දිනකදීම මණ්ඩලය විසින් තක්සේරු කරනු ලබයි. ලාභ හෝ පාඩු අඩු වීම තුලින්, සාධාරණ අගයට මූල්‍යමය වත්කමක හෝ මූල්‍යමය වත්කම් සමූහයක සාධාරණ අගයට පවත්වාගෙන නොයන බවට විෂය මූලික සාක්ෂි තිබේ ද යන්න සෑම වාර්තා කරන දිනකම මණ්ඩලය විසින් තක්සේරු කරනු ලබයි.

වත්කමක මූලික හඳුනාගැනීමෙන් පසු එක් සිදු වීමක් හෝ සිදුවීම් කිහිපයක් සිදු වීමේ ('අලාභ සිදුවීමක්') සහ විශ්වසනීය ලෙස තක්සේරු කළ හැකි මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ මත අලාභ සිදු වීමක (හෝ සිදුවීම්) වල බලපෑමක් පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස, විෂය මූලික සාක්ෂි සහිත හානිකරණයක් තිබේ නම්, සහ තිබේ නම් පමණක්, මූල්‍යමය වත්කමක් හෝ මූල්‍යමය වත්කම් සමූහයක් හානි වී ඇති බවට සලකනු ලැබේ.

- ක්‍රමක්ෂය පිරිවැය යටතේ ගැනෙන මූල්‍යමය වත්කම් හානිකරණය

ක්‍රමක්ෂය පිරිවැය හේතුවෙන් මූල්‍යමය වත්කම් වලට හානිකරණ අලාභයක් සිදු වන බව විෂය මූලික සාක්ෂි තිබේ නම්, වත්කමේ ධාරණ මුදල සහ මූල්‍යමය වත්කමේ මුල් සඵල පොලී අනුපාතිකය අඩු කරන ලද ඇස්තමේන්තු කරන ලද අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි වර්තමාන අගය (සිදුවිය හැකි අනාගත ණය පාඩු හැර) අතර වෙනස ලෙස හානිකරණ අලාභය මනිනු ලැබේ. වත්කමේ ධාරණ මුදල අඩු කර, අලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වාර්තා කරනු ලැබේ.

එක් එක් වශයෙන් වැදගත් වන එක් එක් මූල්‍ය වත්කම් සඳහා සහ එක් එක් වශයෙන් වැදගත් නොවන එක් එක් හෝ සාමූහික වත්කම් සඳහා හානිකරණයක් පවතින බවට විෂය මූලික සාක්ෂි තිබේද යන්න පළමුව මණ්ඩලය විසින් තක්සේරු කරනු ලබයි. එක් එක් වශයෙන් තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් හානිකරණය පිළිබඳව විෂය මූලික සාක්ෂි නොමැති බවට හඳුනාගෙන ඇත්නම්, වැදගත් වුව ද නොවුව ද, සමාන ණය අවදානම් ලක්ෂණ සහිත මූල්‍ය වත්කම් සමූහයකට සහ හානිකරණය සඳහා සාමූහිකව තක්සේරු කරන ලද මූල්‍ය වත්කම් සමූහයකට වත්කම ඇතුලත් කරනු ලැබේ. හානිකරණ සම්බන්ධයෙන් එක් එක් වශයෙන් තක්සේරු කරන ලද සහ හානිකරණ අලාභ සිදු වන බවට හෝ සිදුවෙමින් පවතින බවට හඳුනාගෙන ඇති වත්කම්, හානිකරණය පිළිබඳව සාමූහික තක්සේරුවකට ඇතුලත් කරනු නොලැබේ. වාර්තා කරනු ලබන සෑම දිනකම හානිකරණ තක්සේරුව සිදු කරනු ලබයි.

කාල සීමාවක, හානිකරණ අලාභ මුදල අඩු වේ නම් සහ එම අඩු වීම හානිකරණය හඳුනාගැනීමෙන් පසු සිදු වන සිදුවීමක් ලෙස විෂය මූලිකව සැලකිය හැකි නම්, පෙරාතුව හඳුනාගන්නා ලද හානිකරණ අලාභය ප්‍රතිවර්තනය කරනු ලැබේ.

ප්‍රතිවර්තනය සිදු කරන දිනයට, වත්කමේ ධාරණ වටිනාකම එහි ක්‍රමක්ෂය පිරිවැය ඉක්ම නොවන සීමාව දක්වා, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි, හානිකරණ අලාභයක ඕනෑම පසු ප්‍රතිවර්තනය කිරීමක් හඳුනා ගනු ලැබේ.

- විකිණීම සඳහා වන මූල්‍ය ආයෝජනයන් හානිකරණය

විකිණීම සඳහා වන වත්කමක් හානිකරණය වේ නම්, එහි පිරිවැය (යම් මූලික නැවත ගෙවීමක හෝ ක්‍රමක්ෂය කිරීමක ශුද්ධ අගය) සහ වෙනත් විස්තීර්ණ ආදායමකින් පූර්ව වශයෙන් හඳුනා ගන්නා ලද යම් හානිකරණ අලාභයක් අඩු කරන ලද එහි වර්තමාන සාධාරණ අගය අතර වෙනසෙහි වටිනාකම, හිමිකමේ සිට විස්තීර්ණ ආදායම් ප්‍රකාශය වෙත මාරු කරනු ලැබේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි, විකිණීම සඳහා වන ලෙස වර්ගීකරණය කරන ලද හිමිකම් උපකරණ සම්බන්ධයෙන් ප්‍රතිවර්තනයන් හඳුනාගනු නොලැබේ.

විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහි හානිකරණ අලාභයන් හඳුනාගැනීමෙන් පසු සිදු වන සිදුවීමක් හා විෂය මූලිකව සම්බන්ධ විය හැකි උපකරණයන් ගේ සාධාරණ අගය වැඩි වේ නම්, විකිණීම සඳහා වන ලෙස වර්ගීකරණය කර ඇති ණය උපකරණ සම්බන්ධ හානිකරණ අලාභයන්ගේ ප්‍රතිවර්තනයන්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුලින් ප්‍රතිවර්තනය කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

- පිරිවැය යටතේ ගැනෙන මූල්‍ය වත්කම් හානිකරණය

එහි සාධාරණ අගය විශ්වසනීය ලෙස මැනිය නොහැකි නිසා සාධාරණ අගය යටතේ නොගැනෙන, සඳහන් නොකරන ලද හිමිකාරිත්ව උපකරණයක් මත හෝ සඳහන් නොකරන ලද එවැනි හිමිකාරිත්ව උපකරණයක් හා සම්බන්ධිත සහ එවැනි උපකරණයක් බාර දීම මඟින් පියවිය යුතු ව්‍යුත්පන්න වත්කමක් මත හානිකරණ අලාභය සිදු වී ඇති බවට වන විෂයමූලික සාක්ෂියක් තිබේ නම්, මූල්‍යමය වත්කමෙහි ධාරණ මුදල සහ සමාන මූල්‍ය වත්කමක් සඳහා වර්තමාන වෙළඳපොළ ප්‍රතිලාභ අනුපාතයට අඩු කරන ලද, ඇස්තමේන්තු කරන ලද අනාගත මූල්‍ය ප්‍රවාහයන්හි වර්තමාන අගය අතර වෙනස ලෙස, හානිකරණ අලාභ මුදල ගනනය කරනු ලැබේ.

### 2.8.4 ප්‍රතිපාදන සහ අවිනිශ්චිතතාවයන්

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස, මණ්ඩලයට වර්තමාන බැඳීමක් (නෛතික හෝ අර්ථසාධනීය) ඇති විට පොදු ප්‍රතිපාදන හඳුනාගනු ලබන අතර, බැඳීම් පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ සහිත සම්පත් පිටතට ගලායෑමක් අවශ්‍ය වනු ඇති අතර, බැඳීමේ ප්‍රමාණය පිළිබඳව විශ්වසනීය ඇස්තමේන්තුවක් සැකසිය හැකිය. යම් තරමකට හෝ සියලුම ප්‍රතිපාදන ප්‍රතිපූර්ණය කිරීමට මණ්ඩලය අපේක්ෂා කරන අවස්ථා වල දී, ප්‍රතිපූර්ණය වෙනම වත්කමක් ලෙස හඳුනාගනු ලබන නමුත්, එසේ සිදු වන්නේ, ප්‍රතිපූර්ණය අත්‍යවශ්‍යයෙන්ම නිශ්චිත අවස්ථා වල පමණි. යම් ප්‍රතිපාදනයකට සම්බන්ධ වියදමක්, ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි, යම් ප්‍රතිපූර්ණයක ශුද්ධ අගයෙහි ඉදිරිපත් කරනු ලැබේ.

මුදලේ කාලීන අගයේ බලපෑම භෞතික වන්නේ නම්, වගකීම සඳහා නිශ්චිත වන අවදානම් යෝග්‍ය වන බව විදහා දක්වන අවස්ථාවේ දී වර්තමාන බදු-පසු ප්‍රතිශතයක් භාවිතයෙන් ප්‍රතිපාදන අඩු කරනු ලැබේ. අඩු කිරීම යොදා ගන්නා අවස්ථා වල, කාලය ගත වීම හේතුවෙන් ප්‍රතිපාදනයේ වැඩි වීම මූල්‍ය පිරිවැය ලෙස හඳුනාගනු ලැබේ.

මණ්ඩලයේ අභිමතය ප්‍රකාරව, වර්තාමනයේ ආයතනයට එරෙහි නඩුකරණයන්, සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වල දී, වාර්තා කරන ලද මූල්‍ය ඵලයන් හෝ මණ්ඩලයේ අනාගත මෙහෙයුම් මත සැලකිය යුතු බලපෑමක් නොකරනු ඇත.

### 2.8.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති :ඛණී* 7 මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්ට අනුකූලව මුදල් ප්‍රවාහ සැකසීමේ සෘජු නොවන ක්‍රමය භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකසා ඇත. ලද පොලී ආයෝජන මුදල් ප්‍රවාහ ලෙස වර්ගීකරණය කර ඇත. මුදල් සහ මුදල් හා සමාන දෑ වලට, මුදල් වල දන්නා ප්‍රමාණ වලට පරිවර්තනය කළ හැකි සහ වටිනාකම වෙනස්වීම් වීමේ සුළු අවදානමකට ලක් විය හැකි හැකියාව සහිත කෙටි කාලීන, ඉහළ ද්‍රවශීලී ආයෝජනයන් ඇතුලත් වේ. මුදල් සහ මුදල් හා සමාන දෑ සඳහා අතැති මුදල් සහ බැංකු වල ඇති ශේෂය ද ඇතුලත් වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යන් සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ, බැංකු අයිරා වල ශුද්ධ අගයක් ලෙස ඉදිරිපත් කරනු ලැබේ.

### 2.8.6 මෙතෙක් යොදාගෙන නොමැති නව ප්‍රමිතීන් සහ අර්ථකථනයන්

මෙම මූල්‍ය ප්‍රකාශයන් සැකසීමේ දී යොදාගෙන නොමැති සහ අනාගත ක්‍රියාත්මක දිනයක් සහිත, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මඟින් පහත දැක්වෙන ශ්‍රීලංමූවාප්‍ර නිකුත් කර ඇත. මණ්ඩලය විසින් යොදාගෙන ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මත එම ශ්‍රීලංමූවාප්‍ර බලපෑමක් ඇති අතර, අනාගත මූල්‍ය ප්‍රකාශයන් මත ද බලපෑ හැකිය.

- ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ශ්‍රීලංමූවාප්‍ර) - 15 පාර්භෝගිකයන් සමඟ ගිවිසුම් මඟින් ලැබෙන ආදායම ශ්‍රීලංමූවාප්‍ර - 15 පාර්භෝගිකයන් සමඟ ගිවිසුම් තුලින් පැන නඟින ආදායම් ගිණුම්කරණය සඳහා පියවර පහක ආකෘතියක් ස්ථාපනය කරනු ලබයි. (ශ්‍රීලංමූවාප්‍ර) 15 යටතේ, පාර්භෝගිකයාට භාණ්ඩ සහ සේවා ලබා දීම සඳහා හුවමාරුවක් වීමේ හිමිකම ලැබීමට අපේක්ෂා කරනු ලබන ආයතනයක් පිළිබඳව සලකාබැලීම විදහා දක්වන ප්‍රමාණයකට ආදායම හඳුනාගනු ලබයි. එමගින්, ශ්‍රීලංගිප්‍ර 18 - ආදායම, ශ්‍රීලංගිප්‍ර 11 - ඉදිකිරීම් ගිවිසුම් සහ IFRIC 13 - පාර්භෝගික ලැදියා වැඩසටහන් ඇතුළු පවතින ආදායම් හඳුනාගැනීමේ මාර්ගෝපදේශනය ප්‍රතිස්ථාපනය කරනු ලබයි.

2018 ජනවාරි 1 සඳහා, පූර්ණ වශයෙන් අතීතයට බලපාන යෙදවුමක් හෝ තරමකට වෙනස් කරන ලද අතීතයට බලපාන යෙදවුමක් අවශ්‍ය වේ. ශ්‍රීලංමූවාප 4 - විෂය පථය තුල, ශ්‍රීලංමූවාප 15 හි විෂය පථයට (5(බී) ඡේදය) අනුව රක්ෂණ ගිවිසුම් විෂය පථය පිළිබඳව දක්වා ඇත. මණ්ඩලය දැනට, වෙනත් ආදායම් ගිවිසුම් වල බලපෑම අගයමින් පවතී.

- ශ්‍රීලංමූවාප්‍ර 9 – මූල්‍ය උපකරණ ශ්‍රීලංමූවාප්‍ර 9 - මූල්‍ය උපකරණ මඟින් LKAS 39 මූල්‍ය උපකරණ ප්‍රතිස්ථාපනය වනු ඇත: 2018 ජනවාරි 1 දින හෝ ඊට පෙර වාර්ෂික කාල පරාසයන් සඳහා වේලාසන යොදාගෙන හඳුනාගැනීම සහ මැනීම සඳහා අවසර දෙන ලදී. 2017 වර්ෂයේ දී, මණ්ඩලය තුල ශ්‍රීලංමූවාප්‍ර 9 ක්‍රියාත්මක කිරීම සඳහා කණ්ඩායමක් පත් කරන ලදී.

මණ්ඩලය, ශ්‍රීලංමූවාප්‍ර 9 පිළිබඳව විනිශ්චය කිරීමේ අදියර (මූලික බලපෑම තක්සේරු කිරීමේ අභ්‍යාසය) සහ ශ්‍රීලංමූවාප්‍ර 9 පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ අදියර (විසඳුම් වර්ධනය) ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රීලංමූවාප්‍ර 9 ක්‍රියාත්මක විය යුත්තේ කෙසේද යන්න පිළිබඳව, මණ්ඩලය විසින් සැලකිය යුතු විශ්ලේෂණයක් සිදු කර ඇති අතර, තාවකාලික ගිණුම්කරණ ප්‍රතිපත්ති තීරණයන් ක්‍රියාත්මක කර ඇත.

වර්ගීකරණ සහ මිනුම්කරණ දෘෂ්ටිකෝණයකින් මිනුම් වර්ගීකරණය කිරීමේ නව ප්‍රමිතිය සඳහා, වත්කම් කළමනාකරණය සඳහා ව්‍යාපාරයේ ව්‍යාපාර ආකෘතියේ සහ ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ මුහුණුවරයන්ගේ එකතුවක් මත පදනම් ව තක්සේරු වන හිමිකාරිත්ව උපකරණ සහ ව්‍යුත්පන්නයන් හැර සියලු මූල්‍ය වත්කම් අවශ්‍ය වේ.

ආකෘති තක්සේරුව - මණ්ඩලය, එහි අරමුණු ඉෂ්ට කර ගැනීම සඳහා මූල්‍ය වත්කම් කළමනාකරණය කර ගන්නේ කෙසේද යන්න වඩාත් හොඳින් නිරූපණය වන මට්ටමට එහි ව්‍යාපෘති ආකෘතිය පවතින බව නිර්ණය කරනු ලබයි. මණ්ඩලයේ ව්‍යාපාරික ආකෘතිය, උපකරණයක් පදනම් කර ගනිමින් තක්සේරු කිරීම සිදු නොකරන නමුත්, ඉහළ මට්ටමක සමූහ කළඹ සහ පහත දැක්වෙන ආකාරයේ වැනි නිරීක්ෂණය කළ හැකි සාධක මත තක්සේරු කරනු ලබයි:

- ව්‍යාපාරික ආකෘතිය තුල, මූල්‍ය වත්කම් සහ ව්‍යාපාරික ආකෘතියේ ක්‍රියාකාරීත්වය රඳා පැවතියේ කෙසේ ද යන්න ඇගයීමට ලක් කර, ප්‍රධාන කළමනාකාර පිරිස් වෙත වාර්තා කරන ලදී.

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

- ව්‍යාපෘති ආකෘතියෙහි ක්‍රියාකාරීත්වයට බලපාන අවදානම (සහ ව්‍යාපෘති ආකෘතිය තුළ මූල්‍ය වත්කම් රැඳවීම) සහ විශේෂයෙන්ම, එම අවදානම් කළමනාකරණය ආකාරය.
- විකුණුම් වල අපේක්ෂිත වාර ගනන, අගය සහ කාලය ද, මණ්ඩලයේ තක්සේරුව සඳහා වන වැදගත් අංශයන් වේ.

ව්‍යාපාරික ආකෘති තක්සේරුව, 'නරකම අවස්ථාව' හෝ 'ආතති අවස්ථාව' සැලකිල්ලට නොගෙන සාධාරණ ලෙස අපේක්ෂිත තත්වයන් මත ව්‍යාපාරික ආකෘති තක්සේරුව පදනම් වේ. මණ්ඩලයේ මුල් අපේක්ෂාවෙන් වෙනස් වන ආකාරයකින්, මූලික හඳුනාගැනීමෙන් පසු මුදල් ප්‍රවාහයන් අවබෝධ කර ගනු ලැබේ නම්, මණ්ඩලය එම ව්‍යාපාරික ආකෘතියේ රඳවා ඇති ඉතිරි මූල්‍ය වත්කම් වර්ගීකරණය වෙනස් නොකරන නමුත්, අලුතින් ආරම්භ ලද හෝ අලුතින් මිලදී ගන්නා ලද මූල්‍ය වත්කම් තක්සේරු කිරීමේ දී, එවැනි තොරතුරු අන්තර්ගත කරනු ලැබේ.

වර්ගීකරණ ක්‍රියාවලියේ දෙවන පරීක්ෂාව ලෙස ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලාක්ෂණික පරීක්ෂාව, හුදු මූලික සහ පොලී ගෙවීමේ (SPPI) නිර්ණායකය ඒවා විසින් සපුරාලන්නේ ද යන්න හඳුනා ගැනීම සඳහා මූල්‍ය වත්කම් පිළිබඳ ගිවිසුම්ගත කොන්දේසි මණ්ඩලය මඟින් තක්සේරු කරනු ලබයි.

මෙම පරීක්ෂාවේ කාර්ය සඳහා 'මූලධර්මය' නිර්වචනය කරනුයේ, මූලික හඳුනාගැනීමේ දී මූල්‍ය වත්කමේ සාධාරණ අගය ලෙස වන අතර, මූල්‍ය වත්කමේ ආයු කාලය මත වෙනස් විය හැකිය (උදාහරණයක් ලෙස, වාරිකයේ/වට්ටමේ මූලික හෝ ක්‍රමක්ෂණයේ නැවත ගෙවීම් තිබේ නම්).

ණය ලබා දීමේ සැලසුමක් තුල පොලියේ වඩාත් සැලකිය යුතු මූලිකාංගයන් වන්නේ, මුදලේ කාලීන වටිනාකම පිළිබඳ සැලකිය යුතු අවධානය සහ ණය අවදානමයි.¨ජෂ්ෂ තක්සේරුවක් සිදු කිරීම සඳහා, මණ්ඩලය තීරණ අදාල කරනු ලබන අතර, මූල්‍ය වත්කම නම් කර ඇති මුදල් වර්ගය සහ පොලී අනුපාතය සකසා ඇති කාල පරාසය වැනි අදාල සාධකයන් සලකා බැලීම සිදු කරයි.

මූලික ණය දීමේ සැලසුමකට අදාල නොවන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්ගේ ද්‍රවශීලතාවය හෝ අවදානමට භූතාත්ම නිරාවරණයන්ට වඩා පරිසරයකට ඉදිරිපත් කරන ගිවිසුම්ගත නිරාවරණයන්ට වඩා වෙනස් වීම, නොගෙවන ලද මුදල මත හුදු මූලික සහ පොලී ගෙවීම වන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ඉහළ නොනංවයි. එවැනි අවස්ථාවන්හි ද, ඍඪෂඹට මූල්‍ය වත්කම් මැනීම අවශ්‍ය වේ.

**3. මෙහෙයුම් අංශ**

මෙහෙයුම් අංශ පහත ඒකකයන්හි කොටසක් වේ:

අ) ආදායම් උපයන සහ වියදම් සිදුවන ව්‍යාපාරික ක්‍රියාකාරකම්වල යෙදෙන ඒකක (එකම ඒකකයේ වෙනත් කොටස් සමඟ කරන ගණුදෙණුවලට සම්බන්ධ ආදායම් සහ වියදම් ඇතුළුව).

ආ) අංශය සඳහා වෙන් කළ යුතු සම්පත් පිළිබඳ තීරණ ගැනීම සඳහා සහ එහි කාර්යසාධනය තක්සේරු කරන ඒකකයේ ප්‍රධාන මෙහෙයුම් තීරණ ගන්නා විසින් නිරන්තර සමාලෝචනයට ලක් වන මෙහෙයුම් ප්‍රතිඵල සහිත ඒකක; සහ

ඇ) වෙන්ව පවතින්නා වූ මූල්‍ය තොරතුරු පවතින ඒකක.

කළමනාකරණ අරමුණු සඳහා, මණ්ඩලය විසින් නිෂ්පාදන සහ සේවාවන් පදනම් කරගෙන ප්‍රධාන ව්‍යාපාරය ව්‍යාපාරික අංශ හතරකට සංවිධානය කර ඇති අතර වාර්තාකළ හැකි අංශ හතරක් ඇත.
පහතින් වාර්තා කර ඇති අංශමය තොරතුරු සම්පත් වෙන් කිරීම සඳහා සහ කාර්යසාධනය ඇගයීම සඳහා ප්‍රධාන මෙහෙයුම් තීරණ ගන්නා විසින් භාවිතා කරයි.

- සාමාන්‍ය - මෝටර් රථ රක්ෂණය
- සාමාන්‍ය- මෝටර් රථ නොවන රක්ෂණය
- අග්‍රහාර
- NNDIS
- ප්‍රතිරක්ෂණය
- SRCC & T
- බෝග

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

## 18 ආංශික තොරතුරු

නිෂ්පාදනයේ ඉහත ප්‍රවර්ගයන්ගේ ප්‍රාරක්ෂණ ඵලයන් සඳහා දළ ලිඛිත වාරික පහත දක්වා ඇත.

| | 2020 | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මෝටර් වාහන නොවන | මෝටර් වාහන | NNDIS | ප්‍රතිරක්ෂණ | SRCC | සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය අග්‍රහාර/මන්ත්‍රී | කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය | එකතුව |
| | රු. | රු. | රු. | රු. | රු. | | | රු. |
| **වාරික** | | | | | | | | |
| දළ ලිඛිත වාරික | 260,600,235 | 213,469,435 | - | 3,235,474,242 | 6,088,496,099 | 20,000,000 | | 9,818,040,011 |
| අග්‍රහාර සඳහා ලැබුණු දායක මුදල් | | | | | | 5,469,298,738 | | 5,469,298,738 |
| රැස්කළ කෘෂි රක්ෂණ බදු | | | | | | | 1,626,851,259 | 1,626,851,259 |
| ලබා දුන් ප්‍රතිරක්ෂණ වාරික | | | | (985,500,000) | (116,390,156) | | | (1,101,890,156) |
| SRCC & Tr අරමුදල වෙත ලබා දුන් | (6,683,271) | (9,585,888) | | | 16,269,158 | - | | |
| | 253,916,964 | 203,883,547 | - | 2,249,974,242 | 5,988,375,101 | 5,489,298,738 | 1,626,851,259 | 15,812,299,851 |
| **ශුද්ධ ලිඛිත වාරික** | 62,708,125 | 19,407,473 | 369,863,014 | 328,384,234 | 87,405,906 | - | | 867,768,751 |
| UPR හි දළ වෙනස | | | | 710,852,459 | 84,106,755 | | | 794,959,214 |
| UPR හි වෙනසෙහි ප්‍රතිරක්ෂණ කොටස | 62,708,125 | 19,407,473 | 369,863,014 | 1,039,236,693 | 171,512,661 | - | - | 1,662,727,965 |
| **ඉපයූ ශුද්ධ රක්ෂණ වාරික (අ)** | 316,625,089 | 223,291,020 | 369,863,014 | 3,289,210,934 | 6,159,887,762 | 5,489,298,738 | 1,626,851,259 | 17,475,027,816 |
| ගාස්තු ආදායම (ආ) | 1,669,869 | 265,526 | | | | | | 1,935,395 |
| **මුළු ප්‍රාරක්ෂණ ආදායම (අ+ආ)** | 318,294,958 | 223,556,546 | 369,863,014 | 3,289,210,934 | 6,159,887,762 | 5,489,298,738 | 1,626,851,259 | 17,476,963,211 |
| අත්පත් කර ගැනීමේ පිරිවැය | (114,503) | (2,006,500) | | (703,022,439) | (982,741,457) | | | (1,687,884,899) |
| ලාභ කොමිස් වියදම් | | | | | 118,308,118 | | | 118,308,118 |
| විලම්බිත අත්පත් කරගැනීමේ වෙනසෙහි පිරිවැය | | (1,508,879) | | (29,521,684) | (14,253,601) | | | (45,284,164) |
| **ශුද්ධ අත්පත් කරගැනීමේ පිරිවැය (ඇ)** | (114,503) | (3,515,380) | - | (732,544,123) | (878,686,940) | - | - | (1,614,860,946) |
| ගෙවන ලද දළ හිමිකම් | (226,899,864) | (206,946,636) | 548,040,965 | (1,604,293,185) | (2,036,000) | (4,989,938,897) | (1,398,439,902) | (7,880,513,519) |
| ප්‍රතිරක්ෂණ අයකර ගැනීම් | | - | | | | | | |
| IBNR හි වෙනස්වීම | (8,618,552) | 12,034,400 | 121,880,420 | 98,821,419 | 16,417,739 | 21,775,178 | (336,313,348) | (74,002,744) |
| **ගෙවන ලද ශුද්ධ හිමිකම්** | (235,518,416) | (194,912,236) | 669,921,385 | (1,505,471,766) | 14,381,739 | (4,968,163,719) | (1,734,753,250) | (7,954,516,263) |
| ගෙවීමට ඇති හිමිකම් වෙනස් වීමේ ප්‍රතිරක්ෂණ කොටස | - | - | | | | | | |
| ගෙවන ලද ශුද්ධ හිමිකම් (ඈ) | (235,518,416) | (194,912,236) | 669,921,385 | (1,505,471,766) | 14,381,739 | (4,968,163,719) | (1,734,753,250) | (7,954,516,263) |
| **ප්‍රාරක්‍ෂණ ප්‍රතිඵලය (අ,ආ,ඇ,ඈ)** | 82,662,038 | 25,128,930 | 1,039,784,399 | 1,051,195,045 | 5,295,582,561 | 521,135,020 | (107,901,991) | 7,907,586,001 |
| පරිපාල වියදම් **(ඉ)** | (57,835,269) | (16,065,353) | (32,130,705) | (32,130,705) | (105,440,294) | (176,718,878) | (6,426,141) | (426,747,346) |
| **මුළු වියදම් (ඇ,ඈ,ඉ)** | (293,468,189) | (214,492,969) | 637,790,680 | (2,270,146,595) | (969,745,496) | (5,144,882,597) | (1,741,179,391) | (9,996,124,555) |
| | 24,826,769 | 9,063,577 | 1,007,653,694 | 1,019,064,340 | 5,190,142,267 | 344,416,141 | (114,328,133) | 7,480,838,656 |
| lවර්ෂය සඳහා ආයෝජන හා වෙනත් ආදායම් | 3,609,098 | 328,160 | 10,233 | 211,344,417 | 1,125,424,167 | 15,796,882 | 28,574,758 | 1,385,087,715 |
| **බදු පසු ලාභය** | 28,435,867 | 9,391,738 | 1,007,663,927 | 1,230,408,756 | 6,315,566,434 | 360,213,024 | (85,753,375) | 8,865,926,371 |
| lආදායම් බදු වියදම් | - | | | | (1,339,826,929) | | | (1,339,826,929) |
| **බදු පසු ලාභය** | 28,435,867 | 9,391,738 | 1,007,663,927 | 1,230,408,756 | 4,975,739,505 | 360,213,024 | (85,753,375) | 7,526,099,442 |

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

**3 ආදායම**

**4 දළ ලිඛිත වාරිකය**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - රක්ෂණ සහ ආයෝජන ගිවිසුම් වල නිෂ්පාදන වර්ගීකරණය ශ්‍රීලංමුවාප්‍ර 4 - පැවරෙන රක්ෂන අවදානමේ මට්ටම මත පිහිටමින්, 'රක්ෂණ ගිවිසුම්' හෝ 'ආයෝජන ගිවිසුම්' ලෙස වර්ගීකරණය කළ හැකි රක්ෂණකරු විසින් ලිඛිත ගිවිසුම්, රක්ෂණ ගිවිසුම් සඳහා අවශ්‍ය වේ.

රක්ෂණ හිමියන්ට දැඩි ලෙස බලපාන නිශ්චිතව දක්වන ලද අනාගත අවිනිශ්චිත සිදුවීමක් (රක්ෂිත සිදුවීමක්) නම්, රක්ෂණ හිමියාට වන්දි ගෙවීමට එකඟවීම මඟින් වෙනත් පාර්ශවයකින් (රක්ෂණ හිමියා) සැලකිය යුතු රක්ෂණ අවදානමක් මණ්ඩලය (රක්ෂණකරු) බාරගෙන ඇති විට ඒවා රක්ෂණ ගිවිසුම් වේ. පොදු මාර්ගෝපදේශනයක් ලෙස, රක්ෂිත සිදු වීම සිදු නොවූයේ නම්, ගෙවිය හැකි ප්‍රතිලාභ හා ගෙවන ලද ප්‍රතිලාභ සංසන්දනය කිරීම මඟින්, ඒ තුල සැලකිය යුතු රක්ෂණ අවදානමක් ඇත්දැයි මණ්ඩලය විසින් සොයා බලනු ලබයි. රක්ෂණ ගිවිසුම් මත මූල්‍ය අවදානම් ද පැවරිය හැකිය.

ආයෝජන ගිවිසුම් යනු, සැලකිය යුතු මූල්‍ය අවදානම පැවරීම සිදු වන ගිවිසුම් වන අතර රක්ෂණ අවදානමක් පැවරීම සිදු නොවේ. ගිවිසුමේ පාර්ශවයක් සඳහා නිශ්චිත නොවන මූල්‍ය නොවන විචල්‍යයක් සම්බන්ධයෙන් වන නිශ්චිත පොලී අනුපාතයක්, මූල්‍ය උපකරණ මිලක්, භාණ්ඩ මිලක්, විදේශ විනිමය අනුපාතයක්, මිල හෝ අනුපාත දර්ශකයක්, ණය අනුපාතිකයක් හෝ ණය දර්ශකයක් හෝ වෙනත් දර්ශකයක් යන එකක් හෝ කිහිපයක් සම්බන්ධයෙන් ඇති විය හැකි අවදානමක් මූල්‍ය අවදානමක් වේ.

ගිවිසුමක් රක්ෂණ ගිවිසුමක් ලෙස වර්ගීකරණය කළ විට, සියලු හිමිකම් සහ බැඳීම් ශූන්‍ය හෝ කල් ඉකුත් නොවේ නම්, මෙම කාල සීමාව තුල රක්ෂණ අවදානම සැලකිය යුතු ලෙස අඩු වුව ද, එහි ආයු කාලයේ ඉතිරි ප්‍රමාණය සඳහා එය රක්ෂණ ගිවිසුමක් ලෙස පවතී. කෙසේ නමුදු, ආරම්භ වීමෙන් පසු රක්ෂණ අවදානම සැලකිය යුතු මට්ටමකට පත් වේ නම්, ආයෝජන ගිවිසුම් රක්ෂණ ගිවිසුම් ලෙස වර්ගීකරණය කළ හැකිය.

මණ්ඩලය මඟින් විකුණනු ලබන සියලු නිෂ්පාදනයන් රක්ෂණ ගිවිසුම් වන බැවින්, ශ්‍රීලංමුවාප්‍ර 4 - රක්ෂණ ගිවිසුම්, යටතේ රක්ෂණ ගිවිසුම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ඒ අනුව, වාර්තා කරනු ලබන දිනය වන විට, මණ්ඩලයේ නිෂ්පාදන කළඹ තුල කිසිදු ආයෝජන ගිවිසුමක් නොමැත.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - දළ ලිඛිත වාරිකයේ (දලිවා) පිළිගැනීම මඟින් ප්‍රතිරක්ෂක අවදානම් සඳහා මණ්ඩලය මඟින් අය කරනු ලබන වාරිකය නියෝජනය කරනු ලබයි. උපචිත කිරීමේ පදනමක් මත ද.ලි.වා. ගනනය කරනු ලබයි.

ජීවිත-නොවන රක්ෂණ ද.ලි.වා.තුල, ගිණුම්කරණ කාල සීමාව තුල එළඹුනු හෝ ගිවිසුම ආරම්භ වන දිනයේ දී පිළිගන්නා ලද ගිවිසුම් මඟින් මුළු කාල සීමාව සඳහා ආවරණය සඳහා ලැබුනු/ලැබිය හැකි මුළු වාරික ප්‍රමාණය අඩංගු වේ.

හිමිකම් නැවත නොගෙවීම් වැනි, වාරික අනුපාතයේ කොටසක් වන නැවත ගෙවීම් ද.ලි.වා.යෙන් අඩු කරනු ලැබේ.

ප්‍රතිරක්ෂණ දළ වාරික තුළ වෛකල්පික ව්‍යාපාරවලට අදාළ වාරික ආදායම, අන්තර්නම්‍ය සමානුපාතික ගිවිසුම් ප්‍රතිරක්ෂණය සහ අන්තර්නම්‍ය සමානුපාතික නොවන ගිවිසුම් ප්‍රතිරක්ෂණය අන්තර්ගත වේ.

ප්‍රධාන ප්‍රාරක්ෂකගේ තහවුරු කිරීම ලැබීමෙන් අනතුරුව, නියමිත මූල්‍ය කාල සීමාව තුළ උපකල්පනය කරන ලද වෛකල්පික අවදානම් සම්බන්ධයෙන් අදාළ වන්නා වූ අන්තර්නම්‍ය ප්‍රතිරක්ෂණ වාරික එකී මූල්‍ය වර්ෂය තුළ දීම හඳුනා ගනු ලැබේ. අන්තර්නම්‍ය සමානුපාතික ගිවිසුම් ප්‍රතිරක්ෂණ වාරික, ප්‍රධාන ප්‍රාරක්ෂකගේ තහවුරු කිරීම සහිතව පැවරුම්කරු වෙතින් ලැබෙන වාරමය දැනුම් දීම් මත පදනම්ව හඳුනා ගැනේ.

නිශ්චිතව දක්වන ලද ගිවිසුම් කාල සීමාවක් තුළ සිදුවන පාඩු ආවරණය වන්නා වූ සමානුපාතික නොවන ගිවිසුම් මත ලැබෙන වාරික ආදායම, එක් එක් කොන්ත්‍රාත්තුවේ නියමයන් සහ කොන්දේසි යටතේ ගිවිසුම් කාලය ආරම්භයේ දී ඒ වන විටත් ස්ථාපිත කරනු ලැබ ඇති කොන්ත්‍රාත්තුමය වාරිකය මත පදනම් වෙමින් හඳුනා ගැනේ.

ප්‍රධාන ව්‍යාපාර පන්ති අනුව වර්ෂය සඳහා වන දළ ලිඛිත වාරිකය පහත සඳහන් පරිදි වේ;

| | 2020 රු. | 2019 රු. |
|---|---:|---:|
| **දළ ලිඛිත වාරික** | | |
| ප්‍රධාන පෙළේ ව්‍යාපාර මඟින් වර්ෂය සඳහා ලද වාරික පහත පරිදි වේ. | | |
| ඇතුලට ප්‍රතිරකෂණ | **3,235,474,242** | 4,173,714,909 |
| SRCC & Tr වාරික | **6,088,496,099** | 6,307,350,365 |
| සාමාන්‍ය රක්ෂණය -මෝටර් වාහන | **260,600,235** | 390,150,125 |
| සාමාන්‍ය රක්ෂණය -මෝටර් වාහන නොවන | **213,469,435** | 301,979,246 |
| ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය (NNDIS) | **-** | 1,500,000,000 |
| පාර්ලිමේන්තු මන්ත්‍රවරුන් සඳහා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | **20,000,000** | 20,000,000 |
| | **9,818,040,011** | 12,693,194,645 |
| **අග්‍රහාර රක්ෂණ යෝජනාක්‍රමය සඳහා රැස්කළ දායක මුදල්** | | |
| සාමාජිකයන්ගෙන් දායක මුදල් | **4,090,359,038** | 3,617,114,527 |
| භාණ්ඩාගාරයෙන් දායක මුදල් | **782,000,000** | 767,970,000 |
| විශ්‍රාමිකයන්ගේ රක්ෂණ යෝජනා ක්‍රමය | **166,837,400** | 142,321,400 |
| අර්ධ රාජ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | **430,102,300** | 311,317,625 |
| | **5,469,298,738** | 4,838,723,551 |

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

**6 නොඉපයූ වාරික සඳහා වන සංචිතයේ වෙනස් වීම**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - රක්ෂණ ආවරණයේ කල් ඉකුත් නොවූ කාලයට අදාල නමුත් ලිඛිත වාරිකයේ කොටස, නොඉපයූ වාරික සංචිතය සඳහා සංචිතයේ වෙනස මඟින් නියෝජනය වේ. මෝටර් වාහන හා මෝටර් වාහන නොවන සහ අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය ඇතුළු සාමාන්‍ය රක්ෂණය සඳහා දින 365 පදනමින්, SRCC සඳහා 1/24 පදනමින් සහ පොදු වශයෙන් පිළිගත් රක්ෂණයේ හා ප්‍රතිරක්ෂණ කර්මාන්තයේ පිළිගත් පරිචයන් හා අනුකූල ප්‍රතිරක්ෂණය සඳහා 35%ක දළ වාරික පදනමින්, නොඉපයූ වාරික ගනනය කරනු ලැබේ. නොඉපයූ රක්ෂණ වාරිකය සඳහා සංචිතයේ වෙනස් වීම මඟින් රක්ෂණ ගිවිසුම් වල කල් ඉකුත් නොවූ කාලය ආවරණය කිරීම සඳහා වර්ෂය තුල නොඉපයූ වාරික සංචිතයට ද.ලි.වා. පැවරීමේ ශුද්ධ කොටස දැක්වේ.

**7 ප්‍රතිරක්ෂකයින් වෙත යැවූ වාරිකය**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ප්‍රතිරක්ෂකයින් වෙත යවන ලද වාරිකය හඳුනාගැනීම, ජීවිත රක්ෂණ-නොවන ලිඛිත දළ ප්‍රතිරක්ෂණ වාරිකයට, අදාල කාල පරාසය සඳහා එළඹෙන ලද ගිවිසුම් මඟින් සපයනු ලබන මුළු ආවරනය සඳහා ගෙවිය යුතු මුළු වාරිකය ඇතුලත් වන අතර, එය රක්ෂණ ගිවිසුම ආරම්භ වූ දිනයෙන් හඳුනා ගනු ලබයි. පූර්ව කාල පරාසයන්ගෙන් ආරම්භවන ප්‍රතිරක්ෂණ ගිවිසුම් සම්බන්ධයෙන් ගිණුම්කරණ කාල සීමාවේ දී පැන නඟින යම් වෙනස් කිරීම් ද වාරිකයට ඇතුලත් වේ.

**8 නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරිකය සඳහා සංචිතයේ වෙනස් වීම**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරිකය සඳහා සංචිතයේ වෙනස් වීම - නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරිකය යනු, වාර්තා කරන දිනයට පසු අවදානමේ කාල සීමාවට අදාල වන වසරක ලිඛිත වාරිකයේ කොටසයි. සෘජු රක්ෂණ ගිවිසුම් පාදක වන කාල සීමාව සම්බන්ධයෙන්, නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරිකය ප්‍රමාද කරනු ලැබේ. නොඉපයූ රක්ෂණ වාරිකය සඳහා සංචිතයේ වෙනස් වීම මඟින් රක්ෂණ ගිවිසුම් වල කල් ඉකුත් නොවූ කාලය ආවරණය කිරීම සඳහා වර්ෂය තුල නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික සංචිතයට ප්‍රතිරක්ෂණ වාරිකයේ ශුද්ධ කොටස යැවීම දැක්වේ.

**9 ශුද්ධ හිමිකම් ගෙවීම්**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - දළ හිමිකම් ගෙවීම් හඳුනා ගැනීම - වර්ෂය තුල සිදුවන සියලු හිමිකම් ගෙවීම් සඳහා, වාර්තා කළ ද නොකළ ද හිමිකම් සැකසීම සහ ගෙවීම සඳහා සෘජුව අදාල වන බාහිර හිමිකම් ගෙවීම් හා අදාල පිරිවැය කළමනාකරණය, ගලවා ගැනීම හා වෙනත් ප්‍රතිසාධනයන්ගේ වටිනාකම සඳහා අඩු කිරීමක් සහ පෙර වර්ෂය සඳහා නොගෙවූ හිමිකම් ලබා දීමේ දී යම් වෙනස් කිරීම් ඇතුලත් වේ. එක් එක් හිමිකම් ගෙවීම් ගොනු සහ හිමිකම් පියවීමේ අවසාන පිරිවැයෙහි ඇස්තමේන්තු වෙනස්කම් සමාලෝචනය කිරීමෙන් නොගෙවූ හිමිකම් තක්සේරු කරනු ලැබේ.

හිමිකම් ගෙවීමේ වියදම් සහ නොගෙවූ හිමිකම් සඳහා වගකීම්, සෘජු රක්ෂණ ව්‍යාපාරයට අදාලව හඳුනාගනු ලැබේ. හිමිකම් වාර්තා කරන ලද නමුත් මෙතෙක් නොගෙවන ලද සහ රක්ෂණය කර ඇති නමුත් මෙතෙක් වාර්තා නොකරන ලද (IBNR) හිමිකම් සහ එම හිමිකම් පියවීමේ දී අපේක්ෂිත IBNR සෘජු සහ වක්‍ර පිරිවැය, වගකීම මඟින් ආවරණය කරනු ලබයි. IBNR සම්බන්ධයෙන් ප්‍රතිපාදන, අතීත අත්දැකීම් සහ ප්‍රවනතාවයන් මත පදනම් ව අනාගත වගකීමේ වඩාත් තාත්වික තක්සේරුවක් සහතික කිරීම සඳහා කාර්තු පදනම මත IBONR තාත්විකව අගයනු ලබයි.

දැනට පවතින තොරතුරු මත පදනම්ව, හිමිකම් ගෙවීම සඳහා ප්‍රතිපාදන ප්‍රශස්ත ලෙස සඳහන්ව ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය සලකා බලන අතර, අදාල සිදුවීම් සහ තොරතුරු වල ප්‍රතිඵලයක් ලෙස අවසන් වගකීම් වෙනස් වනු ඇත. මෙය, සපයා ඇති අරමුදල ප්‍රමාණය වෙනස් වීමට හේතු වනු ඇත. කාල සීමාව සඳහා මූල්‍ය ප්‍රකාශයන්ගේ එවැනි ප්‍රමාණයන් දක්වා ඇත. යොදා ගන්නා ක්‍රමවේද සහ ඇස්තමේන්තු අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ප්‍රතිරක්ෂණ හිමිකම් ගෙවීම් හඳුනා ගැනීම - අදාල ගිවිසුමේ කොන්දේසි වලට අනුව, අදාල දළ රක්ෂණ හිමිකම් ගෙවීම් හඳුනා ගන්නා විට, ප්‍රතිරක්ෂණ හිමිකම් ගෙවීම් හඳුනාගනු ලැබේ.

ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ නිෂ්පාදන වර්ගීකරණය සලකා බැලීමේ දී, ප්‍රතිරක්ෂණය සෘජු ව්‍යාපාරයක් ලෙස සලකා බලන්නේ නම්, ඒවා පවතින ආකාරයට ආදායමක් හෝ වියදමක් ලෙස, අපේක්ෂිත ප්‍රතිරක්ෂණ හිමිකම් ගෙවීම් හඳුනාගනු ලැබේ.

**10 ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත් කර ගැනීමේ පිරිවැය**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ප්‍රාරක්ෂණ සහ ශුද්ධ අත්පත් කර ගැනීමේ පිරිවැය සහ ලිඛිත පිරිවැය ඉපයීම හා සම්බන්ධ කාල සීමාව තුල ව්‍යාපාරික නිෂ්පාදනය ප්‍රමාද කිරීම් සහ ක්‍රමක්ෂණය කිරීම් හා සෘජුව සම්බන්ධිත හා වෙනස් විය හැකි නියෝජන කොමිස් මුදල් හඳුනා ගැනීමයි. ප්‍රමාද කරන ලද අත්පත් කර ගැනීමේ පිරිවැය තුල ප්‍රතිරක්ෂණ කොමිස් මුදල් ද ඒ අකාරයෙන්ම සලකා බලනු ලැබේ.

**11 වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම්**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් හඳුනා ගැනීම - වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. ව්‍යාපාරික කටයුතු සිදු කිරීමේ දී සහ දේපළ, පිරියත හා උපකරන පවත්වාගෙන යෑමේ දී, දැරීමට සිදුවන සියලු වියදම්, ලාභ සහ අලාභ ප්‍රකාශනයේ සඳහන් කෙරේ.

**කාර්ය මණ්ඩල වියදම්**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - කෙටි-කාලීන සේවක ප්‍රතිලාභ - කෙටි-කාලීන සේවක ප්‍රතිලාභ බැඳීම්, වට්ටම් නොවන පදනම මත මනිනු ලබන අතර, අදාල සේවය සපයන ආකාරය අනුව ගෙවනු ලැබේ. සේවකයකු විසින් අතීතයේ දී ලබා දුන් සේවයේ ප්‍රතිපළයක් ලෙස සහ බැඳීම විශ්වසනීය ලෙස තක්සේරු කළ හැකි විට එම මුදල ගෙවීමට මණ්ඩලයට නෛතික හෝ අර්ථසාධනීය බැඳීමක් ඇත් නම්, කෙටි-කාලීන මුදල් පාරිතෝෂිකය හෝ ලාභ-බෙදීමේ සැලසුම් යටතේ ගෙවීමට අපේක්ෂිත මුදල වගකීමක් ලෙස හඳුනා ගනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු, නිශ්චිත දායකත්ව සැලසුමකට වඩා හිටපු-සේවක ප්‍රතිලාභ සැලසුමක් වේ. ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ කාර්ය මණ්ඩල වියදම් යටතේ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වල වෙනස්වීම් මණ්ඩලය විසින් හඳුනා ගනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

(ඒ) වර්තමාන සේවා පිරිවැය

(බී) පොලී පිරිවැය

වැඩිදුර විස්තර සඳහා, කරුණාකර නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් පිළිබඳ 34 සටහන බලන්න.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - නිශ්චිත දායකත්ව සැලසුම් - නිශ්චිත දායකත්ව සැලසුමක් යනු, ආයතනයක් විසින් වෙනත් ආයතනයකට ස්ථිර දායක මුදලක් ගෙවන, වැඩිදුර මුදලක් ගෙවීමට නෛතික හෝ අර්ථසාධනීය බැඳීමක් නොමැති තත්වයක් යටතේ ගෙවන හිටපු- සේවක සැලසුමකි. සියලු සේවකයින් ආවරණය කරන, 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල පනත යටතේ වන සේවක භාරකාර අරමුදල සහ සංශෝධනය වූ 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ වන සේවක අර්ථසාදක අරමුදල (ඊපීඑෆ්) වෙත ගෙවන දායකත්ව මුදල් සඳහා බැඳීම්, ගෙවීමට ඇති විට ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ සේවක ප්‍රතිලාභ වියදම් ලෙස හඳුනාගනු ලැබේ. සේවක අර්ථ සාධක අරමුදලට සහ භාරකාර අරමුදලට සේවක දළ වැටුපෙන් පිළිවෙලින් 12% සහ 3% ක ප්‍රතිශතයක් මණ්ඩලය විසින් දායක මුදල් ලෙස ගෙවනු ලබයි.

## 12 ගාස්තු ආදායම

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - රක්ෂණ ගිවිසුමේ පරිපාලන සේවා සහ වෙනත් ගිවිසුම් ගාස්තු ලෙස රක්ෂණ හිමියන්ගෙන් අය කරන ගාස්තු හඳුනා ගැනීම. ලැබීමේ දී හෝ ලැබීමට ඇති විට, මෙම ගාස්තු ආදයම් ලෙස හඳුනාගනු ලැබේ.

## 13 ශුද්ධ සාධාරණ අගයේ ප්‍රතිලාභ

සාධාරණ අගයේ ප්‍රතිලාභ සහ අලාභ හඳුනාගැනීම. අයෝජන සම්බන්ධයෙන් වන ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වාර්තා කරනු ලබන ශුද්ධ සාධාරණ ප්‍රතිලාභයන්ට, මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් වන ප්‍රතිලාභයන් සහ අලාභයන් ඇතුලත් වේ. ශුද්ධ විකුණුම් ආදායම් සහ මුල් හෝ ක්‍රමක්ෂය පිරිවැය අතර වෙනස ලෙස, ආයෝජනයන්ගේ විකුණුම් සම්බන්ධ ලාභ හෝ අලාභ ගනනය කරනු ලබන අතර, විකුණුම් ගනුදෙනු සිදුවීම් යටතේ වාර්තා කරනු ලැබේ.

## 14 වෙනත් අදායම්

වෙනත් ආදායම් වලට, ගලවාගැනීම්, දේපළ, පිරියත සහ උපකරණ සහ විවිධ ආදායම් මත බැහැර කිරීමේ ලාභ/අලාභ ඇතුලත් වේ. දේපළ, පිරියත සහ උපකරණ විකිණීම මත ලාභය හෝ අලාභය, විකිණීම සිදුවන කාල සීමාවේ දී හඳුනාගනු ලබන අතර, වෙනත් ආදායම් යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

## 15 බදු පෙර ලාභය

පහත වියදම් අය කර ගැනීමෙන් පසු, වර්ෂය සඳහා බදු පෙර ලාභය සඳහන් කරනු ලැබේ;

## 16 ආදායම් බදු වියදම

ආදායම් බදු වියදම හඳුනා ගැනීම - ආදායම් බදු වියදමට වර්තමාන ආදායම් බදු ඇතුලත් වේ. වර්තමාන ආදායම් බදු, හිමිකාරීත්වය තුල හඳුනාගන්නා විට, හිමිකාරීත්වය තුල සෘජුවම හඳුනාගෙන ඇති අයිතමයන් හා අදාල වන මට්ටම දක්වා හැර, ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

**ආදායම් බදු ප්‍රතිවර්තනය/වියදම**

දෙසැම්බර් 31න් අවසන් වන වර්ෂ සඳහා, ආදායම් බද්දේ ප්‍රධාන අංග පහත පරිදි වේ:

ලාභ හා අලාභ තුල හඳුනාගන්නා ලද බදු

දෙසැම්බර් 31න් අවසන් වන වර්ෂය සඳහා,

| | 2020 රු. | 2019 රු. |
|---|---|---|
| වර්තමාන ආදායම් බදු | - | - |
| වර්තමාන වර්ෂයේ ලාභයට ආදායම් බද්ද | 1,339,826,929 | (105,600,662) |
| පෙර වර්ෂ සම්බන්ධයෙන් වර්තමාන බදු වල (අඩි) /අව ප්‍රතිපාදන | - | - |
| මුළු ආදායම් බදු (ප්‍රතිවර්තන)/වියදම | 1,339,826,929 | (105,600,662) |

## 17 අස්පර්ශනීය වත්කම්

මණ්ඩලයේ අස්පර්ශනීය වත්කම් වලට, ලබාගත් පරිගණක මෘදුකාංගයේ වටිනාකම ඇතුලත් වේ.

අස්පර්ශනීය වත්කමක් හඳුනා ගැනීමේ පදනම වන්නේ, මණ්ඩලයට වෙත ගලාගෙන එන වත්කම් වලට ආරෝපණය කළ හැකි මෙන්ම වත්කමේ පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි, බොහෝ විට අනාගත ආර්ථික ප්‍රතිලාභයක් වන්නේ නම් එය අස්පර්ශනීය වත්කමක් ලෙස හඳුනාගනු ලැබේ.

මණ්ඩලය විසින් අත් කර ගනු ලැබූ මෘදුකාංගය මූලිකව පිරිවැයක් ලෙස ගනනය ලැබූ නමුත් පසුව ක්‍රමක්ෂිත පිරිවැය එකතුවෙන් සහ හානිකරණ අලාභයන්ගේ එකතුවක් ඇත්නම් එයින් අඩු කල පිරිවැය ලෙස සඳහන් කරන ලදී.

පසු පිරිවැය- මූලික හඳුනාගැනීමට පසු වියදම, අස්පර්ශනීය වත්කම, ක්‍රමක්ෂිත පිරිවැය එකතුවෙන් සහ හානිකරණ අලාභයන්ගේ එකතුවෙන් අඩු කල පිරිවැය වෙත ගෙන යනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

අදාල නිශ්චිත වත්කම තුල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩිවන විට පමණක් මෘදුකාංග වත්කම් මත පසු වියදම සඳහා ප්‍රාග්ධනය සපයා ගනු ලැබේ. වෙනත් සියලු වියදම්, වියදම් දරන ආකාරයට සිදු වේ.

ක්‍රමක්ෂය අස්පර්ශනීය වත්කම්, වසර හතරකට අධික කාලයක් සෘජු-රේඛා පදනමක ක්‍රමක්ෂය වේ.

සීමිත ආයු කාලයක් සහිත අස්පර්ශනීය වත්කම්, සඵල පිරිමැසුම් ආයු කාලයක් සඳහා ක්‍රමක්ෂය කරනු ලැබේ. සීමිත සඵල ආයුකාලයක් සහිත අස්පර්ශනීය වත්කමක් සඳහා ක්‍රමක්ෂය කාල සීමාව සහ ක්‍රමක්ෂය ක්‍රමවේදය අවම වශයෙන් මූල්‍ය වර්ෂය අවසානයේ දී සමාලෝචනය කරනු ලැබේ. අපේක්ෂිත සඵල ආයුකාලයේ හෝ වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කරන අපේක්ෂිත රටාවේ වෙනස්කම්, යෝග්‍ය පරිදි ක්‍රමක්ෂය කරන කාලසීමාව හෝ ක්‍රමවේදය සහ ගිණුම්කරණ ඇස්තමේන්තු ලෙස ඒවා සලකනු ලැබීම වෙනස් කිරීම සම්බන්ධයෙන් වගකීම දරනු ලැබේ.

නිශ්චිත ආයු කාලයක් සහිත අස්පර්ශනීය වත්කම් මත ක්‍රමක්ෂය වියදම, ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි, අස්පර්ශනීය වත්කමේ ක්‍රියාකාරීත්වය හා නිශ්චිත වන වියදම් ඝනයෙහි ලා හඳුනාගනු ලැබේ.

පහත පරිදි, ඇස්තමේන්තු කරන ලද සඵල ආයු කාලය තුල අස්පර්ශනීය වත්කම් ඒවායේ ශේෂ වටිනාකම් වලින් සටහන් කිරීම සඳහා වන සෘජු-රේඛා ක්‍රමවේදය භාවිතයෙන් ක්‍රමක්ෂය ගනනය කරනු ලැබේ;

අස්පර්ශනීය වත්කම් හඳුනා නොගැනීම- බැහැර කරන හෝ අනාගත ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට අස්පර්ශනීය වත්කමක් හඳුනා නොගැනීම සිදු වේ. එවැනි අස්පර්ශනීය වත්කම් හඳුනා නොගැනීමෙන් සිදුවන ලාභ හෝ අලාභ, අයිතමය හඳුනා නොගත් විට ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ අන්තර්ගත කරනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - අස්පර්ශනීය වත්කම් හානිකරණය - හානිකරණයක් දක්නට ලැබෙන විට හානිකරණ සමාලෝචනයක් සිදු කෙරේ. ධාරණ අගයට වඩා නැවත අයකර ගත හැකි ප්‍රමාණය කුඩා වන විට, ලාභ හෝ පාඩු ප්‍රකාශනයෙහි හානිකරණයක් හඳුනාගනු ලැබේ. සෑම වාර්තා කරන කාල සීමාවක් සඳහාම, දැඩි ගිවිසුම් ප්‍රතිපාදනයක් ස්ථාපනය කිරීමේ දීම අනාගත සේවා හිමිකම් ද සලකා බලනු ලැබේ.

**17.1** පූර්ණ වශයෙන් ක්‍රමක්ෂය කරන ලද භාවිතයේ ඇති අස්පර්ශනීය වත්කම් රු 7,067,073 කි. තවදුරටත් භාවිතයේ ඇති පූර්ණ වශයෙන් ක්‍රමක්ෂණය කරන ලද අස්පර්ශනීය වත්කම් හෝ වාර්තා කරන දිනයට, (2019-6,542,073). අක්‍රීය අස්පර්ශනීය වත්කම්

**17.2** අස්පර්ශනීය වත්කම් සම්බන්ධ හිමිකම් සීමා - අස්පර්ශනීය වත්කම් වල හිමිකම සම්බන්ධයෙන් සීමාවන් නොපවතින අතර, කිසිදු අයිතමයක් වගකීම් සඳහා සුරැකුම්පත් ලෙස සහතික නොවේ.

**17.3** 2020 වර්ෂය තුල, අස්පර්ශනීය වත්කම් අත්පත් කර ගැනීම නොමැත. (2019-6,433,851)

**17.4** අස්පර්ශනීය වත්කම් හානිකරණය තක්සේරුව – 2020 දෙසැම්බර් 31 වන දින වනවිට, අස්පර්ශනීය වත්කම් වල පැන නැඟිය හැකි හානිකරණ දර්ශකයන් තක්සේරු කර ඇත. තක්සේරුව පදනම්ව, කිසිදු හානිකරණ දර්ශකයන් හඳුනගෙන නොමැති අතර, එබැවින්, අස්පර්ශනීය වත්කම් සම්බන්ධයෙන් වාර්තා කරන දිනයට මූල්‍ය ප්‍රකාශනයන්හි සඳහන් කිරීමට කිසිදු ආකාරයක හානිකරණ ප්‍රතිපාදනයක් නොමැත.

## 18 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ යනු සේවා සැපයීම හෝ පරිපාලන කාර්යයන් සඳහා තබාගනු ලබන අස්පර්ශනීය අයිතමයන් වන අතර, වර්ෂයකට වඩා කාලයක් භාවිතයට ගැනීම අපේක්ෂා කෙරේ. දේපළ, පිරියත සහ උපකරණ වලට, කාර්යාලීය උපකරණ, ගෘහ භාණ්ඩ සහ සවි කිරීම්, විවිධ වත්කම් සහ මෝටර් වාහන ඇතුලත් වේ.

හඳුනා ගැනීමේ පදනම - දේපළ, පිරියත සහ උපකරණ, වත්කමට අදාල අනාගත ආර්ථික ප්‍රතිලාභයන් මණ්ඩලය වෙත ගලා ඒම සිදු වේ නම් සහ වත්කමේ පිරිවැය විශ්වසනීය ලෙස ගනනය කළ හැකි නම් එමඟින් දේපළ, පිරියත සහ උපකරණ හඳුනාගනු ලැබේ.

ගනනය - වත්කමක් ලෙස හඳුනා ගැනීම සඳහා සුදුසුකම් ලබන, දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක්, මූලික වශයෙන් එහි පිරිවැයෙන් මිනුම් ලැබේ. පිරිවැය සඳහා, වත්කමක් අත්පත් කර ගැනීම සඳහා සෘජුව දැරීමට සිදු වන වියදම සහ අයිතමට යම් කොටසක් එකතු කිරීමට වැය වූ පිරිවය ඇතුලත් වේ. අමුද්‍රව්‍ය සහ සෘජු ශ්‍රමය, එහි අපේක්ෂිත භාවිතය සඳහා වැඩකරන තත්වයට පත් කිරීම සඳහා වෙනත් සෘජු වියදම් සහ කොටස් ගලවා ඉවත් කර ඒවා නැවත සවි කරන ස්ථානයන්හි සවි කිරීම සඳහා වන පිරිවැය, ස්වයංව-ගොඩනැගුනු වත්කම් පිරිවැයට ඇතුලත් වේ. උපකරණයක අදාල ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය වන මිල දී ගත් මෘදුකාංග,පරිගණක උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ.

මණ්ඩලය, පිරියත සහ උපකරණ සඳහා පිරිවැය ආකෘතියක් යොදා ගන්නා අතර, සමුච්චිත ක්ෂය කිරීම් සහ සමුච්චිත හානිකරණ අලාභයන් අඩු කරන ලද යම් ආනුෂංගික වියදම් සමඟින්, මිලදී ගැනීමේ හෝ ඉදි කිරීමේ පිරිවැය යටතේ වාර්තා කරනු ලබයි.

අලුත්වැඩියාවන් සහ නඩත්තු සඳහා වියදම්, එම වියදම් සිදු කරන ලද මූල්‍ය කාල සීමාව තුල ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ. පවතින වත්කම් වල ඉතා මෑතක දී තක්සේරු කරන ලද සම්මත කාර්ය සාධානයට අමතරව අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒම සහ වත්කමේ හඳුනාගත හැකි කොටසක් නවීකරණය මඟින් ප්‍රතිස්ථාපනය විය හැකි විට, වත්කම් වල ධාරණ අගය ට, සැලකිය යුතු නවීකරණයන්ගේ පිරිවැය ඇතුලත් වේ. අදාල වත්කමේ ශේෂ සඵල ආයු කාලය තුල සැලකිය යුතු නවීකරණයන්ගේ ක්ෂය වීම සිදු වේ.

දේපළ, පිරියත සහ උපකරණ වල ඇස්තමේන්තු කරන ලද සඵල ආයු කාලයන් සඳහා වන ශේෂ අගයන් ඒවායේ පිරිවැය ලෙස ලියා දක්වන සෘජු-රේඛා ක්‍රමවේදය භාවිතයෙන් ක්ෂය වීම ගනනය කරනු ලැබේ. ක්ෂය වීමේ ගාස්තු වත්කම භාවිතය ගත හැකි විට ආරම්භ වේ. ඇස්තමේන්තු කරන ලද සඵල ආයු කාලයන් පහත පරිදි වේ;

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

| | |
|---|---|
| පිරියත හා යන්ත්‍රසූත්‍ර | වසර 10ට වැඩි |
| ගෘහ උපකරණ සහ සවි කිරීම් | වසර 13.33 ට වැඩි |
| කාර්යාලීය උපකරණ | වසර 13.33 ට වැඩි |
| මෝටර් රථ වාහන | වසර 10ට වැඩි |
| නාම පුවරු | ගොඩනැගිල්ලේ ලීසිං කාලසීමාවට වඩා වැඩි |

**දේපල, පිරියත සහ උපකරණ හඳුනා-නොගැනීම**

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක ධාරණ අගය, බැහැර කිරීමේ දී හෝ එමඟින් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට හඳුනා-නොගැනීම සිදු කරයි. දේපළ, පිරියත සහ උපකරණ අයිතමය හඳුනා නොගන්නා විට, දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් හඳුනා නොගැනීමේ පැන නැගෙන ලාභය හෝ අලාභය ලෙස ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි ඇතුලත් කරනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක ධාරණ අගයේ ආදේශන පිරිවැය හඳුනා ගන්නා විට, ආදේශනය කරන ලබන කොටසේ ධාරණ අගය හඳුනා-නොගනු ලැබේ. සෑම ප්‍රාග්ධනායනයක දීම, පෙර පිරිවැය පරීක්ෂාවේ ශේෂ ධාරණ අගයන් හඳුනා ගනු නොලැබේ.

**18.1** පූර්ණ වශයෙන් ක්ෂය කරන ලද භාවිතයේ ඇති දේපළ, පිරියත සහ උපකරණ - සාමාන්‍ය ව්‍යාපාරික ක්‍රියාකාරකම් වල භාවිතයේ ඇති පූර්ණ වශයෙන් ක්ෂය කරන ලද වත්කම් සඳහා දේපළ, පිරියත සහ උපකරණ ද ඇතුලත් වේ. වාර්තා කරන ලද වන විට ද භාවිතයේ ඇති පූර්ණ වශයෙන් ක්ෂය කරන ලද වත්කම් සඳහා දේපළ, පිරියත සහ උපකරණ වල මූලික පිරිවැය පහත පරිදිවේ:

**18.2** දේපළ, පිරියත සහ උපකරණ සම්බන්ධ අයිතියේ සීමාව – වාර්තා කරන දිනය වන විට, මණ්ඩලයේ දේපළ, පිරියත සහ උපකරණ අයිතිය සම්බන්ධයෙන් පවතින කිසිදු සීමාවක් නොමැත.

**18.3** දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම - මූල්‍ය වර්ෂය තුල, මණ්ඩලය රු 12,433,322 (2019 - රු. 27,468,606) ක දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගෙන ඇත.

**18.4** දේපළ, පිරියත සහ උපකරණ, වගකීම් සඳහා සුරැකුම් ලෙස සහතික කිරීම - 2020 දෙසැම්බර් 31න් අවසන් වන වර්ෂය සඳහා (2019-ශුන්‍ය) වගකීම් සඳහා සුරැකුම් ලෙස සහතික කිරීම සඳහා කිසිදු දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් යොදා ගෙන නැත.

**18.5** තාවකාලිකව අක්‍රිය දේපළ, පිරියත සහ උපකරණ - 2020 දෙසැම්බර් 31න් අවසන් වන වර්ෂය සඳහා (2019-ශූන්‍ය) කිසිදු අක්‍රිය දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් නොමැති විය.

**18.6** දේපළ, පිරියත සහ උපකරණ හානිකරණය තක්සේරු කිරීම - 2020 දෙසැම්බර් 31 වන විට, මණ්ඩලය විසින් දේපළ, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් ඇති විය හැකි හානිකරණ දර්ශකයන්,තක්සේරු කර නැත. තක්සේරුව මත පදනම්ව, කිසිදු හානිකරණ දර්ශකයක් හඳුනාගෙන නොමැති අතර, එබැවින් දේපළ, වාර්තා කරන දිනයට පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් කිසිදු හානිකරණ ප්‍රතිපාදනයක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනයන්හි දැක්වීම අවශ්‍යවී නොමැත.

**18.7** දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම සඳහා ගිවිසුම්ගත බැඳීමේ වටිනාකම - වාර්තා කරනු ලබන දිනයට, දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම සඳහා කිසිදු ගිවිසුම්ගත බැඳීම් වටිනාකමක් නැත.

**18.8** **පු.ආ.උ (PPE) පසු මිනුම්**

විවෘත වෙළඳපොල වටිනාකම යොදාගෙන, වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් තක්සේරුකරුවන් විසින් ප්‍රතිප්‍රමාණනය සිදු කරනු ලබයි. වත්කම් කලින් කල ප්‍රතිප්‍රමාණනය සිදු කරන අතර, 2018 දී ප්‍රතිප්‍රමාණනය සිදු කරන ලදී. ත්‍යාගණනය කිරීම්, සෑම වසර 05 කට වරක්ම අභ්‍යන්තරිකව පත් කරන ලද කමිටුවක් විසින් හෝ අවශ්‍ය අවස්ථාවල දී, බාහිර තක්සේරුකරුවන් විසින් හෝ සිදු කරනු ලැබේ. ප්‍රතිප්‍රමාණනයේ අතිරික්තය වත්කමේ ශුද්ධ ධාරණ අගය මත හඳුනාගන්නා අතර, ප්‍රතිප්‍රමාණිත අගයෙන් වත්කම නැවත සටහන් කිරීමෙන් පසු ප්‍රතිප්‍රමාණන සංචිතයටකට මාරු කරනු ලැබේ. හඳුනා-නොගැනීමේ අවස්ථාවේ දී, රඳවාගත් ඉපැයුම් වෙත ප්‍රතිප්‍රමාණන සංචිතය මාරු කරනු ලැබේ.

**19** **මූල්‍ය ආයෝජනයන්**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - මූල්‍යමය ආයෝජනයන් වර්ගීකරණය - මණ්ඩලය විසින්, ණය සහ අයවිය යුතු දෑ ඒවා ආරම්භ වූ දිනය මත, මූලික වශයෙන් හඳුනා ගනු ලබයි. අනෙක් සියලුම වත්කම් (ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයට නියම කරන ලද වත්කම් ඇතුළුව), මණ්ඩලය මූල්‍ය උපකරණයේ ගිවිසුම්ගත ප්‍රතිපාදනයන් සඳහා පාර්ශවකරුවෙක් බවට පත් වන වෙළඳ දිනය මත මූලිකව හඳුනාගනු ලැබේ. මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගයක නොමැති අවස්ථාවක, මූල්‍ය වත්කමක්, එහි අත්පත් කර ගැනීමේ හෝ නිකුත් කිරීමේ ගනුදෙනු පිරිවැය ද එකතුව සාධාරණ අගයට මූලිකව ගනනය කරනු ලැබේ.

ආයෝජන වත්කම් රඳවා තබා ගැනීමේ සඳහා වන අභිප්‍රාය සහ හැකියාව මත රඳා පවතිමින්, මණ්ඩලය එහි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරනු ලබයි:

- ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගය (FVTPL);
- ණය සහ අයවිය යුතු දෑ (LydR);
- විකිණීමට ඇති (AFS) මූල්‍ය වත්කම්ත සහ
- කල්පිරෙන තෙක් රුඳවීම් (HTM), යෝග්‍ය පරිදි

කෙසේ නමුදු, වාර්තා කරනු ලබන දිනයට (2019-ශූන්‍ය), කල් පිරෙන තුරු රඳවා තබා ගන්නා ලද ආයෝජන ලෙස සහ සාධාරණ අගය තුලින් ලාභ හෝ අලාභ ආයෝජන ලෙස වර්ගීකරණය කරන ලද කිසිදු ආයෝජනයක් මණ්ඩලය සතුව නොතිබිණි.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - මූල්‍ය ආයෝජනයන් හඳුනා නොගැනීම - වත්කම් වලින් ලැබෙන මුදල් ප්‍රවාහයන් සඳහා වන ගිවිසුම්ගත අයිතිවාසිකම් කල් ඉකුත්වන විට හෝ මණ්ඩලය මූල්‍ය වත්කම් වල හිමිකාරීත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභයන් සැලකිය යුතු ලෙස පැවරෙන ගනුදෙනුවක මූල්‍ය වත්කම් මත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් ලැබීම සඳහා වන අයිතිය පවරනු ලබන විට, මණ්ඩලය විසින් මූල්‍ය වත්කම් හඳුනාගනු-නොලැබේ. මණ්ඩලය විසින් උපයන ලද හෝ රඳවා ගන්නා ලද පවරන ලද මූල්‍ය වත්කම් සම්බන්ධ යම් පොලියක්, වෙනම වත්කමක් හෝ

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

වගකීමක් ලෙස හඳුනාගනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - මූල්‍ය උපකරණ පියවා ගැනීම - මූල්‍ය වත්කම් සහ වගකීම් පියවනු ලබන අතර, මුදල් ශුද්ධ පදනම මත පියවීම සඳහා මණ්ඩලයට නෛතික අයිතිය ඇති විට සහ එක විට වත්කම් උපලබ්ධි කිරීමට සහ වගකීම් පියවීමට අදහස් කරන විට හෝ එවිට පමණක් ශුද්ධ අගය මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලැබේ.

මිනුම් කරනු ලබන ඝනය අනුව මණ්ඩලයේ මූල්‍ය ආයෝජනයන් පහත පරිදි සාරාංශ කරනු ලැබේ.

| ඝනය | මූල්‍ය වත්කම |
|---|---|
| ලාභය හෝ අලාභය තුලින් සාධාරණ අගය | නැත |
| විකිණීම සඳහා වන | භාණ්ඩාගාර බැඳුම්කර<br>භාණ්ඩාගාර බිල්පත් |
| ණය සහ අයවිය යුතු දෑ | REPO,<br>හදිසි REPO |
| කල්පිරෙන තෙක් රඳවා ගන්නා ලද | විදේශ විනිමය වර්ධන බැඳුම්කර<br>භාණ්ඩාගාර බැඳුම්කර |

මූල්‍ය ආයෝජනයන්ගේ සාධාරණ අගයන් ඒවායේ ධාරණ අගයන් සමගින් පහත වගුවේ දක්වා ඇත.

ලාභ අලාභ ආයෝජනයන් සහ විකිණීම සඳහා වන ආයෝජනයන් තුලින් සාධාරණ අගය සාධාරණ වටිනාකමකට අගය කර ඇත. ණය හා අයවිය යුතු ආයෝජනයන්, ක්‍රමක්ෂය පිරිවැයට අගය කර ඇත.

ආවේණික ලක්ෂණ මත පදනම්ව මූල්‍ය ආයෝජනයන් විශ්ලේෂණය - එක් එක් මූල්‍ය උපකරණ වර්ගයේ ලක්ෂණ මත පදනම්ව ඇති මූල්‍ය ආයෝජනයන් පිළිබඳව අනාවරණයක් පහත සටහන් මගින් ඉදිරිපත් කරනු ලබයි.

**19.1** ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගය, ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ලාභ හෝ අලාභ ආයෝජනයන් තුලින් සාධාරණ අගය හඳුනා ගැනීම - ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගය මූලික වශයෙන් හඳුනාගැනීම මත, ව්‍යාපාරික කටයුතු සඳහා රඳවාගෙන ඇති සහ තෝරාගනු ලැබූ මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ තුලින් සාධාරණ අගය සහිත මූල්‍ය වත්කම් වලට ඇතුලත් වේ. නුදුරු අනාගතයේ දී විකිණීමේ අරමුණ සහිතව විශේෂයෙන් ම මිලදී ගන්නා ලද ආයෝජනයන්, වෙළඳාම සඳහා රඳවාගත් වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ආරෝපිත ගනුදෙනු පිරිවැය, ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි වියදම් කරන ලද පිරිවැය ලෙස හඳුනාගනු ලබයි. මෙම ආයෝජනයන් මූලික වශයෙන්, සාධාරණ අගයෙන් වාර්තා කරනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් පසු, ඒවා සාධාරණ අගයට නැවත ගනනය කරනු ලැබේ.

සාධාරණ අගයේ සිදු වන වෙනස්කම්, ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි 'ලාභ සහ අලාභ සාධාරණ අගය' යටතේ වාර්තා කරනු ලැබේ. නුදුරු කාල සීමාවක දී ඒවා විකිණීම සඳහා වන අදහස තවදුරටත් යෝග්‍ය ද යන්න සලකා බැලීම මගින්, ලාභ හෝ අලාභ (වෙළඳාම සඳහා රඳවාගත්) තුලින් සාධාරණ අගයට, මණ්ඩලය විසින් එහි මූල්‍ය වත්කම් අගයනු ලැබේ.

**19.2** ණය සහ අයවිය යුතු දෑ - ණය සහ අයවිය යුතු දෑ හඳුනා ගැනීම – ණය සහ අය විය යුතු දෑ යනු, සක්‍රීය වෙළඳපොලෙන් ගෙන හැර දැක්විය නොහැකි ස්ථාවර සහ තීරණය කළ හැකි ගෙවීම් සහිත මූල්‍ය වත්කම් වේ. මෙම ආයෝජනයන්, අත්පත් කර ගැනීම සඳහා වූ හිලව් ගෙවීමේ සාධාරණ අගය වන පිරිවැය මගින්, මූලික වශයෙන් මෙම ආයෝජනයන් හඳුනා ගනු ලැබේ. අත්පත් කර ගැනීමට සෘජුවම සම්බන්ධ වන සියලු ගනුදෙනු පිරිවැය ද, ආයෝජන පිරිවැය තුල අන්තර්ගත වේ. මූලික ගනනය කිරීමෙන් පසු, හානිකරණය සඳහා දීමනාව අඩු කර, EIR යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට ගනනය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේ දී, යම් වට්ටමක් හෝ වාරිකයක් තිබේ නම් සහ EIR හි අත්‍යවශ්‍ය අංගයක් වන ගාස්තු හෝ පිරිවැය සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය ගනනය කරනු ලැබේ. හානිකරණය මගින් පැන නගින EIR ක්‍රමක්ෂය ලාභ සහ අලාභ ප්‍රකාශනයේ අන්තර්ගත කරනු ලබන අතර, ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

ආයෝජනයන් හඳුනා නොගන්නා හෝ හානිකරණය කරන විට, මෙන්ම ක්‍රමක්ෂණ ක්‍රියාවලිය තුලින් ද, ලාභ හෝ අලාභ, ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ. නැවත මිලදී ගැනීමේ ආයෝජනයන් තුල, ණය සහ ලැබිය යුතු දෑ අඩංගු වේ.

**19.2.1** නැවත මිලදී ගැනීමේ ගිවිසුම් - මණ්ඩලයේ නැවත මිලදී ගැනීමේ ගිවිසුම් මගින්, ISIN අංක සහිතව පවරන ලද රජයේ සුරුකුම්පත් හා සාපේක්ෂව පූර්ණ වශයෙන් ආරක්ෂිත මහජන බැංකුව, ලංකා බැංකුව සහ cdbne අරමුදල් කළමනාකරණ (පුද්) සමාගම සමග සංචිත නැවත මිලදී ගැනීමේ ගිවිසුම් (REPO) තුල ආයෝජනය කර ඇත. විවිධ කල්පිරීම් මත රඳා පවතිමින්, හිඟ ශේෂයන් සඳහා සෘජුව ප්‍රතිශතයන් 5.3% - 8.45% පරාසයේ විය.

**19.3 විකිණීම සඳහා වන ආයෝජන**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - විකිණීම සඳහා වන ආයෝජන හඳුනා ගැනීම - විකිණීම සඳහා වන ආයෝජන සඳහා භාණ්ඩාගාර බිල්පත් සහ සුරුකුම්පත් ඇතුලත් විය හැකිය.

මූලික මිනුම්කරණයෙන් පසු, විකිණීම සඳහා වන සංචිත යටතේ වෙනත් ආකාරයකින් පුළුල් ලෙස හඳුනා ගන්නා ලද උපලබ්ධි නොවූ ලාභ හෝ අලාභ මගින් සාධාරන අගයකට සැලකිය යුතු ලෙස මනින ලද ආයෝජනයන්, විකිණීම සඳහා වන මූල්‍ය ආයෝජනයන් වේ. විකිණීම සඳහා වන ආයෝජනයන් රඳවා ගනිමින් උපයන ලද පොලිය, EIR භාවිතයෙන් 'පොලී ආදායම' ලෙස වාර්තා කරනු ලැබේ. වත්කම හඳුනා නොගන්නා විට, ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි සමුච්චිත ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම්, ලාභ හෝ අලාභ ප්‍රකාශනයට මාරු කරනු ලැබේ. වත්කම හානිකරණය වන බවට නීර්ණය කරනු ලබන්නේ නම්, සමුච්චිත අලාභය ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලබන අතර, විකිණීම සඳහා වන සංචිතයෙන් ඉවත් කරනු ලැබේ.

මණ්ඩලය, එහි විකිණීම සඳහා වන මූල්‍ය වත්කම් නුදුරු අනාගතයේ දී විකුණා දැමීම යෝග්‍ය යැයි තවදුරටත් අදහස් කරන්නේ ද සහ ඒ සඳහා හැකියාව ඇත්දැයි යන්න අගයනු ලැබේ. කලාතුරකින් ඇති වන අවස්ථාවන්හි දී, අක්‍රීය වෙළඳපොල හේතුවෙන්, මෙම වත්කම් විකිණීමට මණ්ඩලය අපොහොසත් වේ. එහිදී, පුරෝකථනය කළ හැකි අනාගතය සඳහා හෝ කල් පිරෙන තුරු වත්කම් රඳවා තබා ගැනීම සඳහා කළමණාකරණය අදහසක් සහ හැකියාවක් ඇත් නම්, මෙම මූල්‍ය වත්කම් නැවත වර්ගීකරණය කිරීම මණ්ඩලයට තෝරා ගත

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

හැකිය. මූල්‍ය වත්කම් ණය සහ අයවිය යුතු දෑ සම්බන්ධයෙන් වන අර්ථකතනය සපුරාලන්නේ නම්, පුරෝකථනය කළ හැකි අනාගතය සඳහා හෝ කල් පිරෙන තුරු වත්කම් රඳවා තබා ගැනීම සඳහා කළමණාකරණය අදහසක් සහ හැකියාවක් ඇති විට, ණය සහ අයවිය යුතු දෑ නැවත වර්ගීකණයට අවසර ලබා දෙනු ලැබේ. කල් පිරෙන ආයෝජන සඳහා පවත්වනු ලබන නැවත වර්ගීකරණය සඳහා අවසර දෙනු ලබන්නේ, කල් පිරෙන තුරු මූල්‍ය වත්කම් රඳවා තබා ගැනීමේ අදහස සහ හැකියාව ආයතනය සතු විට පමණි.

විකිණීම සඳහා වන සනයෙන් පිටත වර්ගීකණය කරන ලද මූල්‍ය වත්කමක් සඳහා, වර්ගීකරණය සිදු කරන දිනයට සාධාරණ අගය එහි නව ක්‍රමක්ෂය අගය බවට පත් වන අතර, EIR භාවිතයෙන් ආයෝජනයේ ඉතිරි ආයු කාලය සම්බන්ධයෙන් වන ලාභ හෝ අලාභ ප්‍රකාශනය සඳහා, හිමිකාරීත්වය තුල හඳුනා ගෙන ඇති එම වත්කමේ යම් පූර්ව ලාභ හෝ අලාභ ක්‍රමක්ෂය කරනු ලැබේ. නව ක්‍රමක්ෂය පිරිවැය සහ කල් පිරීමේ අගය අතර යම් වෙනසක්, EIR භාවිතයෙන් ඉතිරි ආයු කාලය සඳහා ද ක්‍රමක්ෂය කරනු ලැබේ. වත්කම සැලකිය යුතු ලෙස හානිකරණය විය යුතු නම්, හිමිකාරීත්වයට වාර්තා කරන ලද අගය ලාභ හෝ පාඩු ප්‍රකාශනය සඳහා නැවත වර්ගීකරණය කරනු ලැබේ.

**19.3.1** විකිණීම සඳහා වන මූල්‍ය ආයෝජනයන් හානිකරණය - වාර්තා කරන දිනයට, කල් ඉක්ම වූ හෝ හානිකරණය වූ කිසිදු විකිණීම සඳහා වන මූල්‍ය වත්කමක් නැත.

## 20 ප්‍රතිරක්ෂණ ලැබීම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ප්‍රතිරක්ෂණ ලැබීම් - සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වල අවදානම, මණ්ඩලය විසින් එහි සියලුම ව්‍යාපාර සඳහා අදාල කරනු ලැබේ. ප්‍රතිරක්ෂණ ලැබීම් මඟින්, ප්‍රතිරක්ෂණ සමාගම් මඟින් අය වීමට ඇති ශේෂයන් නියෝජනය වේ. නොගෙවූ හිමිකම් ප්‍රතිපාදනය හෝ රක්ෂණකරුගේ ප්‍රතිපත්ති හා සම්බන්ධ සහ අදාල ප්‍රතිරක්ෂණ පිවිසුම හා අනුකූල වන ගෙවන ලද හිමිකම් සමඟ අනුකූල වන ආකාරයෙන් ප්‍රතිරක්ෂකයින්ගෙන් අය විය යුතු මුදල් ඇස්තමේන්තු කරනු ලැබේ.

නැවත පවරා දෙන ලද ප්‍රතිරක්ෂණ සැලසුම් ගිවිසුම් හිමියන් සඳහා වන මණ්ඩලයේ බැඳීම මුදා හරිනු නොලැබේ.

ලැබුණු හෝ ලැබීමට ඇති මුදලේ සාධාරණ අගයට මූලිකව හඳුනා ගැනීම මත ගෙවීමට ඇති විට සහ ගනනය කර ඇති විට, ප්‍රතිරක්ෂණ ලැබීම් ප්‍රමාණ හඳුනා ගනු ලැබේ.

ගිවිසුම්ගත අයිතිවාසිකම් ශූන්‍ය වන විට හෝ කල් ඉකුත් වන විට හෝ ගිවිසුම වෙනත් පාර්ශවයකට පවරන විට, ප්‍රතිරක්ෂණ වත්කම් හඳුනාගනු නොලැබේ.

වාර්තා කරනු ලබන වර්ෂය තුල, හානිකරණ දර්ශකයක් ඉස්මතු වන විට, එක් එක් වාර්තා කරන දිනයක හෝ ඊට වඩා වැඩි වාර ගනනක හානිකරණය සඳහා ප්‍රතිරක්ෂණ වත්කම් සමාලෝචනය කරනු ලැබේ. ගිවිසුමේ කොන්දේසි යටතේ ගෙවීමට ඇති කල් ඉකුත් මුදල මණ්ඩලයට ලබා ගත නොහැකි වීම සහ මණ්ඩලයට ප්‍රතිරක්ෂකයින්ගෙන් ලැබෙන මුදල් මත විශ්වසනීය ලෙස මිනිය හැකි බලපෑමක් සහිත සිදු වීම, ප්‍රතිරක්ෂණ වත්කමේ මූලික හඳුනා ගැනීමට පසු සිදු වන සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විෂය මූලික සාක්ෂි ඇති විට හානිකරණය සිදු වේ. හානිකරණ අලාභය ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි වාර්තා කරනු ලැබේ.

## 21 රක්ෂණ ලැබීම්

රක්ෂණ ලැබීම් - රක්ෂණ ලැබීම් වල සාධාරණ අගයට මූලික හඳුනා ගැනීම මත ගෙවීමට ඇති විට සහ ගනනය කර ඇති විට රක්ෂණ ලැබීම් ලෙස හඳුනා ගනු ලැබේ. මූලික හඳුනාගැනීමට පසුව, ක්‍රමක්ෂය පිරිවැයට රක්ෂණ ලැබීම් මනිනු ලැබේ. ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වාර්තා කරන ලද හානිකරණය මඟින්, ධාරණ මුදල් ලබා ගත නොහැකි බව සිදුවීම් හෝ අවස්ථාවන් දක්වා සිටින ඕනෑම අවස්ථාවක හානිකරණය සඳහා රක්ෂණ ලැබීම් වල ධාරණ අගය සමාලෝචනය කරනු ලැබේ. මූල්‍ය වත්කම් සඳහා හඳුනා නොගැනීමේ නිර්ණායකට අනුකූල වන විට රක්ෂණ ලැබීම් හඳුනාගනු නොලැබේ.

ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිසම (IRCSL) විසින් නිකුත් කරන ලද වාරික ගෙවීමේ වගකීමට (PPW) අනුව, සියලුම සාමාන්‍ය රක්ෂණ ගිවිසුම් PPW යටත්ව නිකුත් කරනු ලබන අතර, නොගෙවන්නේ නම් දින 60ක කල් ඉකුත් වීම මත අවලංගු වේ.

කෙසේ නමුදු, RI සහ SRCC වැනි අනිවාර්ය රක්ෂණ යෝජනාක්‍රම සඳහා සහ රජයේ ආයතන වලින් ලැබෙන වාරික ලැබීම්, අවලංගු නොවේ/මෙම පාර්ශව වලින් නැවත අයකර ගැනීම නිශ්චිත බැවින් දින 60කින් පසු කල් ඉකුත් වීමෙන් පසු ද අවරණය සපයනු ලැබේ.

රජයේ ආයතන සහ සෞඛ සහ SRCC වැනි අනිවාර්ය රක්ෂණ යෝජනාක්‍රම සඳහා හැර, වෙනත් පුද්ගලික පාර්ශවයන් සඳහා ද මණ්ඩලය විසින් PPW උපයෝජනය කර ඇති බැවින්, ලැබිය යුතු වාරික වල දිගු කාලීන නොගෙවන ලද ශේෂයක් නැත. එබැවින්, පහත පරිදි, සාමාන්‍ය රක්ෂණය, මෝටර් වාහන සහ මෝටර් වාහන නොවන රක්ෂණ සඳහා සපයනු ලබන අගයන්ට වඩා අමතර හානිකරණ අලාභ ප්‍රතිපාදනයක් සඳහා අවශ්‍යතාවයක් නැත:

50% සපයනු ඇත - > දින 60 < දින 90

100% සපයනු ඇත - > දින 90

**ප්‍රතිරක්ෂණය**

| වයස | 2020 | 2019 |
|---|---:|---:|
| දින 30 දක්වා | 41,598,382 | 72,195,682 |
| දින 31 සිට 60 දක්වා | 19,169,527 | 172,692,828 |
| දින 61 සිට 365 දක්වා | 755,909,721 | 409,991,631 |
| දින 3650 වැඩි | 451,128,820 | 302,332,943 |
| | 1,267,806,450 | 957,213,084 |

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

**මෝටර් රථ**

| | | |
|---|---|---|
| දින 30 දක්වා | 3,304,755 | 9,700,788 |
| දින 31 සිට 60 දක්වා | 2,181,646 | 9,064,058 |
| දින 61 සිට 365 දක්වා | 4,652,398 | 16,321,752 |
| දින 365ට වැඩි | 467,366 | 1,121,030 |
| | 10,606,165 | 36,207,628 |

**මෝටර් රථ නොවන**

| වයස | 2020 | 2019 |
|---|---|---|
| දින 30 දක්වා | 45,532,523 | 49,136,967 |
| දින 31 සිට 60 දක්වා | 535,425 | 2,227,274 |
| දින 61 සිට 365 දක්වා | 11,830,708 | 7,278,411 |
| දින 365ට වැඩි | 12,514,249 | 3,563,364 |
| | 70,412,904 | 62,206,015 |

## 22 විලම්බිත වියදම්

අත්පත් කරගැනීමේ වියදම් - නව ව්‍යාපාරයක නිෂ්පාදනයට සෘජු සබඳතාවයක් සහිත සහ වෙනස් විය හැකි කොමිස් මුදල්, ප්‍රතිරක්ෂණය, අලෙවිකරණය සහ රක්ෂණ ගිවිසුම් පිරිවැය ඇතුළු නව ව්‍යාපාරයක් අත්පත් කර ගැනීමේ පිරිවැය ආකාරයට, අනාගත වාරිකයන්ගෙන් අයකර ගත හැකි තරම් දුරට මෙම පිරිවැය ප්‍රමාද වේ. අනෙක් සියලුම අත්පත් කර ගැනීමේ පිරිවැය සිදු කරන විටම හඳුනා ගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් පසු, විලම්බිත අත්පත් කර ගැනීමේ පිරිවැය (DAC) නොඉපයූ වාරිකය ක්‍රමක්ෂය කිරීමේ පදනම මත වන කාල සීමාවක් සඳහා ක්‍රමක්ෂය කරනු ලැබේ.

අපේක්ෂිත සඵල ආයු කාලයේ වෙනස්කම්, හෝ වත්කමේ අඩංගු අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ පරිභෝජන රටාවේ අපේක්ෂිත රටාව, ක්‍රමක්ෂය කාල සීමාව වෙනස් වීම මඟින් සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස් වීමක් ලෙස සැලකීම මඟින් ගනනය කරනු ලැබේ.

අදාල ගිවිසුම් කල් ඉකුත් වීම හෝ අවලංගු වීම සිදු වූ විට DAC හඳුනාගනු නොලබයි.

බොහෝ විට හානිකරණයක් ඉස්මතු වන බවට දර්ශකයක් ඇති විට හෝ සෑම වාර්තා කරන දිනකම, DAC හි හානිකරණ සමාලෝචනයක් සිදු කරනු ලැබේ. අයකර ගත හැකි මුදල ධාරණ අගයට වඩා අඩුවන විට, ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හානිකරණ අලාභයක් හඳුනාගනු ලැබේ. සෑම වාර්තාකරනු ලබන කාල සීමාවක් සඳහා ම, වගකීම ප්‍රමාණවත්භාවයේ පරීක්ෂණයෙහි ද ඊට සලකා බලනු ලැබේ.

ප්‍රතිරක්ෂණ කොමිස් - ප්‍රතිරක්ෂණ ගිවිසුම් වලින් බැහැරට ලැබිය හැකි කොමිස් මුදල්, අපේක්ෂිත ගෙවිය යුතු වාරික කාල සීමාව තුල සෘජු-රේඛා පදනමක් මත ප්‍රමාද වේ.

## 23 වෙනත් වත්කම්

වෙනත් වත්කම් හඳුනා ගැනීම - යම් හානිකරණ අලාභයන් අඩු කරන ලද පිරිවැයට, මූල්‍ය නොවන වත්කම් අඩංගු වෙනත් වත්කම් හඳුනා ගනු ලැබේ.

**කාර්ය මණ්ඩල ණය**

මෙයට, මණ්ඩලයේ කාර්ය මණ්ඩලය වෙත ලබා දෙනු ලබන ආපදා ණය, ණය සහ උත්සව අත්තිකාරම් අන්තර්ගත වේ. මණ්ඩලයේ අධ්‍යක්ෂවරුන්ට කිසිදු ණයක් හෝ අත්තිකාරම් ලබා දෙනු නොලැබේ.

**මෘදු ණය**

මෙම ණය, SRCC හා T අරමුදලෙන් ලබා දෙන අරමුදල් සඳහා ලංකා බැංකුව මඟින් ත්‍රස්ත ප්‍රහාරයන් මඟින් බලපෑමට ලක් වූ ආයතන/හෝටල් සඳහා ප්‍රදානය කරනු ණයයි.

අයකර ගත හැකි බදු - මණ්ඩලයට අයකර ගත හැකි බදු වලට, අය විය යුතු රඳවා ගැනීමේ බද්ද (WHT) සහ අය විය යුතු ආර්ථික සේවා ගාස්තුව ඇතුලත් වේ (ESC).

අයවිය යුතු ESC- 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු ප්‍රතිපාදන අනුව, නිශ්චිත ප්‍රතිශතයකට වගකිව යුතු ආදායම මත ගෙවිය යුතුය. ESC ආදායම් බදු වගකීමෙන් අඩු කළ හැකිය. යම් හිමිකම් දක්වා නැති අයවිය යුතු ESC මුදලක් ඉදිරියට ගෙන යා හැකි අතර, පනතේ අදාල ප්‍රතිපාදන අනුව ආදායම් බදු හා සංසන්දනාත්මකව පියවිය හැකිය.

භාණ්ඩ ලේඛන හඳුනා ගැනීම - භාණ්ඩ ලේඛන හඳුනා ගැනීමට, පිරිවැයෙහි පහළින් සඳහන් සියලු පරිභෝජනය කළ හැකි අයිතමයන් සහ ශුද්ධ උපලබ්ධි විය හැකි අගය ඇතුලත් වේ.

## 24 මුදල් සහ බැංකු ශේෂයන්

මුදල් සහ බැංකු ශේෂය - මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි සඳහන් මුදල් සහ බැංකු ශේෂයට, වටිනාකම වෙනස් වීමේ සුළු අවදානමකට ලක් විය හැකි බැංකුවේ ඇති මුදල් සහ අතැති මුදල් ඇතුලත් වේ.

**මුදල් සහ මුදල් සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි කාර්ය සඳහා මුදල් සහ මුදල් සමාන දෑ වල අංගයක් ලෙස, මුදල් කළමනාකරණයේ පූර්ණ කොටසක් නිර්මාණය කරන බැංකු අයිරා සහ ඉතිරි කිරීමේ ගිණුම් ඇතුලත් වේ. බැංකු අයිරා, මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි වගකීම් යටතේ ඇතුලත් කරනු ලැබේ. මණ්ඩලය බැංකු මඟින් කිසිදු බැංකු අයිරා පහසුකමක් ලබාගෙන නොමැත. කෙසේ නමුදු, ශේෂ පත්‍රයෙහි බැංකු අයිරා ශේෂයක් දක්වනු ලැබේ.

## 25 රඳවාගත් ඉපැයුම්

## 26 විකිණීම සඳහා වන සංචිතයන්

විකිණීම සඳහා වන සංචිතයන් - විකිණීම සඳහා වන සංචිතයන් තුල විකිණීම සඳහා වන මූල්‍ය වත්කම් වල සාධාරණ අගයෙහි සමුච්චිත ශුද්ධ වෙනස අඩංගු වන අතර, අදාල වත්කම් හඳුනා නොගැනීම හෝ හානිකරණය වන තෙක් ඉදිරියට රැගෙන යනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

**27 නැවත අගයකරනු ලබන සංචිතයන්**

LKAS 19 - සේවක ප්‍රතිලාභ සඳහා අවශ්‍ය වන පරිදි, පාර්තෝෂික වගකීම් ඇගයීම තුළින් ඉස්මතු වන ආයුගණක ප්‍රතිලාභයන්/(අලාභයන්) වෙනත් සංචිතයන් තුල අන්තර්ගත වේ.

**28 රක්ෂණ ගිවිසුම් වගකීම්**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ශුද්ධ නොඉපයූ වාරික සඳහා ප්‍රතිපාදන - මෙතෙක් කල් ඉකුත් නොවූ අවදානම් සඳහා ලද වාරික, නොඉපයූ වාරිකයන් සඳහා ප්‍රතිපාදන මඟින් නියෝජනය වේ. සාමාන්‍යයෙන්, ගිවිසුමේ කොන්දේසි මත සංචිත නිදහස් කරනු ලබන අතර, වාරික ආදායම ලෙස හඳුනා ගනු ලැබේ. වාර්තා කරන සෑම දිනකම, අපේක්ෂිත හිමිකම් වල යම් සමස්ථ අතිරික්තයක් තිබේ ද සහ නොඉපයූ වාරිකයන් මත විලම්බිත අත්පත් කර ගැනීමේ පිරිවැය තිබේ ද යන්න යන්න නිර්ණය කිරීම සඳහා, මණ්ඩලය එහි කල් ඉකුත් නොවූ අවදානම් සමාලෝචනය කර වගකීම ප්‍රමාණවත්භාවයේ පරීක්ෂණයක් සිදු කරනු ලබයි. අදාල ජීවිත-නොවන රක්ෂණ තාක්ෂණික ප්‍රතිපාදනයන් සඳහා අදාල වත්කම් මත පැන නගී යැයි අපේක්ෂිත ආයෝජන ප්‍රතිලාභයන් සැලකිල්ලට ගැනීමෙන් පසු අනාගත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් හි වර්තමාන ඇස්තමේන්තු මෙම ගනනය කිරීම සඳහා යොදා ගනු ලැබේ. මෙම ඇස්තමේන්තු මඟින්, නොඉපයූ වාරිකයන්ගේ ධාරණ අගය ප්‍රමාණවත් නොවේ යැයි දැක්වේ නම්, වගකීමේ ප්‍රමාණවත්භාවය සඳහා ප්‍රතිපාදනයක් ස්ථාපනය මඟින් ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හිඟය හඳුනාගනු ලැබේ.

ශ්‍රීලංමුවාප්‍ර 4 - රක්ෂණ ගිවිසුම්, සඳහා අවශ්‍ය පරිදි, මණ්ඩලය විසින් බාහිර ආයුගණකයෙකුගේ සහාය ගෙන ජීවිත-නොවන රක්ෂණ ගිවිසුම් වගකීම් සම්බන්ධයෙන් වගකීම ප්‍රමාණවත්භාවයේ පරීක්ෂණයක් (LAT) සිදු කරනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - දළ නොගෙවූ හිමිකම් සඳහා ප්‍රතිපාදන - ගිවිසුම් වලට එළඹෙන විට සහ වාරික අය කරන විට, ජීවිත-නොවන රක්ෂණ ගිවිසුම් වගකීම් හඳුනා ගනු ලැබේ. වගකීම් යනුවෙන්, සියලුම හිමිකම් ගෙවීමේ තක්සේරු කරන ලද අවසන් පිරිවැය මත පදනම් වූ නොගෙවන ලද හිමිකම් ප්‍රතිපාදනයක් ලෙස හඳුනාගනු ලබන නමුත්, හිමිකම් ගෙවීම් පරිහරණය කිරීමේ පිරිවැය සහ ගලවා ගැනීමේ අපේක්ෂිත අගය සහ වෙනත් අය කිරීම් හා සම්බන්ධව වර්තා කරන ලද හෝ නොකරන ලද වුවද වාර්තා කරන දිනයට ගෙවා නොමැත.

මුදලේ කාලීන වටිනාකම සඳහා වගකීම අඩු කරනු නොලැබේ. සමතාකරණය හෝ ව්‍යසන සංචිත සඳහා කිසිදු ප්‍රතිපාදනයක් හඳුනාගෙන නොමැත. ගිවිසුම කල් ඉකුත් වන විට, වගකීම් හඳුනා නොගැනීම, ගෙවා අවසන් කිරීම හෝ අවලංගු කිරීම සිදු වේ.

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - සිදු කරන ලද දළ ගෙවීම් සඳහා ප්‍රතිපාදන, නමුත් වාර්තා කරන ලද හිමිකම් නොවේ - සමහර වර්ග වල හිමිකම් ගෙවීම් දැනුම් දීම සහ ගෙවීමෙහි ප්‍රමාදයන් සිදු විය හැකිය, එබැවින් මේවායේ අවසන් පිරිවැය වාර්තා කරන දිනය වන විට නිශ්චිතව දැනගත නොහැකිය. පරීක්ෂණාත්මක දත්ත සහ දැඩි අපගමනයක් සඳහා අන්තයක් ඇතුලත් විය හැකි වර්තමාන උපකල්පනයන් මත පදනම්ව සම්මත ආයුගණක හිමිකම් ප්‍රක්ෂේපණ පරාසයක් භාවිතයෙන් වාර්තා කරන දිනයට වගකීම ගනනය කරනු ලැබේ.

ජීවිත-නොවන රක්ෂණ ගිවිසුම් සඳහා, වාර්තා කරන දිනයට වාර්තා කරන ලද අපේක්ෂිත අවසන් හිමිකම් පිරිවැය සඳහා සහ වාර්තා කරන දිනයට හිමිකම් ගෙවන ලද නමුත් වාර්තා නොකරන ලද ඃෂර්භසඃ* අපේක්ෂිත අවසන් පිරිවැය යන දෙකම සඳහා ඇස්තමේන්තු සැකසිය යුතු වේ. නිශ්චිතතාවයකින් යුතුව අවසන් හිමිකම් ගෙවීමේ පිරිවැය ස්ථාපනය කිරීමට පෙර සැලකිය යුතු කාල සීමාවක් ගනු ලබන අතර, සමහර වර්ග වල රක්ෂණ ගිවිසුම් සඳහා, ෂර්භසඃ හිමිකම් ගෙවීම්, මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි වගකීමේ ප්‍රධාන කොටස නිර්මාණය කරයි.

චේන් ලැඩර් ක්‍රමවේදය, බෝන්හෙටර්-ෆර්ගියුසන් ක්‍රමවේදය සහ සංඛ්‍යාත/බරලපතලභාවය ක්‍රමවේදය වැනි සම්මත ආයුගණක හිමිකම් ප්‍රක්ෂේපන තාක්ෂණයන් පරාසයක් භාවිතයෙන්, නොගෙවූ හිමිකම් වල අවසන් පිරිවැය ඇස්තමේන්තු කරනු ලැබේ.

මෙම තාක්ෂණයන්ගේ ගැබ්ව ඇති ප්‍රධාන උපකල්පනය වන්නේ, සමාගමේ අතීත හිමිකම් වර්ධන අත්දැකීම අනාගත හිමිකම් වර්ධනය ප්‍රක්ෂේපණය කිරීමට යොදා ගැනීමට සහ එමඟින් අවසන් හිමිකම් පිරිවැය සොයා ගැනීමට හැකි බවයි.

එහෙයින්, පෙර වර්ෂ වල නිරීක්ෂණය කරන ලද වර්ධනයන් මත පදනම්ව හිමිකම් සහ හිමිකම් ගනන අනුව ගෙවන ලද සහ සිදුවන ලද අලාභ, සාමාන්‍ය පිරිවැය වර්ධනය සහ අපේක්ෂිත අලාභ අනුපාතිකයන් මෙම ක්‍රමවේදන මඟින් අනුමානය කළ හැකිය. අතීත හිමිකම් ගෙවීම් වර්ධනය අනතුරු වර්ෂය මඟින් ප්‍රධාන වශයෙන් විශ්ලේෂණය කරනු ලබන නමුත්, භූගෝලීය ප්‍රදේශය, මෙන්ම සැලකිය යුතු ව්‍යාපාරික මාර්ග සහ හිමිකම් වර්ග අනුව ද වැඩිදුරටත් විශ්ලේෂණය කළ හැකිය. විශාල හිමිකම් ගෙවීම්, අලාභ සීරු මාරු කිරීමේ ඇස්තමේන්තු වල මුහුණත් අගයට වෙන් කිරීම මඟින් හෝ ඒවායේ අනාගත වර්ධනයන් විද්‍යාමාන වීම සඳහා වෙන් වෙන් වශයෙන් ප්‍රක්ෂේපිත ක්‍රමයක් මඟින් වෙනම සලකා බලනු ලැබේ.

බොහෝ අවස්ථා වලදී, අනාගත හිමිකම් උද්ධමනය හෝ අලාභ අනුපාතිකයන්ගේ ප්‍රතිශතය සම්බන්ධයෙන් කිසිදු පැහැදිලි උපකල්පනයන් සිදු කර නොමැත. ඒ වෙනුවට, යොදා ගන්නා උපකල්පනයන් වන්නේ, ප්‍රක්ෂේපනයන් පදනම් කරගත් පැහැදිලි අතීත හිමිකම් ගෙවීම් වර්ධන දත්තය.

සම්බන්ධිත සියලු අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගනිමින්, ඇති විය හැකි ප්‍රතිඵලයන් පරාසයකින් සිදු විය හැකි ප්‍රතිපලය ලබා දෙන ඇස්තමේන්තු කරන ලද හිමිකම් ගෙවීම් වල අවසන් පිරිවැයට එළඹීම සඳහා අතීත නැඹුරුතාවයන් අනාගතයේ දී යොදා ගත මට්ටමට (උදාහරණ ලෙස, එක් වරක් පමණක් සිදු වන සිදුවීම්, හිමිකම්පෑම් පිළිබඳ මහජන ආකල්ප වැනි බාහිර හෝ වෙළඳපොල සාධකයන්ගේ වෙනස් වීම්, ආර්ථික තත්වයන්, හිමිකම් උද්ධමනයේ මට්ටම්, අධිකරණ තීරණ සහ ව්‍යාවස්ථාදායකය මෙන්ම කළඹ මිශ්‍රණය වැනි අභ්‍යන්තර සාධක, ප්‍රතිපත්ති විශේෂාංග සහ හිමිකම් හැසිරවීමේ ක්‍රියා පටිපාටි) තක්සේරු කිරීම සඳහා අමතර ගුණාත්මක තීරණ යොදා ගනු ලැබේ.

නොඉපයූ වාරිකයන් සඳහා, ප්‍රමාණාත්මකභාවය තක්සේරු කිරීමේ දී, සමාන තීරණයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් යොදා ගනු ලැබේ.

රක්ෂණ ගිවිසුම් වගකීම් සම්බන්ධයෙන් හිමිකම් වර්ධන වගු සහ සංවේදීතා විශ්ලේෂණයන්, අවදානම් කළමනාකරණ සටහනෙහි අන්තර්ගත වේ.

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

**28.1 රක්ෂණ ගිවිසුම් වගකීම්**

**28.2 ශුද්ධ නොඉපයූ වාරික සඳහා ප්‍රතිපාදන**

**28.3 දළ නොගෙවූ හිමිකම් සඳහා ප්‍රතිපාදන**

**28.4 දළ IBNR හිමිකම් සඳහා ප්‍රතිපාදන**

**28.5 රක්ෂණ ප්‍රතිපාදන සහ තාක්ෂණික සංචිතයන් සැසඳීම**

**28.6** වගකීම ප්‍රමාණාත්මකභාවයේ පරීක්ෂණය - නොඉපයූ වාරිකයන් සඳහා වන ප්‍රතිපාදනයන්ගේ ධාරණ අගයෙහි ප්‍රමාණාත්මකභාවය තක්සේරු කිරීම සඳහා ශ්‍රීලංමූවාප්‍ර 4 - රක්ෂණ ගිවිසුම්, ප්‍රමිතියේ අවශ්‍යතාවය පරිදි, 2019 දෙසැම්බර් 31 දිනට වෘත්තීය ආයුගණකවරුන්ගේ ආයතනයක් වන NMG මූල්‍ය සේවා උපදේශන පුද් සමාගම මඟින් වගකීම ප්‍රමාණාත්මකභාවයේ පරීක්ෂණයක් (LAT) සිදු කරන ලදී. අන්තර්ජාතිකව පිළිගත් ආයුගණක ක්‍රමවේදයන් මත පදනම්ව ඇගයීම, කාර්තු පදනමක් මත සිදු කරන ලදී. NMG මූල්‍ය සේවා උපදේශන පුද් සමාගම මඟින් නිකුත් කරන ලද වාර්තාවට අනුව, මණ්ඩලය විසින් ඉදිරියට ගෙන යන ලද වගකීම ප්‍රමාණවත් විය. එබැවින්, 2020 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා (2019 ශුන්‍ය) වාරික ඌණතාවය සඳහා කිසිදු ප්‍රතිපාදනය සැලසීම සිදු නොවීය.

**28.7** IBNR සහ IBNER ඇගයීම - 2019 දෙසැම්බර් 31 දිනට, NMG මූල්‍ය සේවා උපදේශන පුද් සමාගම මඟින් ගෙවන ලද නමුත් වාර්තා නොකරන ලද හිමිකම් සංචිත ආයුගණක ලෙස පරිගණක ගත කරන ලදී.

**28.8** උපකල්පනයන්ගේ වෙනස් වීම් - 2020 දෙසැම්බර් 31 දිනට, ශේෂය සඳහා පෙර සිදු කරන ලද ඇගයීමක කිසිදු භෞතික ඇස්තමේන්තු වෙනසක්ම් නොවීය.

**29 සේවක නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්**

නිශ්චිත ප්‍රතිලාභ සැලසුමක් යනු, නිශ්චිත දායකත්වස සැලසුම හැර හිටපු-සේවක ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම සම්බන්ධයෙන් වන මූල්‍ය ප්‍රකශනයන්හි හඳුනා ගන්නා වගකීමේ ප්‍රමාණය , වාර්තා කරන දිනයට නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගයයි. LKAS -19 සේවක ප්‍රතිලාභ මඟින් නිර්දේශ කර ඇති පරිදි ප්‍රක්ෂේපිත ඒකක ණය (PUC) ක්‍රමවේදය භාවිතයෙන්, වාර්තා කරන දිනයට සුදුසුකම් ලත් ආයුග ණකවරයකු විසින් නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වටිනාකම ගනනය කරන ලදී. ආයුගණක ඇගයීමට, වට්ටම් ප්‍රතිශතය, වැටුප් වැඩි වීමේ අනුපාතය, සහ සේවකයින්ගේ ඉතිරි සේවා කාලය පිළිබඳව උපකල්පනයන් සිදු කිරීම හා සම්බන්ධ වේ. සැලසුම් වල දිගු කාලීන ස්වභාවය හේතුවෙන්, එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතභාවයන්ට හේතු වේ.

ආයුගණක ප්‍රතිලාභයන් සහ අලාභයන් අඩංගු ශුද්ධ ප්‍රතිලාභ වගකීම නැවත-මැනීම, ඒවා ඉස්මතු වන කාල සීමාව තුල විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි අයවීමක් හෝ බැමරමක් ලෙස සටහන් වේ.

කෙසේ නමුදු, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම පනතට අනුව, සේවකයකුට පාරිතෝෂික ගෙවීම සඳහා වන වගකීම, භාර අරමුදල සමග වසර 5ක අඛණ්ඩ සේවය සම්පූර්ණ කිරීම මත පමණක් සිදු වේ.

| ආයුගණක තොරතුරු | 2020 | 2019 |
|---|---|---|
| ඇ) වට්ටම් අනුපාතය | 9.09% | 10.77% |
| ආ) වැටුප් වැඩි වීම | 9.00% | 9.80% |
| ඇ) කල් ඉකුත් වීමේ අනුපාතයන් | ස්ථිර සහතික කිරීම්, පිරිමි, මිශ්‍ර - A1967-70 | |
| ඈ) අබලතා අනුපාතයන් | කිසිදු දුබලතා අනුපාතයක් උපකල්පනය කර නැත | |
| ඉ) ආපසු ගැනීමේ අනුපාතය | | |
| වයස් කාණ්ඩය | | |
| 0 – 20 | 0.0% | 0.0% |
| 20 – 25 | 0.0% | 0.0% |
| 25 – 30 | 2.9% | 1.6% |
| 30 – 35 | 1.8% | 1.8% |
| 35 – 40 | 1.9% | 1.4% |
| 40 – 45 | 0.0% | 0.0% |
| **ආයුගණක තොරතුරු** | **2020** | **2019** |
| 45 – 50 | 0.0% | 0.0% |
| 50 – 55 | 0.0% | 0.0% |
| 55 – 100 | 0.0% | 0.0% |

| සේවක තොරතුරු | | |
|---|---|---|
| අ) සාමාන්‍ය වයස | 35.3 | 34.3 |
| ආ) සාමාන්‍ය සේවා කාල සීමාව (අවුරුදු) | 7.6 | 6.5 |
| ඇ) අපේක්ෂිත ඉදිරි ආයු කාලය (අවුරුදු) | 15.58 | 15.99 |
| ඈ) සේවකයින් ගනන | 234 | 239 |

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

අදාළ වාර්තා කිරීමේ කාල සීමාව අවසානයේ දී සිදු කෙරෙන එක් එක් සැලකිය යුතු ආයු ගණක උපකල්පනය සඳහා වන සංවේදීතා විශ්ලේෂණය, නිශ්චිත වශයෙන් පවත්නා ප්‍රතිලාභ බැඳීම් පිළිබඳව එළඹි අදාළ උපකල්පනවල වෙනස්වීම් මත ඇති කෙරෙන බලපෑම නිරූපණය කිරීම සඳහා ප්‍රතිසංශෝධිත ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 19 ට අයත් විෂය රාමුව යටතේ අනාවරණය කරනු ලැබේ.

පහත සඳහන් සාධක මත සංවේදීතා විශ්ලේෂණය සිදු කර ඇත:

1. වැටුප් උද්ධමනය: වැටුප් උද්ධමනීය උපකල්පනය පදනම් ලකුණු 100 +/- කින් අවධාරණය කෙරේ.

2. වට්ටම් අනුපාතය: වට්ටම් අනුපාත උපකල්පනය පදනම් ලකුණු 100 +/- කින් අවධාරණය කෙරේ.

3. මුදල් ආපසු ගැනීමේ අනුපාතිකය: සියලුම ආයු කාලවල මුදල් ආපසු ගැනීමේ පදනම් අනුපාත උපකල්පන 100% කින් වැඩි කිරීම (දෙගුණ කිරීම) සහ සියලු ආයු කාලවල ආපසු ගැනීමේ පදනම් අනුපාත උපකල්පන 50% කින් අඩු කිරීම (අඩකින් අඩු කිරීම) මගින් මුදල් ආපසු ගැනීමේ උපකල්පන අවධාරණය කරනු ලැබ ඇත.

4. මරණ අනුපාතය: සෑම වයස් කාණ්ඩයකම මූලික මරණ අනුමාන 10% කින් වැඩි කිරීම සහ අඩු කිරීම මගින් මරණ අනුමාන අවධාරණය කර ඇත.

අදාළ විශ්ලේෂණය සකස් කර ඇත්තේ, එක් ඉලක්ක උපකල්පනයක් වෙනස් කරන අතරතුර අනෙක් සියලුම උපකල්පන නියතව තබා ගැනීම මගිනි. ඇතැම් උපකල්පන අන්තර් පරායත්තතාවක් මත පිහිටා සිටින නමුත්, ස්ථාවර පදනමක් මත ඒවා විශ්ලේෂණය කිරීම සහ අර්ථ නිරූපණය කිරීම අපහසු වන අවස්ථාවන්හි දී, මෙම ක්‍රමයේ පරිසීමාව අප විසින් සටහන් කර ගනු ලබන්නෙමු.

අදාළ සංවේදීතා විශ්ලේෂණය සකස් කිරීමේ දී, නියමිත තක්සේරු කිරීමට සාපේක්ෂව භාවිතා කරන ක්‍රම සහ උපකල්පන වෙනස් නොවී ය.

ආයෝජන අංශයට විෂය වූ සමාගම් සඳහා වන 2020 දෙසැම්බර් මස 3 වන දිනට පැවති නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් කෙරෙහි සිදු වූ බලපෑම පහත සඳහන් පරිදි ඉදිරිපත් කෙරේ.

**Table 6-1 : Sensitivity Analysis on Salary Inflation**

| Scenario | Assumption | DBO as at 31-Dec-20 (LKR) | Difference % |
|---|---|---|---|
| Base Scenario | 9.00% | 50,120,616 | |
| Increase 100 b.p. | 10.00% | 57,575,287 | 14.87% |
| Decrease 100 b.p. | 8.00% | 43,748,522 | -12.71% |

**Table 6-2 : Sensitivity Analysis on Discount Rate**

| Scenario | Assumption | DBO as at 31-Dec-20 (LKR) | Difference % |
|---|---|---|---|
| Base Scenario | 9.00% | 50,120,616 | |
| Increase 100 b.p. | 10.09% | 43,636,667 | -12.94% |
| Decrease 100 b.p. | 8.09% | 57,872,011 | 15.4% |

**Table 6-3 : Sensitivity Analysis on Withdrawal Rate**

| Scenario | DBO as at 31-Dec-20 (LKR) | Difference % |
|---|---|---|
| Base Scenario | 50,120,616 | |
| 100% Increase in all ages | 49,578,521 | -1.08% |
| 50% decrease in all ages | 50,429,425 | 0.62% |

**Table 6-4 : Sensitivity Analysis on Mortality Rate**

| Scenario | DBO as at 31-Dec-20 (LKR) | Difference % |
|---|---|---|
| Base Scenario | 50,120,616 | |
| 10% Increase in all ages | 50,142,483 | 0.04% |
| 10% decrease in all ages | 50,098,570 | -0.04% |

## 30 වෙනත් මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම හඳුනා ගැනීම - මණ්ඩලය, නිකුත් කරන ලද ණය සහ අයවිය යුතු දෑ සහ ණය සුරැකුම්පත් ඒවා ආරම්භක කරන ලද දිනයෙන් මූලික වශයෙන් හඳුනා ගනු ලැබේ. මූල්‍ය උපකරණයක ගිවිසුම්ගත ප්‍රතිපාදන සඳහා පාර්ශවයක් බවට ආයතනය පත් වන විට, සියලු වෙනත් මූල්‍ය වගකීම්, වෙළඳ දිනය මත මූලිකව හඳුනා ගනු ලබයි. යම් සෘජුව ආරෝපණය කළ හැකි, ගනුදෙනු පිරිවැය අඩු කරන ලද සාධාරණ අගයට වෙනත් මූල්‍ය-නොවන වගකීම්, මූලික වශයෙන් මනිනු ලැබේ. මූලික හඳුනාගැනීමෙන් පසු, සඵල පොලී ක්‍රමවේදය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මෙම වගකීම් මනිනු ලැබේ.

වෙනත් මූල්‍ය වගකීම් වලට, අදාල පාර්ශවයන්ට, උපචිත කිරීම් සහ ගෙවිය යුතු නොගෙවූ කොමිස් ඇතුළු වෙනත් ණයකරුවන්ට ගෙවීමට ඇති මුදල් ද ඇතුලත් වේ.

වෙනත් මූල්‍ය වගකීම් හඳුනා නොගැනීම - වගකීම තුල ඇති බැඳීම ගෙවා අවසන් කළ විට හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විට, මූල්‍ය වගකීමක් හඳුනා ගනු නොලැබේ. පවතින වගකීමක්, සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත එකම ණයකරුවාගෙන් තවත් ණයක් මගින් ප්‍රතිස්ථාපනය වූ විට හෝ පවතින වගකීමක කොන්දේසි සැලකිය යුතු ලෙස වෙනස් වූ විට, එවැනි හුවමාරුවක් හෝ වෙනස් වීමක් මුල් වගකීම හඳුනා නොගැනීමක් සහ නව වගකීමක් හඳුනා ගැනීමක් ලෙස සලකනු

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

ලබන අතර, ආදාල ධාරණ අගයන්ගේ වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

**31 වෙනත් වගකීම්**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - වෙනත් වගකීම් - ගෙවිය යුතු ආදායම් බදු හැර ගෙවිය යුතු රජයේ බදු වෙනත් වගකීම් වලට ඇතුලත් වන අතර, LKAS 39 - මූල්‍ය උපකරණ: හඳුනාගැනීම සහ මැනීම - අනුව මෙම වගකීම් මූල්‍ය වගකීම් නොවේ. මෙම වගකීම් මඟින්, වාර්තා කරන දිනයට ගෙවිය යුතු අපේක්ෂිත අගයන් වාර්තා කරනු ලබයි.

**32 ගෙවිය යුතු ප්‍රතිරක්ෂණය**

ගිණුම්කරණ ප්‍රතිපත්ති - ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ මිනුම් හඳුනාගැනීම - ප්‍රතිරක්ෂණ වගකීම් මඟින්, රක්ෂණ සමාගම් වෙත ගෙවීමට ඇති ශේෂයන් නියෝජනය වේ. ගිවිසුම්ගත අයිතිවාසිකම් ශූන්‍ය වන විට හෝ කල් ඉකුත් වන විට හෝ ගිවිසුම වෙනත් පාර්ශවයක් වෙත මාරු කරන විට, ප්‍රතිරක්ෂණ වත්කම් හෝ වගකීම් හඳුනාගනු නොලැබේ.

**33 ගෙවිය යුතු අදායම් බදු**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය - ගෙවිය යුතු ආදායම් බදු - වර්තමාන කාල සීමාව සඳහා වර්තමාන ආදායම් බදු වගකීම්, බදුකරණ ආයතන වෙත ගෙවීමට අපේක්ෂිත ප්‍රමාණයට මිනුනු ලැබේ. මණ්ඩලය මෙහෙයුම් සිදු කරන සහ බදු ආදායම් උපයන රටවල් වල, බදු ප්‍රතිශත සහ පනවා ඇති හෝ සැලකිය යුතු ලෙස පනවා ඇති බදු නීති වලට අනුව ගෙවිය යුතු බදු ප්‍රමාණය ගනනය කරනු ලැබේ.

හිමිකාරීත්වය තුල සෘජුවම හඳුනා ගනු ලැබූ අයිතමයන් හෝ වෙනත් විස්තීර්න ආදායම් වලට අදාල වර්තමාන ආදායම් බදු, ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි නොව හිමිකාරීත්වය හෝ වෙනත් විස්තීර්ණ අදායම් තුල හඳුනා ගනු ලබයි. යෝග්‍ය තත්වයන් වලදී ප්‍රතිපාදනයන් අර්ථ නිරූපණය කිරීමට සහ ස්ථාපනය කිරීමට යටත් විය හැකි, අදාල බදු රෙගුලාසි වල තත්වයන් සම්බන්ධයෙන් වන බදු ප්‍රතිලාභ වල ඇතිවිය හැකි තත්වයන්, කළමනාකරණය විසින් කලින් කළ අගයනු ලැබේ.

**34 බැංකු අයිරාවන්**

මුදල් කළමනාකරණයේ සහ ඉතිරි කිරීමේ ගිණුම් වල අත්‍යවශ්‍ය අංගයක් වන බැංකු අයිරාවන්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ කාර්ය සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ වල අංගයක් ලෙස අන්තර්ගත කරනු ලැබේ. මූල්‍ය තත්ව ප්‍රකාශනයේ, වගකීම් යටතේ බැංකු අයිරා අන්තර්ගත කරනු ලැබේ. මණ්ඩලය, බැංකු වලින් කිසිදු බැංකු අයිරා පහසුකමක් ලබාගෙන නොමැත. කෙසේ නමුදු, ශේෂ පත්‍රයේ බැංකු අයිරා පොත් ශේෂයක් දක්වා ඇත.

**35 වාර්තා කරන කාල සීමාවෙන් පසු සිදු වන සිදුවීම්**

ගිණුම්කරණ ප්‍රතිපත්තිය – වාර්තා කරන කාල සීමාවෙන් පසු සිදු වන සිදුවීම් - වාර්තා කරන දිනය සහ මූල්‍ය වාර්තාවන් නිකුත් කිරීම සඳහා බලය පවරනු ලබන දිනය අතර කාල සීමාවේදී සිදු වන හිතකර සහ අහිතකර සිදුවීම් වාර්තා කරන කාල සීමාවෙන් පසු සිදු වන සිදුවීම් වේ.

සියලුම භෞතික පශ්චාත් වාර්තාකරණ දින සිදුවීම් සමාලෝචනය කර ඇති අතර, යෝග්‍ය අවස්ථාවන්හි දී, සීරුමාරු කිරීම් හෝ අනාවරණය කිරීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල සටහන් යොදා ඇත.

හිමිකම් ගෙවීම් සම්බන්ධයෙන් විසඳී නොමැති සියලු නඩුකරණයන් ඇගයීමට ලක් කර, අවශ්‍ය පරිදි මූල්‍ය ප්‍රකාශනයන්හි අවශ්‍ය ප්‍රතිපාදන සලසා ඇත.

**36 කල්බදු - ශ්‍රීලංමූවාප්‍ර - 16**

වත්කම භාවිතය සම්බන්ධයෙන් බදුකරුගේ අයිතිය, ආරම්භක දිනයට හෝ ඊට පෙර යම් බදු ගෙවීම් සහ දරන ලද මුල් සෘජු පිරිවැය සඳහා ගලපන ලද බදු වගකීමේ මූලික අගය අන්තර්ගත වන පිරිවැයට මූලික වශයෙන් මිනුනු ලැබේ. ආරම්භක දිනයේ සිට බදුකරුගේ වත්කම භාවිතය සම්බන්ධ අයිතියේ සඵල ආයු කාලය හෝ බදු කාලසීමාව අවසන් වීමට පෙර දිනයක් දක්වා, සෘජු රේඛා ක්‍රමවේදය භාවිතයෙන්, බදුකරුගේ වත්කම භාවිතය සම්බන්ධ අයිතිය පසු කාලීනව ක්ෂය කරනු ලැබේ.

බදු වගකීම, ආරම්භක දින නොගෙවන ලද බදු ගෙවීම් වල වර්තමාන අගයට මූලික වශයෙන් මිනුනු ලබන අතර, බදු ගිවිසුමෙහි සඳහන් පොලී අනුපාතය හෝ අනුපාතය පහසුවෙන් සොයා ගත නොහැකි නම් වර්ධන ණය අනුපාතය භාවිතයෙන් අඩු කරනු ලැබේ.

භාර අරමුදල බදුකරු වශයෙන්, වෙනස් කළ පසු විපරම් පිවිසුමක් භාවිතයෙන් 2019 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රීලංමූවාප්‍ර - 16 - බදු ප්‍රතිපත්තිය යොදාගෙන ඇති අතර, එහෙයින් සාපේක්ෂ තොරතුරු නැවත සඳහන් කර ඇත.

**37. අවිනිශ්චිත වගකීම්**

අවිනිශ්චිත වගකීමක් යනු,

අ) අස්ථිත්වයේ පාලනය තුළ සම්පූර්ණ වශයෙන් නොපවත්නා අනාගත අවිනිශ්චිත සිදුවීම් එකක හෝ ඊට වැඩි ගණනක සිදුවීම හෝ සිදු නොවීම මගින් පමණක් ඊට සම්බන්ධිත අතීත සිදුවීම් වලින් පැන නගින සහ එහි පැවැත්ම තහවුරු වන සම්භව්‍ය බැඳීමකි; එසේ නැතහොත්,

ආ) අතීත සිදුවීම් වලින් පැන නගින නමුත් හඳුනා නොගත් වර්තමාන බැඳීමකි. මක් නිසාදයත්:

i) යම් ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත්වල පිටතට ගලනයවීමක් අදාළ බැඳීම් පියවනු පිණිස අවශ්‍ය වනු ඇතැයි අනුමාන කළ නොහෙන බැවිනි. එසේ නැතහොත්,

ii) අදාළ බැඳීම්වල ප්‍රමාණය, සැලකිය යුතු විශ්වසනීයත්වයකින් යුක්තව මැනිය නොහැකි බැවිනි.

2020 දෙසැම්බර් මස 31 වන දිනට මණ්ඩලයේ අවිනිශ්චිත වගකීම් පහත සඳහන් කරුණු විෂයයෙහි අදාළ වේ;

2017/2018 වසර වෙනුවෙන් රු. 123,387,679/- ක් වශයෙන් ගණනය වන ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමයේ (NNDIS) ගළපන ලද වාරිකය හා 2018/2019 වර්ෂය වෙනුවෙන් රු.466,292,684/- ක් වශයෙන් ගළපන ලද පිළිපැවරුම් ප්‍රතිරක්ෂණ වාරිකය හරහා ගෙවිය යුතු මුදල හේතුවෙන් අදාළ ප්‍රතිරක්ෂණ ගිවිසුම් මගින් ගෙවීම් කළ යුතු බහිර්නම්‍ය ප්‍රතිරක්ෂණ වාරිකය කරණ කොට ගෙන, ඒ සඳහා වූ ප්‍රතිපාදනයක් පැවතීම සහ රු. 142,816,645/- ක් වශයෙන් ගණනය වන ගෙවිය යුතුව තිබූ ශේෂ ප්‍රතිරක්ෂණ වාරිකය සම්බන්ධයෙන් එකී ශේෂය පියවීමෙහිලා පැවති කාලානුරූපතාව හා එහි නියම වටිනාකම අනුව එහි බලලත්භාවය සහ ක්‍රියා පටිපාටි දුෂ්කරතා පිළිබඳ අවිනිශ්චිතතාවය කරණ කොට ගෙන, එකී ශේෂය මූල්‍ය ප්‍රකාශය තුළ හඳුනා ගෙන නොපැවතීම.

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

**1 දළ ලිඛිත වාරික**

1.1 ප්‍රධාන පෙළේ ව්‍යාපාර මඟින් වර්ෂය සඳහා ලද වාරික පහත පරිදි වේ.

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| ඇතුලට ප්‍රතිරකෂණ | 3,235,474,242 | 4,173,714,909 |
| SRCC & Tr වාරික | 6,088,496,099 | 6,307,350,365 |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් වාහන | 260,600,235 | 390,150,125 |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් වාහන නොවන | 213,469,435 | 301,979,246 |
| ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය (NNDIS) | - | 1,500,000,000 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | 20,000,000 | 20,000,000 |
| | 9,818,040,011 | 12,693,194,645 |

1.2 අග්‍රහාර රක්ෂණ යෝජනාක්‍රමය සඳහා රැස්කළ දායක මුදල්

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| සාමාජිකයන්ගෙන් දායක මුදල් | 4,090,359,038 | 3,617,114,527 |
| භාණ්ඩාගාරයෙන් දායක මුදල් | 782,000,000 | 767,970,000 |
| විශ්‍රාමිකයන්ගේ රක්ෂණ යෝජනා ක්‍රමය | 166,837,400 | 142,321,400 |
| අර්ධ රාජ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | 430,102,300 | 311,317,625 |
| | 5,469,298,738 | 4,838,723,551 |

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| **2. ගාස්තු සහ කොමිස් ආදායම** | | |
| රක්ෂණ හිමියන්ගේ පරිපාලන ගාස්තු | 1,935,395 | 4,438,361 |
| මුළු ගාස්තු සහ කොමිස් ආදායම | 1,935,395 | 4,438,361 |

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| **3. ආයෝජන හා වෙනත් ආදායම්** | | |
| **3.1 ණය සහ අයවිය යුතු පොලී ආදායම** | | |
| නැවත මිලදී ගැනීමේ ගිවිසුම් මඟින් පොලී ආදායම | 389,025,674 | 368,704,680 |
| ණයකර මඟින් පොලී ආදායම | | |
| | 389,025,674 | 368,704,680 |
| **3.2 විකිණීම සඳහා වන පොලී ආදායම්** | | |
| භාණ්ඩාගාර බිල්පත් මඟින් පොලී ආදායම | 308,025,889 | 224,718,954 |
| භාණ්ඩාගාර බැඳුම්කර මඟින් පොලී ආදායම | 604,225,897 | 585,152,006 |
| | 912,251,786 | 809,870,961 |

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| **3. ආයෝජන හා වෙනත් ආදායම් (තවදුරටත්)** | | |
| **3.3 කල් පිරෙන තුරු රඳවා ගන්නා ලද පොලී ආදායම්** | | |
| SLBD මඟින් පොලී ආදායම් | 33,287,993 | 36,969,356 |
| | 33,287,993 | 36,969,356 |
| මුළු ආයෝජන ආදායම | 1,334,565,453 | 1,215,544,996 |
| **3.4 වෙනත් ආදායම්** | | |
| ඉතිරිකිරීමේ ගිණුම් මත පොලිය | 8,882,278 | 7,826,740 |
| මෘදු ණය මත පොලිය | 20,576 | 49,172 |
| කාර්ය මණ්ඩල ආපදා ණය මත පොලිය | 1,785,186 | 1,690,019 |
| ස්ථාවර තැන්පතු අපහරණය | - | (756,279) |
| විනිමය ප්‍රතිලාභ/අලාභ | 33,162,446 | 17,057,402 |
| වෙනත් | 6,671,775 | 23,366,275 |
| මුළු වෙනත් ආදායම් | 50,522,262 | 49,233,328 |
| මුළු ආදායම | 1,385,087,715 | 1,264,778,325 |

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| **4 ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම්** | | |
| **අ) ගෙවන ලද දළ ප්‍රතිලාභ සහ හිමිකම්** | | |
| ප්‍රතිරක්ෂණය | (1,690,493,892) | (2,476,072,216) |
| SRCC & Tr | (2,036,000) | (417,783,502) |
| සාමාන්‍ය රක්ෂණය - මෝටර් වාහන | (169,250,954) | (257,432,249) |
| සාමාන්‍ය රක්ෂණය - වෛද්‍ය සහ වෙනත් | (156,059,649) | (307,223,184) |
| කෘෂි රක්ෂණය | (1,692,380,813) | (608,307,885) |
| ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය (NNDIS) | (94,403,615) | (610,466,501) |
| අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | (4,173,410,985) | (5,257,023,909) |
| | (7,978,035,907) | (9,934,309,446) |
| **අ.1. අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය** | | |
| **ගෙවන ලද හිමිකම්** | | |
| විශ්‍රාම | (159,173,816) | (144,451,177) |
| අර්ධ රාජ්‍ය | (319,522,769) | (393,835,342) |
| අග්‍රහාර - පාර්ලිමේන්තු | (8,948,637) | (17,183,409) |
| අග්‍රහාර - සාමාන්‍ය | (800,856,874) | (1,421,747,649) |
| අග්‍රහාර - රිදී | (143,045,092) | (241,547,334) |
| අග්‍රහාර - රන් | (2,741,863,797) | (3,038,258,998) |
| | (4,173,410,985) | (5,257,023,909) |

# මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් සටහන් (ඉතිරි කොටස...)

2020 දෙසැම්බර් 31න් අවසන් වන වසර

| | | 2020<br>රු.. | 2019<br>රු. |
|---|---|---|---|
| 4 | **ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම් (තවදුරටත්)** | | |
| ආ) | **ප්‍රතිරක්ෂකයින් වෙත යවන ලද හිමිකම්** | | |
| | ආපසු ප්‍රතිරක්ෂණය (රීටො) | - | 498,500,000 |
| | ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය (NNDIS) | | |
| | | - | 498,500,000 |
| ඇ) | **ගිවිසුම් වගකීම් වල දළ වෙනස** | | |
| | ප්‍රතිරක්ෂණය | 86,200,706 | (1,445,435,956) |
| | SRCC & Tr | - | (289,929,932) |
| | සාමාන්‍ය රක්ෂණය - මෝටර් වාහන | (57,648,910) | (37,710,610) |
| | සාමාන්‍ය රක්ෂණය - වෛද්‍ය සහ වෙනත් | (50,886,987) | 28,513,890 |
| | කෘෂි රක්ෂණය | 293,940,911 | (376,550,113) |
| | ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය (NNDIS) | 642,444,580 | (307,102,476) |
| | අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය | (816,527,912) | (94,327,805) |
| | | 97,522,388 | 2,522,543,002 |
| ඈ) | **ප්‍රතිරක්ෂකයින්ට පවරන ලද ගිවිසුම් වගකීම් වල වෙනස** | | |
| | ප්‍රතිරක්ෂණය | - | (43,234,155) |
| | ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය (NNDIS) | - | |
| | | - | (43,234,155) |
| ඉ) | **දළ වෙනස IBNR** | | |
| | ප්‍රතිරක්ෂණය | 98,821,419 | (93,472,428) |
| | SRCC & Tr | 16,417,739 | 14,787,908 |
| | සාමාන්‍ය රක්ෂණය - මෝටර් වාහන | (8,618,552) | (15,537,220) |
| | සාමාන්‍ය රක්ෂණය - වෛද්‍ය සහ වෙනත් | 12,034,400 | 36,466,717 |
| | කෘෂි රක්ෂණය | (336,313,348) | 3,138,094 |
| | ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනාක්‍රමය (NNDIS) | 121,880,420 | 25,018,135 |
| | අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය | 21,775,178 | (48,132,416) |
